مركز أصول
Osoul Center
www.osoulcenter.com

ربوة
Rabwah



01

# අල්ලාහ්ගේ දූත මුහම්මද් ﷺ තුමා

සිංහල

ආචාර්ය අබ්දුර්රහ්මාන්
අබ්දුල් කරීම් අශ්ෂීහා

# محمد رسول الله (صلى الله عليه وسلم)


تأليف

**عبدالرحمن الشيحة**

ترجمة

**محمد حقيل محمد أمين**

مراجعة

**ماهر رمدين**


සිංහල

sinhala

سنهالي

ح المكتب التعاوني للدعوة والإرشاد و توعية الجاليات بالربوة، ١٤٤٢هـ

**فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر**

الشيحة، عبدالرحمن بن عبدالكريم

محمد رسول الله صلى الله عليه وسلم – اللغة السنهالية. / عبدالرحمن بن عبدالكريم الشيحة؛

محمد حقيل امين. - الرياض، ١٤٤٢هـ

١٠٨ ص، ١٤ سم x ٢١ سم

ردمك : ٩٧٨-٦٠٣-٨٢٩٧-٩٣-٣

١- السيرة النبوية أ. امين، محمد حقيل (مترجم) ب. العنوان

**ديوي ٢٣٩ ١٤٤٢/٩٩٥**

**رقم الايداع: ١٤٤٢/٩٩٥**

**ردمك : ٩٧٨-٦٠٣-٨٢٩٧-٩٣-٣**



Osoul Center
www.osoulcenter.com

*මෙම පොත උසූල් අන්තර්ජාතික මධ්‍යස්ථානය විසින් සංස්කරණය කොට ඇති අතර මෙහි භාවිතා කර ඇති සියලුම ඡායාරූපවලට හිමිකම් ලබනුයේ එම ආයතනයයි. පහත සඳහන් කොන්දේසි දෙක මත ඕනෑම අයුරින් මෙම පොත නැවත ප්‍රකාශයට පත් කිරීමට අවසර ඇත.1: මෙම මධ්‍යස්ථානයෙහි අවසරය හා පිළිගැනීම සියලු සංස්කරණ මත පැහැදිලිව සඳහන් විය යුතුයි. 2: මෙම මධ්‍යස්ථානය වෙත යොමු නොකොට කිසිදු වෙනසක් හෝ සංශෝධනයක් කිරීමට නොහැක. මෙම පොත නැවත මුද්‍රණය කිරීමේදී උසස් ප්‍රමිතිය පවත්වා ගැනීමට මධ්‍යස්ථානය දැඩි ලෙස නිර්දේශ කරයි.*



+966 11 445 4900

+966 11 497 0126

B.O.Box. 29465 - Riyadh 11457

osoul@rabwah.sa

www.osoulcenter.com




අපරිමිත දයාන්විත අසමසම
කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි,

مركز أصول
Osoul Center
www.osoulcenter.com

මුළු ලෝකයම මවා පරිපාලනය කරන්නා වූ සර්ව බලධාරී අල්ලාහ්ටම සියළු පැසසුම් හිමි වේවා. අල්ලාහ්ගේ ධර්ම දූතයා වන  මුහම්මද් (සල්) තුමා හට අල්ලාහ්ගේ සාමය සහ ආශීර්වාදය අත් වේවා. අන්ධකාරයෙන් ආලෝක වෙත මනුෂ්‍යවර්ගයාට මග පෙන්වීම පිණිස එවන ලද සියලු වක්තෘවරුන් හා පණිවිඩකරුවන් හට උන් වහන්සේ ආශීර්වාදය ලැබේවා. ඉස්ලාමීය උපදේශන සඳහා වූ උසූල් ජාත්‍යන්තර මධ්‍යස්ථානය වන අප, අප විසින් නිෂ්පාදනය කරන සෑම නව නිකුතුවක් මගින්ම අපගේ පාඨකයන් සමග අන්‍යෝන්‍ය අවබෝධයක් ඇති කර ගැනීමට කදිම අවස්ථාවක් ලෙස සලකන්නෙමු.

සැබැවින්ම අපගේ ප්‍රකාශන සියල්ලෙහිම එකම පොදු පරමාර්ථය වන්නේ මානව වර්ගයා කෙරෙහි පිවිතුරු ඉස්ලාම් ධර්මය ඉදිරිපත් කිරීම වන අතර ඉස්ලාමයේ යහපත් පැතිකඩ සහ ගැඹුරු ඉගැන්වීම් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සහ මානව වර්ගයා මුහුණ දෙන සියලු ගැටළු සඳහා ප්‍රායෝගික හා ඵලදායී විසඳුම් සපයන එකම විශ්වාසය එය පමණක් බව පැහැදිලිව පෙන්වා දීමයි.

පරම්පරා ගණනාවක් පුරා ජනයා කලබලයට පත්ව සිටි අප බිහි වූයේ කෙසේද? අප ජීවත් වන්නේ මක්නාසාද සහ අපගේ ගමනාන්තය කොයිබටද වැනි සියලු ප්‍රශ්න සඳහා ඉස්ලාම් ධර්මය විසින් පැහැදිලි හා ස්ථිර පිළිතුරු සපයනු ඇත.

ඉස්ලාමය යනු, සිය අනුගාමිකයන් දෙවියන් අල්ලාහ් විසින් එවන ලද විශේෂයෙන්ම මෝසෙස් සහ යේසුස් (අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය ඔවුන් හට හිමි වේවා) වැනි සියලු අනාගතවක්තෘවරුන් හට ආදරය කිරීම සහ ගෞරවය දැක්වීම අනිවාර්ය කරන එකම ආගමයි.

අපගේ තර්ක ඉදිරිපත් කිරීමේදී දැඩි හා තාර්කික සාධක සැපයීමට අපි අපගේ දැඩි අවධානය යොමු කර ඇත්තෙමු.එමෙන්ම, අපගේ නිකුත් කිරීම් ඉස්ලාමයට විරුද්ධව  එල්ල  කරන  චෝදනාවන් හා  ඉස්ලාමීය    ඉගැන්වීම් පිළිබඳ ජනතාවගේ වැරදි වැටහීම පිළිබඳ පැහැදිළි කිරීමක් ද වනු ඇත.ලෝකය හා බැඳුණු කරුණු, ආකල්ප හා ප්‍රවනතාවයන් පිළිබඳ මහජනතාව දැනුවත් කරන  මධ්‍යස්ථානයක් වන පිව් (PEW) පර්යේෂණ මධ්‍යස්ථානය විසින් කරන ලද අධ්‍යයනයකින් තහවුරු වී ඇති පරිදි, ඉස්ලාම් යනු වර්තමානයේ ශීඝ්‍රයෙන් වර්ධනය වන ධර්මයකි.ඒ අනුව මෙම උතුම් දිව්‍යමය ඇදහීම පිළිබඳ සියලු මිනිසුන් දැනුවත් කිරීම අපගේ චේතනාවයි.

මෙම පොත මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන්ගේ ජීවිතය පිළිබඳ වූ වාර්තාවකි. එතුමාගේ උපත සිට විපත දක්වා වූ කාළය තුළ ඔහු වෙත පැවරී තිබූ කාර්‍යය සම්පූර්ණ කර සියලු දෙනා හට යහපත් උපදෙස් ලබා දුන් බව රහසක් නොවේ.එතුමාණන් දෙවියන් අල්ලාහ්ගේ අවසාන සහ සදාකාල පණිවිඩය මනුෂ්‍යවර්ගයා වෙත භාර දුන්නේය. එය සියලු දෙනා කෙරෙහි වූ දෙවියන්ගේ දයාව පෙන්වීමකි.

මෙම පොත එතුමාගේ උතුම් චරිතය, නිහතමානී ජීවිතය හා නිවසියන්, මිත්‍රයින් සහ සමාජයේ විවිධ තනතුරු දරන සියළුම ජනයා සමග ඔහුගේ හැසිරීම කෙබඳුද යන්න හඳුන්වා දෙන අතර දෙවියන් විසින් ඔහුට පවරන ලද කාර්‍යය ඉෂ්ට කිරීමට ඔහු ප්‍රයත්න දැරූ ආකාරය ගැනත්  ඔහු සිය සතුරන් සමඟ කටයුතු කළ ආකාරය ගැනත් විදහා දක්වයි.මෙම පොත මගින් එතුමාගේ ප්‍රඥාව සහ මෘදු අවවාද මත පදනම්ව ඔහුගේ සරල, නමුත් බෙහෙවින් ඵලදායී ඔහුගේ පණිවුඩය වෙනුවෙන් පෙනී සිටීමේ ක්‍රම පිළිබඳවත් යුක්තිය සහ ආරක්ෂාව සියලු ජනයා විසින් භුක්ති විඳිනු ඇති බව සහතික කිරීම සඳහා ඔහු කෙතරම් උනන්දුවක් දක්වන්නේද යන්න පිළිබඳවත් අධ්‍යනය කළ හැක.කෙටියෙන් කිවහොත්, ඔහුගේ ජීවිතය යනු අල්කුර්ආනයේ එතුමාණන් පිළිබඳව සඳහන් (නබිතුමණී! අපි ඔබව ලෝකවාසී සියල්ලන්ටම දයාලුවක් වශයෙන්ම යවා ඇත්තෙමු) යන වාක්‍යයෙහි ප්‍රායෝගික ප්‍රතිරූපය බව තේරුම් ගත හැක.

මුස්ලිම් පාඨකයන් මෙම පොත මගින් මුහම්මද් (සල්) තුමන් පිළිබඳ අවබෝධය තමන් තුල ඇති කර එතුමා කෙරෙහි ආදරයත් වර්ධනය කර එතුමාගේ ආදර්ශයන් අනුගමනය කිරීමට සිය අධිෂ්ඨානය ශක්තිමත් කරනු ඇතැයි අප විශ්වාස කරන්නෙමු.එසේම මුස්ලිම් නොවන පාඨකයන් මෙම පොත රසවිඳිමින් නබි (සල්) තුමාගේ සැබෑ ප්‍රතිරූපය අවබෝධ කරනු ඇතැයි අප අපේක්ෂා කරන්නෙමු.

බාසිල් අල් ෆවුසාන්
විධායක අධ්‍යක්ෂ



# පටුන


පෙරවදන.......................................................... 11

කවුරුන් ද ඒ මුහම්මද් තුමාණන්?............................ 17

උපන් ස්ථානය සහ ළමාවිය.................................. 23

නබි (ﷺ) තුමාණන්ගේ හැඩරුව.............................. 37

නබි (ﷺ)තුමාණන්ගේ චරිත ස්වභාවය..................... 39

නබි (ﷺ) තුමාණන්ගේ ආචාරධර්ම ස්වල්පයක්.......... 65

නබි (ﷺ) තුමාණන් පිළිබඳ යුක්තිසහගත හා
මධ්‍යස්ථවාදී ප්‍රකාශ............................................... 72

නබි (ﷺ) තුමාණන්ගේ භාර්යාවන්........................... 75

මුහම්මද් (ﷺ)තුමාණන්ගේ ධර්ම දූතත්වය සැබෑ බව
හඟවන ලිඛිත සාක්ෂි.............................................. 79

අල්ලාහ්ගේ දූතයාණන්ගේ දූතත්වය තහවුරු කරන
බුද්ධිමය සාධකයන්................................................ 87

නිගමනයන් සහ නිර්දේශයන්................................. 101



# පෙරවදන

සියලු ප්‍රශංසා මුළු ලොව මවා පරිපාලනය කරන්නා වූ අල්ලාහ්ටම ය.ශාන්තිය හා සමාදානය අවසන් දූත මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් හටත් එතුමාණන්ගේ පවුල් සාමාජිකයින් හා එතුමාණන්ගේ ශ්‍රාවකයින් හටත් හිමි වේවා !

මුළු මිනිස් සංහතිය වෙත එවනු ලැබූ මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ගැන කතා කරන විට,පැරණි හා නූතන යුගයේ ඉතිහාසය විසින් පිළිගත් ශ්‍රේෂ්ඨතම චරිතයක් පිළිබඳ අප කතා කරන වග අවධාරණය කළ යුතුයි . මෙය අභඹූ ප්‍රකාශයක් නොව කෙනෙකු ඔහුගේ ආගමික උමතුවෙන් හා පෞද්ගලික මතිමතාන්තර වලින් නිදොස්ව එතුමාණන්ගේ සිය චරිතාපදානය කියවා එතුමාණන්ගේ සදාචාරය හා යහ ගුණාංග කෙසේදැයි හොඳ හැටි අවබෝධ කර ගන්නේ නම් අප ප්‍රකාශ කළ දෑ සත්‍ය බව ඔහුට වැටහෙනු ඇත. මේ බව මුස්ලිම් නොවන මධ්‍යස්ථ පිළිවෙතක් අනුගමනය කරන උදවිය විසින්ද සහතික කර ඇති බව අපට දැක ගන්නට පුළුවන.

අභාවප්‍රාප්ත මහාචාර්ය හසන් අලි (ඔහුට අල්ලාහ්ගේ කරුණාව අත්වේවා) ඔහුගේ නූර් අල් ඉස්ලාම් නැමැති සඟරාවේ "ඉස්ලාමයේ වක්තෘවරයාණන් ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම හා වඩාත් පරිණත පුද්ගලයෙකු බව මා පිළිගන්නෙමි" යැයි වරක් එක් බ්‍රාහ්මණයෙක් තමන් වෙත පවසා සිටි බව සඳහන් කොට ඇත. එවිට මහාචාර්ය හසන් අලි"ඔබ ඔහුව ශ්‍රේෂ්ඨතම හා වඩාත් පරිණත මිනිසා ලෙස සලකන්නේ මන්ද? " යනුවෙන් විමසා සිටියහ. ඔහු මෙසේ පිළිතුරු දුනි: ඔහු සතු වූ චරිත ලක්ෂණ, ආචාර ධර්ම හා සදාචාර ප්‍රතිපත්ති අන් ලෝක ඉතිහාසයේ කිසිවෙකු සතුව නොතිබීය. සමස්ත අර්ධද්වීපයම ඔහු යටතට පත් වූ අධිපතියෙකු වුවද ඔහු නිහතමානී විය. පාලනය තම දෙවියන් හට පමණක් හිමි වන බව ඔහු විශ්වාස කළේය.

මහා ධන සම්භාරයක් ඔහු වෙත පැමිණියද ඔහු ජීවත් වූයේ දිලින්දෙකු ලෙසය. බොහෝ දවස් වල ඔහුගේ නිවසෙහි ආහාරපාන කිසිවක් නොමැති හෙයින් ගිනි උදුන ඉහළට නොනගින තත්ත්වයක් පැවති අතර ඔහු සාගින්නෙන් පසු විය. ඔහු ශ්‍රේෂ්ඨ නායකයෙක් විය. ඔහු සටන් වීරයින් දහස් ගණනක් සිටි සේනාවකට එරෙහිව කුඩා සංඛ්‍යාත සේනාවක් සඳහා නායකත්වය ලබා දුන්නේ ය. එසේ තිබියදීත් තීරණාත්මක ලෙස සතුරන්ව ඔහු පරාජය කරනු ඇත.ඔහු සතුව නිර්භීත හා ධෛර්ය සම්පන්න අනුගාමිකයින් දහස් ගණනක් සිටි නමුත් සාම ගිවිසුම් වලටද ආදරයෙන් සහ පිවිතුරු චේතනාවෙන් එකඟ විය. කිසි දෙයකට බිය නොවන ඉතා නිර්භීත පුද්ගලයෙකු ලෙස ඔහුව දැක ගන්නට පුළුවන් විය. දහස් සංඛ්‍යාත සතුරන් සිටියත් ඒ පිළිබඳ බිය නොවී එඩිතරව සටන් කිරීමට ඔහු ඉතා දක්ෂ විය. එනමුත් ආදරයෙන් හා නිරහංකාරයෙන් පිරි මෘදු හදවතක් ඇති, රුධිර බිඳුවක් හෝ වැගිරීමට අකැමති මිනිසෙකු විය.

ඔහු අරාබි අර්ධද්වීපයේ කටයුතු ගැන බොහෝ සෙයින් සැලකිලිමත් වූ පුද්ගලයෙකි. එනමුත් ඔහුගේ ගේදොර කටයුතු හා පවුල් සාමාජිකයන්ගේ වගකීම් ඔහු අතපසු කළේ නැත. එමෙන්ම දිළින්දන් කෙරෙහිද ඉතා සැලකිලිමත් විය. තම නිර්මාතෘවරයාණන් වන දෙවියන් වූ අල්ලාහ්ව අමතක කොට වළක්වාලමින් සිටි උදවිය පුනරුත්ථාපනය කර යහමඟට යොමු කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳ මනා කල්පනාකාරී විය.

සමස්තයක් ලෙස ගත් කල, ඔහු මානව වර්ගයාගේ යහපත උදෙසා වඩාත් සැලකිලිමත් වූ පුද්ගලයෙකි. එහෙත් එමඟින් ඔහු ලෞකික වාසනාව ගොඩනඟා නොගත් අතර දෙවියන්ට නැමදුම් කිරීම හා ඔහුගේ තෘප්තිය ලබා දෙන ක්‍රියාවන්ට ඇලුම් කරන මහඟු චරිතයකි. ඔහු මෙලොවෙහි ජීවත් වූව ද ඔහු තුළ ලොව - ලෞකික ආශාවන් - ජීවත් වූයේ නැත.

පෞද්ගලික හේතු නිසා ඔහු කිසි විටෙකත් කිසිවෙකුගෙන් පලි ගත්තේ නැත. ඔහු තම සතුරන්ගේ යහපත උදෙසා නිතර ප්‍රාර්ථනා කළ අතර, දෙවියන්ගේ දඬුවම ගැන ඔවුන්ට අනතුරු ඇඟවීය. ලෞකික සැපසම්පත් සම්බන්ධයෙන් මධ්‍යස්ත පිළිවෙතක් පිළිපැද්දා වූ හෙතෙම

රෑ මුළුල්ලේම සර්ව පරාක්‍රමයාණන් වූ දෙවියන් මෙනෙහි කර වැඳපුදා ගන්නකු විය.

එතුමාණන්ගේ ඉතිහාසය ඔබේ දෑස් ඉදිරියේ මදක් විවෘත කර බැලූ විට අසිපත ඔසවා සටන් කළ නිර්භීත හා ධෛර්ය සම්පන්න සොල්දාදුවෙකු ලෙසත් අසමසම වක්තෘවරයෙකු ලෙසත් ආරක්ෂිත ධර්ම දූතයෙකු ලෙසත් බලවත් අධිරාජ්‍යයන් හා සමාජයන් අත්පත් කර ගත් අරාබි ජාතිකයන් සඳහා එක් උතුම් නායකයෙකු හෝ අරාබි අර්ධත්වීපයේ රජෙකු ලෙසත් ඔහුව ආමන්ත්‍රණය කිරීමට සිතෙනු ඇත. එහෙත් එතුමාණන් සාමාන්‍ය නිවහනක් තුළ රටඉඳි අතු වලින් වියන ලද පැදුරක් මත රළු කෙඳි පිරී ගිය කොට්ටයක් තබා නිදා ගත්තේය. එතුමාණන් අරාබිවරුන්ගේ සුල්තාන්වරයෙකු හෝ අරාබි අර්ධද්වීපයේ රජු ලෙස අභිෂේක කරනු ලැබූවෙකු යැයි ඔහුව ආමන්ත්‍රණය කිරීමට සිත පෙළඹේ.අරාබි අර්ධත්වීපයේ සතර දෙසින් බඩුභාණ්ඩ හා සැපසම්පත් ඔහු වෙතට රැගෙන විත් දේවස්ථානය ඉදිරියෙහි මහා කඳු ගැටයක් මෙන් තිබූ අවස්ථාවන්හිදී පවා එතුමාණන්ගේ පවුල් සාමාජිකයින් දිළිඳුකමින් සරල දිවි පෙවතක් ගෙන ගියෝය.

දිනක් නබිඳුන් සටනක දී සිරගත කළ රැඳවියන් මුස්ලිම්වරුන් අතර බෙදා දෙමින් සිටියදී තම සෙනෙහිබර දියණියන් වන ෆාතිමා (රළි) තුමිය එතුමන් වෙත පැමිණ නිවසෙහි තම කාර්යබහුල තත්ත්වය පැහැදිලි කරමින් තමන්ටද එක් වහල් ස්ත්‍රියක් ලබා දෙන මෙන් ඉල්ලා සිටියාය.එවිට නබිඳුන් වහල් ස්ත්‍රියක් වෙනුවට ප්‍රාර්ථනාවන් ස්වල්පයක් කියා දී ඒවා රාත්‍රී නින්දට පෙර පාරායනා කර නිදා ගන්නා මෙන් උපදෙස් දී ඒවා වහල් ස්ත්‍රියට වඩා වටිනා බව පවසා තම දියණියව හිස් අතින් නැවත යවා තැබුවේය.

වරක් නබිඳුන්ගේ උතුම් මිත්‍රයෙකු වූ උමර් (රළි) තුමාණන් ඔහු වෙත පැමිණ තමන් වැඩ සිටින එම සාමාන්‍ය නිවහන දෙස මදක් නෙත් යොමු කළේය. එතුමන් නිදා සිටියේ රටඉඳි අතු වලින් වියන ලද පැදුරකය.එවිට එතුමාගේ පිටහි එම පැදුරෙහි රේඛාවන් දක්නට ලැබුණි. කාමරයේ එක් පසක භාජනයක් තුළ තිබූ තිරිඟු ස්වල්පයක් හා එයට සමීපව එක් කුලුනක හමෙන් සාදන ලද ජල බඳුනක් ද උමර් (රළි) තුමාණන් දුටුවේය.අරාබි අර්ධද්වීපයෙන් අඩකට වඩා

වැඩි පිරිසක් එතුමාණන්ට යටහත් වී තිබුණු අවස්ථාවකදී පවා එතුමාණන් සතු වූයේ එම බඩුභාණ්ඩ පමණි. එවන් තත්ත්වයක ලොවට ආශිර්වාදයක් මෙන් පැමිණි අල්ලාහ්ගේ වක්තෘවරයාණන්ව දුටු උමර් (රළි) තුමාණන් දරාගත නොහැකි වීම හේතුවෙන් ඔහුගේ නෙත් තුලින් කඳුලු ගලා වැටෙන්නට විය. එය දුටු නබි(සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමාණන් ඔබ කඳුලු සලනුයේ ඇයි දැයි විමසා සිටියේය, මා නොහඬා කුමක් කරන්නද? කිස්‍රා (කොස්‍රෝස් - පර්ෂියානු නායකවරුන් සඳහා කියනු ලබන විශිෂ්ට නාමයකි) සහ සීසර් (රෝමානු හමුදාමය සහ දේශපාලනික නායකයකු වේ) මේ ලෝකය තුළ භුක්ති විඳිති. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් හට අයිති වී ඇත්තේ මා දකින මේ දෑ පමණකි යනුවෙන් පැවසීය. අහෝ උමර්! කොස්‍රෝස් සහ සීසර් වැනි රාජ්‍ය නායකයන් වෙනුවෙන් මෙම ලෞකික ජීවිතයේ සැප සම්පත් ලැබීම පිළිබඳවත්, අප වෙනුවෙන් මතුලොවෙහි ස්වර්ග සැප සම්පත් හිමි වීම පිළිබඳවත් ඔබ තෘප්තියට පත් නොවන්නේ මන්ද යනුවෙන් නබිඳුන් ප්‍රකාශ කර ඔහුව සැනසීය.

නබිඳුන් මක්කා නගරයේ ජය අත්පත් කර ගැනීම පිණිස සිය සේනාව එක්කරමින් පැමිණි අවස්ථාවේදී අබ්බාස් (රළි) තුමාණන් ගමන් කළ ඔටුවාගේ පිටෙහි අබූ සුෆ්‍යාන් අසුන් ගෙන එම සිදුවීම නරඹමින් සිටියේය.අබූ සුෆ්‍යාන් නැමැත්තා එවිට සිය පැරණි දහම අදහන්නෙකු විය.මක්කා දෙසට ගමන් කරන මෙම සේනාව කිසිවෙකු විසින් වැළක්වීමට නොහැකි තරමට විශාල විය. එය දුටු අබූ සුෆ්‍යාන් තම මිත්‍රයා වන අබ්බාස් දෙස බලා ඔබේ සහෝදරයාගේ පුත්‍රයා බලවත් පාලකයෙකු බවට පත් ව ඇතැයි ප්‍රකාශ කළේය.එයට අබ්බාස් (රළි) තුමාණන් මෙය පාලනයක් හෝ ආධිපත්‍යයක් හෝ එවැනි කිසිවක් නොවේ.මෙයයි ධර්ම දූත මෙහෙවර හා දේව පණිවිඩය යනුවෙන් පිළිතුරු දුන්නේය.

අදී අත්තාඊ (මෙතුමන් පරිත්‍යාග කිරීම, ආගන්තුක සත්කාරය වැනි යහපත් ගුණාංග විෂයෙහි එකළ සුප්‍රසිද්ධ ආදර්ශමත් හාතම් අත්තාඊ තුමාගේ පුත්‍රයාණන් ය.ඔහු කිතුනු දහම අදහන්නෙකු ලෙස සිටියදී නබි (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) තුමාණන්ගේ එක් රැස්වීමකට සහභාගි විය.නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වටා සිටි

එතුමාණන්ගේ ශ්‍රාවකයින් එතුමාණන් කෙරෙහි දැක් වූ ආචාරය හා ගෞරවය දැක මෙතුමන් එක් ධර්ම දූතයෙකු ද නැතහොත් රාජ්‍ය නායකයෙකු දැයි විශ්මයට පත් වී තමන් තුළම ප්‍රශ්න කර ගත්හ.ඔහු මේ ගැන ගැඹුරින් කල්පනා කරමින් සිටියදී මදීනාව සිට අසරණ ස්ත්‍රියක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ ගරු සභාව වෙත පැමිණ, යම් අවශ්‍යතාවයක් ඉටු කර දීම සඳහා මා ඔබව යවන්නට අපේක්ෂා කරමි යැයි පවසා සිටියාය.එසේය, මදීනාවෙහි කුමන ප්‍රදේශයක් වුව ද මා ඒ වෙත ඔබ සමඟ පැමිණ එම අවශ්‍යතාවය සපුරා දෙන්නෙමි යනුවෙන් ඇයට පවසා එම අසරණ කාන්තාවගේ අවශ්‍යතාවය සම්පූර්ණ කර දී එතුමන් ආපසු පැමිණියහ. මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ නිහතමානිත්වය දුටු අදි අත්තාර් තුමාණන් සත්‍යය තේරුම් ගෙන ඔහු පැළඳ සිටි කුරුසය ඉවත් කර මුස්ලිම්වරයෙක් බවට පත් විය.

මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා පිළිබඳව ප්‍රවීන විද්වතුන්ගේ ප්‍රකාශ කිහිපයක් මෙම කෘතියෙහි අවසන් කොටසෙහි අපි සඳහන් කර ඇත්තෙමු. මුස්ලිම්වරුන් වශයෙන් අපි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ධර්ම දූත මෙහෙවර මුළුමනින්ම විශ්වාස කරන්නෙමු. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා පිළිබඳ අන්‍ය ආගමික සහෝදරයන් ඉදිරිපත් කරන ආකල්ප ඉදිරිපත් කිරීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැති නමුත් ඔවුන්ගේ අදහස් උදහස් මෙහි සඳහන් කිරීමට පාදක වූ විශේෂ කරුණු දෙකක් තිබේ.

පළමුවැන්න: ඉස්ලාමය තුළ ඉපදුණු අය සඳහා සිහි කැඳවීමක් හා අවවාදයක් ලෙස ඒවා මෙහි පල කළෙමු. අවාසනාවකට මෙන් ඔවුන් ඔවුන්ගේ නබිවරයා සහ ඔහුගේ ඉගැන්වීම් අතහැර දමා ඇත.එහෙයින් තම නබිවරයා පිළිබඳ මුස්ලිම් නොවන්නන් පවසන්නේ කුමක්ද යන්න දැන ඔවුන් ධර්මය කෙරෙහි යොමු වීමට මෙය මහත් උපකාරී වනු ඇත.

දෙවැන්න: මුස්ලිම් නොවන සමාජය තම සමාජයටම අයත් මෙවන් උදවියගේ ප්‍රකාශයන් මඟින් මෙම උත්තම නබිවරයා කවුදැයි යන්න පිළිබඳ හා ඔහු පිළිබඳ සත්‍යය කුමක්ද යන්න දැන ගනු ඇත. මෙමඟින් ඔවුන් ඉස්ලාමය වෙත හැරීමටත් ඒ පිළිබඳ දැන ගැනීමටත් එක් ආරම්භයක් සලසා දෙනු ඇත.

අන්‍ය ආගමික උදවිය වෙත මාගේ අවංක ඉල්ලීම නම්, සිය බුද්ධිය උකසට තබා අන් අයගේ බුද්ධියෙන් නිරීක්ෂණය නොකර, ආගමික උමතුවෙන් ඉවත් වී මධ්‍යස්ථව සිතා බලා යහමඟ හා නොමඟ කුමක්ද, වැරදි දෑ හා නිවැරදි දෑ කුමක්ද යන්න පිළිබඳ ගැඹුරු ලෙස අධ්‍යනය කිරීමට උත්සුක වන ලෙසයි.

ඒ අනුව, සත්‍යය සෙවීමේදී පූර්ව නිගමන පසෙක දැමිය යුතු බව මා සියලු පාඨකයන්ගෙන් ඉල්ලා සිටිමි. සත්‍යය පිළිගැනීම සඳහා අප සියල්ලන්ගේ හදවත් විවෘත කරන ලෙසත් අප සියල්ලන් හට නිවැරදි මාර්ගය පෙන්වා එය අනුගමනය කිරීමට භාග්‍ය ලබා දෙන ලෙසත් එකම දෙවියන් වූ අල්ලාහ්ගෙන් මා ඉල්ලා සිටිමි.

අබ්දුර් රහ්මාන් බින් අබ්දුල් කරීම් අශ් ෂිහා,

# කවුරුන් ද ඒ මුහම්මද් තුමාණන්?

## කුලය:

එතුමන් අබ්දුල්ලාහ්ගේ පුත් අබුල් කාසිම් (කාසිම් ගේ පියාණන්) යනුවෙන් අමතනු ලැබූ මුහම්මද් ය. එතුමන්ගේ සීයාගේ නම අබ්දුල් මුත්තලිබ් වේ. එතුමන්ගේ කුලයෙහි ආරම්භය වක්තෘ ඉබ්‍රාහීම් (අලෛයිහිස්සලාම්) ගේ පුත්‍රයා වන ඉස්මාඊල් (අලෛයිහිස්සලාම්) ගේ මාර්ගයෙන් පැමිණි අද්නාන් නැමැත්තා වන තෙක් දිගු වෙයි. එතුමන්ගේ මෑණියන් වහබ්ගේ දියණිය වන ආමිනා ය.එතුමියගේ කුලයෙහි ආරම්භය ද වක්තෘ ඉබ්‍රාහීම් (අලෛයිහිස්සලාම්)ගේ පුත්‍රයා වන ඉස්මාඊල් (අලෛයිහිස්සලාම්) ගේ මාර්ගයෙන් පැමිණි අද්නාන් නැමැත්තා වෙත දිව යයි.

ඒ පිළිබඳ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැහැදිලි කර ඇත.

නියත වශයෙන්ම දෙවියන් වූ අල්ලාහ් ඉස්මාඊල්ගේ පුත්‍රයාණන්ගෙන් කිනානා වංශය තෝරාගත්තේය. පසුව කිනානා වංශයෙන් කුරයිෂ් වංශය තෝරාගත්තේය. පසුව කුරයිෂි වංශයෙන් බනූ හාෂිම් වංශය තෝරාගත්තේය. පසුව අල්ලාහ් බනූ හාෂිම් වංශයෙන් මා තෝරා ගත්තේය.

මෙමඟින් මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ශ්‍රේෂ්ඨ හා ගෞරවනීය වංශයකින් පැවත ආ බව මනාව පැහැදිලි වේ. ඔහුගේ සතුරන් ඇතුළු සියල්ලන් මෙම කාරණයට සාක්ෂියකි. ඉස්ලාමය වැළඳ ගැනීමට පෙර ඉස්ලාම් විරෝධියකු වූ අබූ සුෆ්‍යාන් පවා රෝම අධිරාජ්‍යයවාදියෙකු වූ හෙරක්ලියස් ඉදිරිපිට ඒ බව සහතික කළේය. ඒ පිළිබඳ විස්තරාත්මකව පහත සඳහන් වේ.

අල්ලාහ්ගේ දූතයාණන් හෙරක්ලියස් වෙත ලිපියක් යවමින් ඔහුව

ඉස්ලාමය වෙත ආරාධනා කළ බව එතුමන්ගේ ඥාති සහෝදරයකු වන අබ්දුල්ලාහ් බින් අබ්බාස් (රළි) තුමා විසින් වාර්තා කරන ලදී. දෙවියන් විසින් පර්සියානු හමුදාවන්ට ජයග්‍රහණය ලබා දුන් විට හෙරක්ලියස් දෙවියන්ට කෘතඥතාව දැක්වීමක් වශයෙන්, අලේපෝ සිට ජෙරුසලම දක්වා ගමන් කළේය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් යැවූ ලිපිය හෙරක්ලියස්ගේ දෑතෙට පැමිණි පසු එය කියවා එකී අල්ලාහ්ගේ දූතයා පිළිබඳ විමසීම පිණිස එතුමාගේම ජනතාව අතුරින් කෙනෙකු මා වෙනුවෙන් සොයා එනු යැයි ඔහුගේ සේවකයන්ට අණ කර සිටියේය. එම අවස්ථාවේදී සිරියාවේ යම් ප්‍රදේශයකට ව්‍යාපාර ගනුදෙනුවක් සඳහා තම ගෝත්‍රයේ සාමාජිකයන් සමඟ අබූ සුෆ්‍යාන් පැමිණ සිටියහ.එය මක්කාවෙහි ඔවුන්ගේ ගෝත්‍රය හා නබිඳුන් අතර සාම ගිවිසුම් කරන ලද කාලවකවානුවයි.

අබු සුෆ්‍යාන් ඒ පිළිබඳ මෙසේ පැහැදිලි කරයි: හෙරක්ලියස් යැවූ දූතයා සිරියාවේ යම් ප්‍රදේශයක දී අපට මුණ ගැසුණි.ඔහු මා හා මාගේ සෙසු මිත්‍ර කණ්ඩායම ජෙරුසලමට රැගෙන ගොස් හෙරක්ලියස්ගේ අධිකරණයට ඉදිරිපත් කළේය. සිය රාජකීය අධිකරණයේ ඔහු ඔටුන්නක් පැළඳ සිටි අතර ඔහු වටා බයිසැන්තියානු ප්‍රභූන් රැස් ව සිටියහ."වක්තෘවරයෙකු යැයි ප්‍රකාශ කරන මිනිසා සමඟ ඔවුන් අතර සමීප සබඳකමක් ඇති අය ඔවුන්ගෙන් කවුරුන්ද? යනුවෙන් අසා සිටිනු" යැයි ඔහු තම පරිවර්තකයාට අණ කළේය."ඔහුට ඉතා සමීප ඥාතියෙකු වන්නේ මා ය " යැයි මම දන්වා සිටියෙමි. ඉනික්බිතිව ඔහුව මා ඉදිරියට රැගෙන එනු.ඔහුත් සමඟ පැමිණි ඔහුගේ සෙසු මිත්‍රයින්වද රැගෙනවිත් ඔහුට පිටුපස සිටවනු යනුවෙන් හෙරක්ලියස් තම සේවක පිරිසට අණ කළේය. පසුව "මම එම පුද්ගලයා පිළිබඳ ඔහුගෙන් (අබූ සුෆ්‍යාන්ගෙන්) විමසමි. ඔහු අසත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළේ නම් පසු පස සිටින පිරිස එය මා වෙත දන්වා සිටිය යුතුයි යනුවෙන් පවසන මෙන් තම පරිවර්තකයාට ඔහු අණ කළේය. "මා අසත්‍ය ප්‍රකාශ ඉදිරිපත් කළේ නම් ඒ පිළිබඳ මාගේ සඟයින් වාර්තා කරයිදෝ යන බිය මා තුළ නොතිබුණේ නම් නියත වශයෙන්ම එවිට මා අසත්‍ය තොරතුරු සපයන්නට තිබිණ" යනුවෙන් අබූ සුෆ්‍යාන් වරක් පවසා සිටියේය.

පසුව,හෙරක්ලියස් රජු මාගෙන් විමසා සිටි ප්‍රථම පැනය නම්: ඔහුගේ

කුලය පිළිබඳවයි."ඔහු අප අතුරින් ඉතා විශිෂ්ට කුලයට අයත් පුද්ගලයෙකු වේ" යනුවෙන් පිළිතුරු දුනිමි. මීට පෙර ඔබලා අතුරින් කවරෙකු හෝ මෙම ධර්ම ප්‍රචාරය කර ඇත්දැ" යි විමසීය. "නැත" යනුවෙන් ප්‍රකාශ කළෙමි.මොහුගේ මුතුන් මිත්තන් අතුරින් කවරෙකු හෝ රජෙකු වී සිටීදැ" යි විමසා සිටියේය.නැත" යනුවෙන් පිළිතුරු දුනිමි. "ඔහුව අනුගමනය කරන්නන් මිනිසුන් අතුරින් විශේෂත්වයක් හිමි අයද නැතහොත් සාමාන්‍ය මිනිසුන්ද"යනුවෙන් ඔහු විමසා සිටියේය.සාමාන්‍ය මිනිසුන් වේ" යනුවෙන් ප්‍රකාශ කළෙමි. ඔහුව අනුග මනය කරන්නන්ගේ ප්‍රතිශතය වර්ධනය වන්නේද නැතහොත් අඩු වන්නේද" යනුවෙන් විමසා සිටියේය. එවිට වර්ධනය වන බව මා පිළිතුරු දුනිමි.

පසුව " ඔහුගේ ධර්මය වැළඳගත් පසු ඒ පිළිබඳ තෘප්තියට පත් නොවී එම ධර්මය හැර ආ කවරෙකු හෝ සිටීදැ" යි විමසා සිටියේය.එවිට මා "නැත" යනුවෙන් ප්‍රකාශ කළෙමි. ඔහු මේ ප්‍රචාරය කිරීමට පෙර කිසිදිනක හෝ අසත්‍ය පවසන්නෙකු බව ඔබලා සැක කර ඇති ද" යනුවෙන් විමසා සිටියේය."නැත"යනුවෙන් මා පිළිතුරු දුනිමි.මොහු දුන් පොරොන්දු කඩ කර ඇත්දැ" යි විමසීය. නැත, එනමුත් මේ කාලවකවානුව තුළදී අප ඔහු සමඟ සාම ගිවිසුමක් කර ඇත්තෙමු.එහිදී ඔහු කෙසේ අපත් සමඟ කටයුතු කරයිද යන්න පිළිබඳ අපි නොදනිමු" යනුවෙන් මා ප්‍රකාශ කළෙමි.එමොහොතේදී නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පිළිබඳ යම් චෝදනාවක් කිරීමට මෙම වචන හැර වෙන කිසිඳු වචනයක් මාගේ දෙබස තුළ ඇතුළත් කිරීමට මා හට නොහැකි විය.ඔහු සමඟ ඔබලා සටන් කර ඇතිද  යනුවෙන් හෙරක්ලියස් රජු මාගෙන් විමසා සිටියේය.එසේය, යනුවෙන් මා ප්‍රකාශ කළෙමි. ඔහුත් සමඟ කළ සටන්වල ප්‍රතිඵලය කුමක් වී දැ" යි අසා සිටියේය.එවිට, ඇතැම් අවස්ථාවන්හිදී ඔහු ජය ලබා ගත් අතර වෙනත් අවස්ථාවන්හිදී අප ජය ලබන්නෙමු" යනුවෙන් ප්‍රකාශ කළෙමි. ඔබලාට ඔහු දන්වා සිටින්නේ කුමක් පිළිබවදැ" යි ඔහු විමසීය.ඒකීය අල්ලාහ්ට පමණක් නැමදුම් කරන ලෙසත් ඔහුට කිසිසේත් ආදේශයන් නොතබන ලෙසත් මුතුන්මිත්තන් ප්‍රකාශ කර සිටි දෑ අත් හැර දමන ලෙසත් නැමදුම් කිරීම, සත්‍ය ප්‍රකාශ කිරීම, ඥාති සබඳතා පවත්වාගෙන යාම යනාදී කරුණු අණ කර සිටියි" යැයි මම ප්‍රකාශ කළෙමි.

හෙරක්ලියස් රජු සිය පරිවර්තකයාට ඔවුනට පරිවර්තනය කර දෙනු මෙන් අණ කළ දෑ කුමක්දයත්: ඔහුගේ කුලය පිළිබඳ මා විමසා සිටියෙමි, ඔහු විශිෂ්ට කුලයට අයත් එක් පුද්ගලයෙකු වේ යනුවෙන් ඔබ ප්‍රකාශ කර සිටියේය. වක්තෘවරුන් සියල්ලන්ගේ ස්ථාවරය මෙයයි. ඔවුන් සියල්ල උසස් හා ශ්‍රේෂ්ඨ කුලයකින් බිහි වූ උදවිය වෙති.

ඔබලා අතුරින් කවරෙකු හෝ මෙම ප්‍රචාරය මින් පෙර කර ඇත්දැයි විමසා සිටියෙමි. එයට නැත යනුවෙන් ඔබ ප්‍රකාශ කළෙහිය. මින් පෙර මෙම ප්‍රචාරය කවරෙකු හෝ කර ඇත්නම් ඔහුද එය අනුගමනය කර එම ප්‍රචාරය කරන බව මා ප්‍රකාශ කරන්නට තිබුණි.

ඔහුගේ මුතුන් මිත්තන් අතුරින් කවරෙකු හෝ රජකම් කළේදැයි මා විමසන විට නැතැයි ඔබ පිළිතුරු දුන්නේය. ඊට මොහුගේ මුතුන් මිත්තන් කළ රජකම ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයෙකු බව මා ප්‍රකාශ කරන්නට තිබුණි.

මෙම ප්‍රචාරය කිරීමට පෙර ඔහු කිසිදිනක හෝ අසත්‍ය පවසන්නෙකු බව ඔබලා සැක කර ඇතිද යනුවෙන් විමසා සිටියෙමි. එයට ඔබ නැත යනුවෙන් පැවසීය. ජන සමාජයට අසත්‍ය ප්‍රකාශ කිරීමට එඩිතර නොවන පුද්ගලයෙකු දෙවියන් පිළිබඳ අසත්‍ය තොරතුරු ලබා දීමට එඩිතර නොවන බව මා විශ්වාස කරමි.

ඔහුව අනුගමනය කරන්නන් මිනිසුන් අතුරින් විශේෂත්වයක් හිමි අයද නැතහොත් සාමාන්‍ය මිනිසුන්ද යනුවෙන් විමසුවෙමි. සාමාන්‍ය මිනිසුන් බව ඔබ දන්වා සිටියෙහිය. පෙර පැමිණි ධර්ම දූතයන්ව ආරම්භයේදී අනුගමනය කළ පුද්ගලයන් සාමාන්‍ය මිනිසුන් ය.

ඔහුව අනුගමනය කරන්නන්ගේ ප්‍රතිශතය වර්ධනය වන්නේද නැතහොත් අඩු වන්නේද යනුවෙන් විමසුවෙමි. වර්ධනය වන බව ඔබ ප්‍රකාශ කළෙහිය. දේව පණිවිඩය සර්ව සම්පූර්ණ වන තෙක් ඒ අයුරින් වර්ධනය වෙමින්ම පවතී යනුවෙන් හෙරක්ලියස් රජු පවසා සිටියහ.

ඔහුගේ ධර්මය වැළඳගත් පසු ඒ පිළිබඳ තෘප්තියට පත් නොවී එම ධර්මය හැර ආ කවරෙකු හෝ සිටීදැයි විමසා සිටියෙමි. නැත යනුවෙන් ඔබ සඳහන් කළෙහිය. දේව විශ්වාසය යම් හදවතක් තුළ පතිත වන්නේ නම් එහි ස්ථාවරය එසේය. එය ඉතා ස්ථිර විශ්වාසයකි යනුවෙන් රජු පැවසීය.

මොහු දුන් පොරොන්දු කඩ කර ඇත්දැයි විමසා සිටියෙමි.නැත යැයි ඔබ ප්‍රකාශ කළෙහිය. දෙවියන් විසින් එවනු ලැබූ ධර්ම දූතයන්ගේ ස්ථාවරය එයයි. ඔවුන් කිසිදා ලබා දුන් පොරොන්දු කඩ කරන්නේ නැත යනුවෙන් ඔහු පැවසීය.

ඔහු ඔබලාට දන්වා සිටින්නේ කුමක් පිළිබඳවදැයි මා විමසුවෙමි. එයට ඔබ ඒකීය අල්ලාහ්ට පමණක් නැමදුම් කරන ලෙසත් ඔහුට කිසිසේත් ආදේශයන් නොතබන ලෙසත් මුතුන්මිත්තන් ප්‍රකාශ කර සිටි දෑ අත් හැර දමන ලෙසත් නැමදුම් කිරීම, සත්‍ය ප්‍රකාශ කිරීම, ඥාති සබඳතා පවත්වාගෙන යාම යනාදී කරුණු අණ කර සිටින බව ප්‍රකාශ කර සිටියේය. ඔබ පවසන්නේ සත්‍ය දෑ නම් මා යටතේ තිබෙන්නා වූ මෙම පාලනයද ඔහු කෙදිනක හෝ අත්පත් කරගනු ඇත. මෙවන් ගතිලක්ෂණයෙන් පිරි ධර්ම දූතයෙකු ඉතා සීඝ්‍රයෙන් පැමිණෙන බව මා දැන සිටිමි. එනමුත් අරාබිවරුන් වන ඔබලා අතුරින් බිහි වන වග මා නොදනිමි. මොහුව සොයා යන ගමන්මඟ මා දැන සිටියේ නම් වෙහෙස දරා හෝ මම ඔහුව මුණ ගැසෙමි. දැන් ඔහු මා අතර සිටියේ නම් ඔහුගේ පාද මා සෝදා දමමි” යනුවෙන් හෙරක්ලියස් රජු පැවසීය,

අබූ සුෆ්‍යාන් තවදුරටත් මෙසේ වාර්තා කරයි:

පසුව හෙරක්ලියස් අල්ලාහ්ගේ දූතයාණන් යැවූ ලිපිය ඉල්ලූ අතර එය ඔහු ඉදිරියේ කියවන ලදී. එහි අන්තර්ගතය පහත දැක් වේ.

දෙවියන් වූ අල්ලාහ්ගේ නාමයෙන් මම ආරම්භ කරමි. ඔහු අපරිමිත දයාන්විතය. අසමසම කරුණාන්විතය.

අල්ලාහ්ගේ සේවකයා වූද, ඔහුගේ දූතයා වූද, මුහම්මද්ගෙන් බයිසන්ටයින්හි මහා පාලකයා වූ හෙරක්ලියස් වෙත.

යහමඟ අනුගමනය කරන්නන්ට සාමය වේවා!

මා ඔබව ඉස්ලාමය වෙත ආරාධනා කරමි. ඉස්ලාමය පිළිගැනීම මඟින් ඔබ සුරක්ෂිත වනු ඇත. ඉස්ලාමය පිළිගැනීම මගින් දෙවියන් ඔබට ද්විත්ව වේතනය ලබා දෙනු ඇත. නමුත් ඉස්ලාමයේ මෙම ආරාධනය ඔබ ප්‍රතික්ෂේප කරන්නේ නම්, ඔබගේ ජාතිය නොමඟ යැවීම පිළිබඳ ඔබ වගකිව යුතු ය.

දහම්ලත් ජනයිනි! අපි අල්ලාහ් හැර අන්කිසිවකු ඉබාදත් නොකරමු යැයිද (අවනත නොවෙමු යැයිද) අපි ඔහුට අන්කිසිවක් සමාන නොකරමු යැයිද, අපගෙන් සමහරෙක් අල්ලාහ් හැර අන්කිසිවකු පරමාධිපතියන් ලෙසින් නොගනිමු යැයිද, අප අතරද නුඹලා අතරද පොදු සම්මුතියකට එළඹෙමු යැයිද, (නබි මුහම්මද්) පවසනු. එවිට ඔවුන් (ඔබගේ ආරාධනාව නොපිළිගෙන) පිටු පෑවේ නම් නියත වශයෙන්ම අප මුස්ලිම්වරුන් (අල්ලාහ්ට පමණක් ඉබාදත් කරන ඔහුට පමණක් යටහත් වන) බවට නුඹලා සාක්ෂි දරනු යැයි (නබි මුහම්මද්) පවසනු .(ශුද්ධ වූ අල්කුර්ආන් 3:64)

තවදුරටත් අබූ සුෆ්යාන් මෙසේ වාර්තා කරයි:

හෙරක්ලියස් රජු සිය කථාව අවසන් කළ විට, ඔහු වටා සිටි බයිසන්තීය සම්භාවිය ප්‍රභූන් මහා ඝෝෂාවක් සහ හඬක් නැගූහ. ඔවුන් කීවේ කුමක්ද යන්න මා හට තේරුණේ නැත. පසුව, අධිකරණයෙන් පිටත් වන ලෙස අපට අණ කෙරුණි.

මා මාගේ මිත්‍රයන් සමඟ පිටත් වී අප සියල්ල තනි ව සිටිය දී, අහෝ මෙහි රෝමවරුන්ගේ රජු පවා ඔහු ගැන බිය වන තරම් සැබවින්ම මුහම්මද් තුමාගේ කාරණය ප්‍රබල වී ඇත යනුවෙන් පැවසුවෙමි. එදා පටන් ජය ලබන්නෝ ඔවුන් යන විශ්වාසයෙන් මා ජීවත් වුනිමි. අවසානයේදී අල්ලාහ් මා වෙතද ඉස්ලාමය රැගෙන ආවේය. (මූලාශ්‍රය: සහීහ් අල් බුහාරි)

# උපන් ස්ථානය සහ ළමාවිය

මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් ක්‍රිස්තු වර්ෂ 571 දී උපත ලැබුවේ අරාබි අර්ධද්වීපයේ ආගමික කේන්ද්‍රස්ථානයක් ලෙස සලකනු ලබන මක්කාහ් නගරයේ ඉතා ගෞරවයට ප්‍රාප්ත වූ කුරෙයිෂ් ගෝත්‍රයට අයත් අඹුසැමි යුවලකටයි.

එම මක්කාවෙහි පිහිටි කඃබාව ඉබ්‍රාහීම් (අලෙයිහිස් සලාම්) හා එතුමාගේ පුත්‍රයාණන් වන ඉස්මාඊල් (අලෙයිහිස් සලාම්) විසින් නැවත ඉදි කරන ලදී. ඒ වෙත අරාබිවරුන් හජ් වන්දනාව සඳහා පැමිණ ඒ වටා සක්මන් කරමින් වැඳපුදා ගනිමින් සිටියෝය.මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් සිය මෑණියන්ගේ කුසෙහි සිටින කල්හිම එතුමන්ගේ පියාණන් අභාවයට පත් විය. එතුමා ඉපදී අවුරුදු සයකට පසු එතුමන්ගේ මෑණියන් වන ආමිනා තුමියද අභවප්‍රාප්ත වූවාය. එම අවස්ථාවේදී අනාථයකු වූ එතුමන් ඔහුගේ සීයා වන අබ්දුල් මුත්තලිබ්ගේ යහපත් රැකවරණය තුළ සිය ජීවිතය ගත කළේය. ඔහුද ස්වල්ප කලකට පසු මිය ගිය අතර ඉන් පසුව තම පියාණන්ගේ සහෝදරයා වන අබූ තාලිබ් එතුමාණන්හට යහපත් අයුරින් රැකවරණය ලබා දීමේ වගකීම භාර ගත්හ.ඔහුගේ ගෝත්‍රය මෙන්ම එකල්හි ජීවත් වූ වෙනත් අයද ගල්, ලී සහ අනෙකුත් ද්‍රව්‍යවලින් සාදන ලද පිළිමවලට නමස්කාර කරමින් ඒවා කඃබාව වටා අටවා තබන ලදී. මෙම පිළිමවලට හානියක් සිදු කිරීමේ සහ ප්‍රතිලාභ ලබා දීමේ හැකියාව ඇති බව එකී ජනතාව විශ්වාස කළහ.

කුඩා කල සිටම නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණෝ විශ්වාසභාවය හා අවංකත්වය වැනි විශිෂ්ට මානුෂීය ගුණාංග වලින් හෙබි පුද්ගලයෙක් ලෙස වර්ණනා විය. එතුමන් කපටි කෛරාටික චරිතයක් නොවූ අතර කිසිදා අසත්‍ය ප්‍රකාශ කර නොමැති, එමෙන්ම වංචාවක් නොකළ මහඟු පුද්ගලයෙකි. ඔහු ඇත්ත වශයෙන්ම "අල් -

අමීන්" එනම් - විශ්වාසවන්තයා - ලෙස තම ජනතාව අතර සුප්‍රසිද්ධය. මිනිසුන් ගමන්බිමන් හි නිරත වන්නේ නම් ඔවුන්ගේ වටිනා බඩුභාණ්ඩ එතුමන් වෙත භාර දී යන තත්ත්වයක් එකල්හි දැක ගන්නට තිබුණි. මන්දයත් එවන් වූ විශ්වාසභාවයක් එකල්හි ජීවත් වූ ජනයා තුළ ඔහු දිනා ගෙන සිටියේය. එතුමන් කිසිදාක අසත්‍ය නොපවසා සිටි හේතුවෙන් "අස් සිද්දීක්" එනම් - සත්‍යයවන්නතයා - යන නාමයෙන් හඳුන්වනු ලබයි. ඔහු සැබැවින්ම මනා හික්මීමකින් යුතු, ජනයා සමඟ යහපත් අයුරින් කතා කරන, ඔවුන් සඳහා උපකාර කිරීමට ප්‍රිය කරන යහපත් පුද්ගලයකි. එතුමන්ගේ සමාජය ද එතුමන් කෙරෙහි ඇලුම් කළ අතර ඔහුව සම්මානයට පාත්‍ර කළහ. ඒ සියල්ල සිදු වූයේ එතුමන් සතුව තිබූ යහපත් හැසිරීම් තුළිනි. උත්තරීතර අල්ලාහ් එය තහවුරු කරමින් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

නියත වශයෙන්ම ඔබ ශ්‍රේෂ්ඨ යහපත් ක්‍රියාවන්ගෙන් යුක්තව සිටින්නෙහිය. (ශුද්ධ වූ අල්කුර්ආනය 68:4)

අන්‍ය ආගමික සුප්‍රසිද්ධ ස්කොට් ජාතික ඉතිහාසඥයෙක් හා ලේඛකයෙකු වන තෝමස් කාලයිල් (විපත:1885) නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පිළිබඳ ශූරයෝ නැමැතැ සිය කෘතියෙහි මෙසේ රචනා කර ඇත:

මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කුඩා අවදියේ සිට කරුණාවන්තයෙකු ලෙස සලකන ලදී. ඔහුගේ මිතුරන් විසින් ඔහුව "අල් අමීන්" විශ්වාසවන්තයා, යනුවෙන් හඳුන්වන ලදී. ඔහුගේ ක්‍රියාවෙහි, කථනයෙහි හා සිතුවිලිහි සත්‍යය සහ විශ්වාසවන්තභාවය පිරී ඉතිරී තබුණි.එතුමණ්ගේ උතුම් මුඛයෙන් යම් වදනක් හෝ බැහැර වන්නේ නම් එය ප්‍රඥාවෙන් පිරි යමක් මිස බැහැර නොවන බව එකල්හි ජීවත් වූ ජනයින් දැන සිටියහ. නියත වශයෙන්ම මා හඳුනා ගත් විෂයක් නම් එතුමණ් අධික ලෙස කථා නොකරන නිහඬතාවයෙන් පසු වූ පුද්ගලයෙකි. කතා කිරීමට හේතුවක් නොමැති අවස්ථාවක කිසිවක් කතා නොකරයි. නමුත් කතා කළේ නම් කාරණයට උචිත, අවංක හා ප්‍රඥාවන්ත ලෙස එම කතාව පිහිටනු ඇත.

තවද එතුමාණන් සිය ජීවිතයෙහි ප්‍රතිපත්තිමය වශයෙන් ශක්තිමත් දැඩි අධිෂ්ඨානයක් ඇති,ධෛර්යසම්පන්න වූ,අරමුණක් සහිත දිවි

පෙවෙතක් ගත කළ පුද්ගලයෙකු වූ අතර කීර්තිය, යහපත, කරුණාව, දේව බියභක්තිය, ගෞරවය, නිදහස වැනි යහගුණාංග තමා සතු කර ගත් මහඟු උත්තමයෙකු ලෙස දැක ගන්නට පුළුවණි. තවද එතුමාණන් මෘදු ස්වභාවයකින් යුත් ක්‍රියාදාමයන්හි සිනිඳු භාවයක් දක්වන සරල චරිතයක් ඇති සිනහවෙන් පිරි, ශාන්තභාවයෙන් යුත් චරිතයකි. තවද මිත්‍රශීලී, කාරුණික එපමණක් නොව (සීමාව නොඉක්මවා) විහිළුතහළු වලින්ද අඩුවක් නොවූ උතුම් මිනිසෙකි. සමස්තයක් ලෙස සැබෑ හදවතකින් ඉතිරන දීප්තිමත් සිනහවකින් එතුමණ්ගේ මුහුණ දිලිසෙමින් තිබුණි. එමෙන්ම තීක්ෂණ බුද්ධියක් සහිත විචක්ෂණභාවයෙන් පිරි, ස්වභාවයෙන්ම ශ්‍රේෂ්ඨමත් පුද්ගලයෙකු ලෙස එතුමාණන්ව දැක ගත හැක. කිසිදු සිප්හලක් ඔහුව ප්‍රඥාවන්තයෙකු ලෙස පත් නොකළ අතර කවර හෝ ගුරුවරයෙකු ඔහුට ශිල්පය ඉගැන්වූවේද නැත. ඒවා සියල්ල ඔහුට අවශ්‍ය නොවූ අතර ඔහු තනි පුද්ගලයෙකු ලෙස නැගී සිට වැලිකතරේ තම රාජකාරිය දියත් කළේය. (තෝමස් කාලයිල් ගේ අදහස් අවසන්)

ධර්මදූත මෙහෙවර ලැබීමට ස්වල්ප කලකට පෙර සිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විශේෂයෙන් මක්කා නගරයේ පිහිටි හිරා නැමැති කඳුකරයේ රැඳී සිට හුදකලාවේ අසුන් ගෙන දෙවියන් වූ අල්ලාහ්ට වන්දනාමාන කරමින් නිතිපතා කල් ගෙවමින් සිටියේය. තවද එකල්හි ජීවත් වූ සිය සමාජය අතර ව්‍යාප්තව තිබූ සියලු සිරිත්විරිත් වලින් දුරස් වී සිටියහ. ඔහු කිසිදිනක මත්පැන් පානය කළේ නැති අතර කිසියම් පිළිමයකට හෝ රූපයකට වන්දනාමාන කළේද නැත. එපමණක් නොව එම පිළිම මත දිවුරීමක් හෝ ඒ සඳහා යම් පඬුරක් හෝ ලබා දී ද නැත.

ඔහු සිය ජීවනෝපාය සඳහා තම ජනතාවට අයත් බැටළුවන් හොඳින් රැක බලාගත් එඬේරෙකු විය. ඒ පිළිබඳ වරක් එතුමාණන් මෙසේ සඳහන් කළේය.

සෑම ධර්ම දූතයකුම බැටළුවන් රැක ගැනීමේ වෘතියේ නිරත වී ඇත. ඔබත් එසේද යනුවෙන් ඔහු වටා සිටි ශ්‍රාවකයින් විසින් විමසන ලදී." එසේය මා ද මක්කා වැසියන් සතු බැටළුවන් රැක බලා ගනිමින් සිටියෙමි" යනුවෙන් පිළිතුරු දුන්හ. (මූලාශ්‍රය:බුහාරි)

එතුමාණන්ගේ වයස අවුරුදු හතළිහක් සම්පූර්ණ වූ අවස්ථාවේදී, එතුමාණන් මක්කාවෙහි පිහිටි හිරා කඳු ගුහාවෙහි වන්දනාවෙහි නිරතව සිටියදී අහසින් වහී හෙවත් දිව්‍යමය මඟපෙන්වීම එතුමා වෙත පහළ වීමට ආරම්භ විය. ඒ පිළිබඳ ආඉෂා (රළි) තුමිය මෙසේ පැහැදිලි කරයි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් හට ආරම්භයේදී අල්ලාහ්ගේ පණිවිඩය එනම් දිව්‍යමය මඟපෙන්වීම සිහිනෙන් පහළ විය. එවිට එතුමාණන් කුමන සිහිනයක් දකින්නේද එය උදෑසන පායන හිරු සේ පැහැදිලිව තිබුණි. පසුව එතුමාණන් හුදකලාවේ සිටීමට ඇල්මක් දැක් වූ අතර හිරා නැමැති ගුහාවෙහි එසේ හුදකලාවේ සිටින්නට විය. එතුමාණන් තම පවුලේ අය වෙත ආපසු පැමිණීමට පෙර රාත්‍රීන් කිහිපයක්ම එහි රැඳී සිට වන්දනාවෙහි නිරත වුහ. ඒ දිනයන් සඳහා අවශ්‍ය ආහාරපාන ආදිය රැගෙන යනනේය. ඒවා අවසන් වූ පසු නැවතත් තම බිරිඳ වන කදීජා (රළි) තුමිය වෙත එතුමාණන් ආපසු පැමිණෙති. දින කිහිපයක් ඒ අයුරින් ආහාරපාන රැගෙන ගිය අතර මෙම තත්ත්වය හිරා නැමැති ගුහාවෙහි සත්‍ය පහළ වන තුරුම දිගු විය. දිනක් සුර දූතයෙකු එතුමාණන් වෙත පැමිණ කියවනු මැනව! යනුවෙන් ඉල්ලා සිටියේය. මා කියවීමට නොදන්නෙමි යනුවෙන් එතුමාණන් පැවසූහ.

අල්ලාහ්ගේ දූතයාණන් වූ මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසින් ඒ පිළිබඳ වරක් මෙසේ පැහැදිලි කරන ලදී:

එම සුරදූතයා මාව බලෙන් අල්ලාගෙන මා හට තවදුරටත් දරාගැනීමට නොහැකි වන පරිදි තද කර බදා ගත්තේය. ඉන් පසු වරින් වර මා අත්හරිමින් නැවත නැවතත් කියවනු යැයි පවසා සිටියේය. එවිටද මා කියවීමට නොදන්නෙමි යැයි පිළිතුරු දුනිමි. දෙවෙනි වරටද මාව බලෙන් අල්ලාගෙන මා හට තවදුරටත් දරාගැනීමට නොහැකි වන අයුරින් තද කර බදා ගත්තේය. ඉන් පසු වරින් වර මා අත්හරිමින් නැවත නැවතත් කියවනු යැයි පවසා සිටියේය. එවිටද මා කියවීමට නොදන්නෙමි යැයි පවසා සිටියෙමි. තුන්වෙනි වරටත් තද කර බදා ගනිමින් ග්‍රහණයෙන් අත් හැර එම සුරදූතයා "මැවීම් නිර්මාණය කළා වූ හිමිපාණන්ගේ නාමයෙන් කියවනු! ඔහුම මිනිසා ඝන රුධිර

කැටියෙන් නිර්මාණය කළේය. එබැවින් කියවනු. ඔබගේ හිමිපාණන් ඉමහත් ගෞරවයෙන් පිරී ඇත්තේය.” යනුවෙන් පාරයනා කළේය.

තවද ආඉෂා (රළි) තුමිය මෙසේ වාර්තා කරයි:

ඉන්පසු හෘද ස්පන්දනය අධික වී ගැහෙමින් එතුමාණෝ එම වාක්‍යය සමඟ තම බිරිඳ වන කදීජා (රළි) තුමිය වෙත පැමිණ මාව පොරවනු! මාව පොරවනු! යනුවෙන් කියා සිටයේය. කදීජා (රළි) තුමිය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව පෙරෙව්වාය. ගැහැමින් සිටි තත්ත්වයෙන් එතුමාණන් මිදුණු පසු කදීජා (රළි) තුමිය වෙත සිදු වූ සිද්ධිය දැනුම් දී තමන් හට කුමක් හෝ සිදුවේදැයි තමන් බිය වන බව දන්වා සිටියහ. එවිට කදීජා (රළි) තුමිය එසේ නොපවසනු! අල්ලාහ් මත දිවුරා පවසමි “ඔබව අල්ලාහ් කිසිවිටකත් අවමන් නොකරනු ඇත. මන්දයත් ඔබ ඥාතීන් සමඟ එකතු වී ජීවත් වන්නෙහිය.ඉසිලිය නොහැකි උදවියගේ බර ඔබ උසුළන්නෙහිය. තවද ව්‍යසනයන්ට ගොදුරු වූ උදවියට ඔබ උදව් කරන්නෙහිය. අමුත්තන්හට ඔබ සංග්‍රහ කරන්නෙහිය” යනුවෙන් පවසා තම පියාගේ එක්කුස උපන් නව්ෆල් නැමැති අයගේ පුත් වරකාහ් නැමැත්තා වෙත නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව කැටුව ගියාය.

වරකාහ් ඉබ්නු නව්ෆල් නැමැත්තා අඥාන කාලයේදී කිතුනු දහම වැළඳ ගත් අයෙකු වූ අතර හිබෲ භාෂාව ලියන්නට හා කියවන්නට හැකියාවක් ඇත්තෙකු විය. ඉන්ජීල් ධර්මය හිබෲ භාෂාවෙන් ඔහු විසින් ලියවිය යුතු බව අල්ලාහ් අපේක්ෂා කරන තරම් ඔහු ලිවීමෙහි දක්ෂයෙකු වශයෙන් හා ඇස් පෙනුම සිඳී ගිය මහල්ලෙකු වශයෙන් සිටීය. ඔහු වෙත කදීජා (රළි) තුමිය පැමිණ, අහෝ මාගේ පියාණන්ගේ සහෝදරයාගේ පුතුනි! ඔබගේ සහෝදරයාගේ දියණිය පවසන දෑට මදක් සවන් දෙනු මැනව යනුවෙන් ඉල්ලා සිටියාය. එවිට ඔබ කුමක් දුටුවේදැ”යි වරකාහ් ඉබ්නු නව්ෆල් නබි තුමාගෙන් විමසා සිටියේය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තමාට සිදු වූ සිද්ධිය ඔහු වෙත පවසා සිටි අතර එයට සවන් දුන් වරකාහ් ඉබ්නු නව්ෆල් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණියේ ධර්ම දූත මූසා (අලෛයිහිස් සලාම්) වෙත පැමිණි සුර දූතාය ය. ඔබගේ සමූහය ඔබව ඔබගේ රටින් පිටුවහල් කරන අවස්ථාවේදී මා ජීවතුන්

අතර සිටින සෞඛ්‍ය සම්පන්න තරුණයෙකු ලෙස සිටිය යුතු නොවේද යනුවෙන් ප්‍රාර්ථනා කළේය.

එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ජනතාව විසින් මා පිටුවහල් කරනු ලබන්නෙහුදැ"යි විමසූහ. එයට ඔහු "එසේය" ඔබ ගෙන ආ දැය මෙන්ම සත්‍ය ගෙන ආ සෙසු අය සමඟ ජනතාව විරුද්ධව සිටියෝය. ඔබව පිටුවහල් කරන එම දිනයෙහි මා සිටින්නේ නම් ඔබට රැකුලක් වෙමි" යනුවෙන් වරකාහ් ඉබ්නු නව්ෆල් පැවසුවේ. එනමුත් වරකාහ් ඉබ්නු නව්ෆල් දීර්ඝ කලක් ජීවතුන් අතර සිටියේ නැත. මෙම පළමු දිව්‍යමය මඟපෙන්වීමත් සමඟ එය පහළ වීම ස්වල්ප කලකට නතර විය. (මූලාශ්‍රය:බුහාරි)

ඉහත උපුටා දැක් වූ හදීසයේ සඳහන් අල්කුර්ආන් වැකිය එතුමාණන්ගේ දේව දූත මෙහෙවරෙහි ආරම්භය ලෙස සලකනු ලබයි.පහත සඳහන් වාක්‍ය ඉන් මාස කිහිපයකට පසු පහළ වුණි.

(වහී නිසා ඇති වූ තිගැස්සීමෙන්) පොරවාගෙන සිටින්නාණනි! ඔබ නැගිටිනු (මිනිසුන්ට) බියගන්වා අනතුරු අඟවනු.ඔබගේ දෙවියන් උත්කෘෂ්ට කරනු. ඔබේ වස්ත්‍ර පිරිසිදු කර ගනු.අපිරිසිදු දැය පිළිකුල් කර හරිනු. (ශුද්ධ වූ අල්කුරාන් 74:01-05)

ඒ අනුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම දේව දූත මෙහෙවර නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමට මෙම වාක්‍ය ආරම්භයක් විය.

ඒ අනුව තමන් සමඟ එකට ජීවත් වූ මක්කා වැසියන් අතර එතුමාණන් තම මෙහෙවර දියත් කිරීමේදී නොයෙකුත් තාඩන පීඩන සහ දැඩි විරෝධයන්ට මුහුණ පෑමට සිදු විය. මන්දයත් මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එම සමූහය මින් පෙර සවන් නොදුන් මුළුමනින්ම වෙනස් වූ ඇරයුමක් ඔවුන් ඉදිරියේ ඉදිරිපත් කළේය. එම ඇරයුම ඔවුන්ගේ ජීවිතයෙහි නීතිය හා සාධාරණය, සදාචාරය හා ශිෂ්ට රීතිය, වාණිජ සහ ආර්ථික, දේශපාලනය හා රාජ්‍ය පාලනය, සමාජ ජීවිතය ,දැනුම සහ අධ්‍යාපනය, සනීපාරක්ෂාව, මානව හිමිකම් සහ ඥාතීන් සමඟ සබඳතාව වැනි අනෙකුත් සෑම අංගයක් පිළිබඳ කරුණු අන්තර්ගත වූ ඇරයුමක් වශයෙන් තිබුණි. එම ඇරයුම හුදෙක් ඒක දේව විශ්වාසය වෙත ඇරයුම් කර අල්ලාහ් හැර අන් කිසිවෙකු සඳහාත් වන්දනාමාන නොකළ යුතුයි යනුවෙන් අණ කරන සීමාවක

පමණක් නොනැවතී ඒවාත් සමඟම මත්පැන් පානය කිරීම, දුරාචාරයේ යෙදීම, පොලිය හා සූදුව වැනි එම සමාජය තුළ මුල් බැසගත් සෑම අයහපත් ක්‍රියාවන් වලින් දුරස් වී සිටින මෙන්ද, මිනිසුන් සමඟ කිසිඳු භේදයකින් තොරව සාධාරණ ලෙස කටයුතු කරන මෙන්ද, දේව බිය භක්තිය මඟින් මිස මිනිසුන් අතර කිසිඳු භේදයක් නොමැත යන කරුණු මත එම ඇරයුම සකස් වී තිබුණි.

කුරෙයිෂ් ග්‍රෝතිකයින් තමන් හා වහලුන් අතර සමානාත්මතාවය තහවුරු කිරීම කෙසේ නම් පිළිගනීද? එකල්හි ජීවත් වූ අරාබි නායකයින්, පාලකයින් හා කුරෙයිෂ් ග්‍රෝතිකයින් මෙම ඇරයුමට විරුද්ධ වූවා පමණක් නොව, මෙම ඇරයුම කරන මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට ඉතා නරක වදන් වලින් බැනවදිමින් ඔහුට එරෙහිව කවි කියා, ඔහු එක් මුසාවාදියෙකු හා පිස්සෙකු හා හූනියම්කාරයෙකු වේ යන අසත්‍ය චෝදනාවන් නැගූ අතර ඔහුට නොයෙකුත් අන්දමින් හිරිහැර කළහ. මෙම ඇරයුම් ප්‍රසිද්ධ කිරීමට පෙර එතුමන් කෙරෙහි මෙවන් වූ කිසිඳු චෝදනාවක් ඔවුන් විසින් සමාජගත කළේ නැත. එමෙන්ම, මක්කාවෙහි වාසය කළ ඇතැමුන් විසින් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්හට හිරිහැර කිරීමට කැරලි කරුවන් උසිගන්වන ලදී. මේ පිළිබඳ අබ්දුල්ලාහ් ඉබ්නු මසූද් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි :

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වරක් කඃබාව ළඟ සලාතය ඉටු කරමින් සිටියේ ය. එවිට කුරෙයිෂ් ග්‍රෝතිකයින් ඇතැමුන් එහි පැමිණ අසුන් ගත්තෝය. ඔවුන් අතර අබූ ජහල් නැමැත්තාද සිටියේ ය. ඔහු ඔහුගේ සඟයින් දෙස බලා අද දින මක්කාවෙහි යම් ප්‍රදේශයක ඔටුවෙක් මා කපා හැරියෙමි. එම ඔටුවාගේ බඩවැල් හා අසූචි තවමත් එහි ඇත. නුඹලාගෙන් කවරෙකු හෝ ඒවා රැගෙනවිත් මුහම්මද් මත දමනු යැයි අණ කර සිටියේය. පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සලාතයෙහි නළල පොළෝ මත තබා ගැනීමේ ඉරියව්වෙහි සිටින විට එම ලේ සහිත බඩවැල් හා අසූචි එතුමාණන් මත දමා ඔහු වටා සිට විනෝදයෙන් සිනාසුනෝය. එවිට ඉබ්නු මසූද් (රළි) තුමාණන් එහි වැඩ සිටියේය. එනමුත් කුරෙයිෂ් ග්‍රෝතිකයින් අධික සංඛ්‍යාවක් එහි රැස්ව සිටි බැවින් කුමක් කළ යුතු දැයි නොදැන නිසොල්මන් වී සිටියේය. එවිට එතුමාණන්ගේ දියණිය

වන ෆාතිමා (රළි) තුමිය පැමිණ එතුමාණන්ගේ උතුම් දේහයේ තිබුණු එම බඩවැල් හා අසුචි ඉවත් කර දමා පිරිසිදු කළාය.(මූලාශ්‍රය:බුහාරි)

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ශ්‍රාවකයෙකු වන මුනීබ් අල් - අස්දි (රළි) තුමා මෙසේ වාර්තා කරයි:

අඥාන යුගයෙහි මා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව දුටුවෙමි. එතුමාණන් අහෝ ජනයිනි! නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත යනුවෙන් ප්‍රකාශ කරන්න. නුඹලා ජය ලබන්නෙහුය යනුවෙන් පවසමින් සිටියේය. එසේ පැවසූ හේතුවෙන් ඔහු වටා ඇතැම් මිනිසුන් ඔහුගේ මුහුණට කෙළ ගසමින් තවත් ඇතමුන් ඔහුට වැලි වලින් පහර දෙමින් හා ඔහුට බැන වදිමින් සිටියෝය. හිරු මුදුනට විත් රශ්නය අධික ලෙස තිබූ ඒ මොහොතේ එතුමාණන්ගේ සෙනෙහිබර දියණියන් ජල භාජනයක් කර මත උසුලමින් දිවගෙනැවිත් එතුමාණන්ගේ මුහුණ හා අත් සෝදා දැමුවාය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මා ආදරණීය දියණියනි! ඔබේ පියාණන් හට සිදු වූ මෙම අගෞරවය හා නින්දාව පිළිබඳ ඔබ බිය නොවන්න යනුවෙන් පවසා සිටියහ.(මූලාශ්‍රය: තබරානී)

තවද උර්වා බින් සුබයිර් (රළි) තුමා මෙසේ වාර්තා කරයි:මා අබ්දුල්ලාහ් බින් අම්ර් බින් ආස්(රළි) තුමාණන් වෙත නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට ආදේශකයින් හෙවත් අල්ලාහ්ට සමානයන් උපකල්පනය කරන උදවිය විසින් සිදු කළ දරුණුතම හිංසාව කුමක්දැ? යි විමසා සිටියෙමි. එවිට ඔහු මෙසේ පැවසුවේය.වරක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කඃබාව අසලට වී සලාතය කරමින් සිටියහ. එවිට උක්බත් ඉබ්නු අබී මුයීද් නැමැත්තා තමා ඇඳ සිටි වස්ත්‍රය ගලවා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ගෙලහි දමා දැඩි ලෙස හිර කරමින් සිටියේය. එය දුටු අබූ බක්ර් (රළි) තුමාණන් ඔහු වෙත දිවගෙනවිත් ඔහුට පහර දී ඔහුව තල්ලු කර නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව ආරක්ෂා කළේය. පසුව ඔහු දෙස බලා මාගේ දෙවියාණන් ඒකීය වේ යනුවෙන් පැවසූ හේතුවෙන් ඔහුව ඝාතනය කිරීමට නුඹලා වෙහෙස දරන්නෙහුද? නියත වශයෙන්ම ඔහු නුඹලාගේ රබ් වන පරමාධිපති වූ අල්ලාහ්ගෙන් සත්සුදක් සේ පැහැදිලි සාධක ස්වල්පයක් රැගෙනවිත් සිටින බව ප්‍රකාශ කර සිටියේය. (මූලාශ්‍රය:බුහාරි)

මෙවන් වූ තාඩන පීඩන පැමිණියද තම මෙහෙවර ඉදිරියට ගෙන යෑමේ විෂයෙහි එතුමාණන් පසුබට වූයේ නැත.එබැවින් මක්කාවට හජ් සමයේ පැමිණෙන ජන සමූහයන් කෙරෙහි තම අවධානය යොමු කර ඔවුන් වෙත මෙම ඇරයුම ඉදිරිපත් කළේය. මේ අයුරින් පැමිණි කණ්ඩායම් අතුරින් යස්රිබ් නම් වර්තමානයේ මදීනාව යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රදේශයෙන් පැමිණි පිරිසක් මෙතුමාණන්ගේ ඇරයුම පිළිගෙන ඉස්ලාමය වැළඳ ගත්හ. එමෙන්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්)තුමාණන් තමා වෙත පැමිණියේ නම් තමන් ඔවුනට උදවු කරන බවත් සතුරන්ගෙන් ආරක්ෂාව ලබා දෙන බවත් සහතික වූහ. ඔවුනට ඉස්ලාම් සම්බන්ධ කරුණු ඉගෙන්වීම සඳහා ශ්‍රාවක මුස්අබ් බින් උමෙයිර් (රළි) තුමා ඔවුන් සමඟ මදීනාවට යවන ලදී. මින් අනතුරුව තම සමාජය විසින් තමා හට සහ තම මිතුරන් හට තාඩන පීඩන හා ව්‍යසනයන් නොකඩවා පැමිණි හේතුවෙන් දෙවියන් වූ අල්ලාහ් මක්කාව හැර දමා මදීනාව වෙත සංක්‍රමණය වන ලෙස ඔවුනට අණ කළේය.

මෙතුමාණන් හා ඔහුගේ මිතුරන් මදීනාව වෙත පැමිණි කල්හි මදීනා වාසීන් විසින් ඉතා උණුසුම් අයුරින් ඔවුන් සැවෝම පිලිගන්නා ලදී. ඉන් පසුව මදීනා නගරය නව ඉස්ලාමීය රාජ්‍යයේ අගනුවර ලෙසත් ඔහුගේ දේව දූත මෙහෙවරෙහි කේන්ද්‍රස්ථානය ලෙසත් පත් වුණි. ඒ අනුව එතුමාණන් එම මදීනා නගරය තම ස්ථිර වාසස්ථානයක් ලෙස අර ගනිමින් එහි වාසය කළ උදවියට අල්කුර්ආනය පාරායනය කර පෙන්වා ඉස්ලාමීය නීතිරීතීන් උගන්වමින් තම දිවි පෙවත ගත කරමින් සිටියේය.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ අලංකාරමත් ගුණාංග හා උසස් ගුණධර්ම එම මදීනා වාසීන් තුළ යම් බලපෑමක් ඇති කර තිබුණි. එමනිසා ඔවුන් තම ආත්මයට වඩා එතුමාණන් කෙරෙහි ඇලුම් කළෝය. එතුමාණන් සඳහා උදවු උපකාර කිරීම පිණිස ඔවුන් එකිනෙකා අතර තරඟ වැදුණහ. ඔවුන් එතුමාණන් වෙනුවෙන් ඉතා වටිනා මිල කළ නොහැකි දෑ වියදම් කළහ. සතුටු පිරි ඊමාන් හෙවත් දේව විශ්වාසය මත පදනම් වූ සමූහයක් තුළ එතුමාණන් ජීවත් වීමට ආරම්භ කළේය. එම සමූහය තුළ සෙනෙහස, ආදරය, සහෝදරත්වය යනාදී කරුණු වල සංඥාවන් හෙළිදරව් වුණි. මෙම ඉමහත් වූ ධර්මය යටතේ දිළින්දා හා පොහොසතා, උසස් හා පහත්,

කළු හා සුදු, අරාබි හා අරාබි නොවන සියල්ලන් එකහා සමාන අයුරින් සැලකෙන සමාජයක් බිහි වුණි. ඔවුනතර භේදයක සම්මතය වූයේ තක්වා හෙවත් දේව බිය භක්තිය පමණි.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මදීනාවට පැමිණ වාසය කර අවුරුද්දක කාලයක් ගත වූ පසු එතුමාණන් අතරත් තම දේව දූත මෙහෙවර ඉදිරිපත් කිරීමේදී විරුද්ධ වූ මක්කාවාසීන් අතරත් සුළු පහරදීම් ආරම්භ වුණි. ඉස්ලාමයට හා ආයුධ බලය මෙන්ම හමුදා බලයෙන් ශක්තිමත් වූ ඉස්ලාමයට එරෙහි බලවේග අතර ප්‍රථම යුද්ධය හට ගැනුණේ ඉන් අනතුරුවයි. එය බද්ර් යුද්ධය ලෙස නම් කෙරිණි.

මෙම සටනෙහිදී මුස්ලිම් භට පිරිස් සංඛ්‍යාව හුදෙක් 314 ක් වූ අතර අල්ලාහ්ව ප්‍රතික්ෂේප කළ අය සතුව තිබූ භට පිරිස් සංඛ්‍යාව 1000 කි. මෙම සටනෙහි උත්තරීතර අල්ලාහ් තම ධර්ම දූතයාණන්ටත් ඔහුගේ මිත්‍ර කණ්ඩායමටත් ඉමහත් වූ ජයග්‍රහණයක් අත්පත් කර දී ඔවුන්ව ස්ථාවර කළේය.

මින් අනතුරුව මුස්ලිම්වරුන් අතරත් කාෆිර් වරුන් හෙවත් ප්‍රතික්ෂේපකයින් අතරත් නොයෙකුත් සටන් ඇති විය. මදීනාවට පැමිණ වාසය කර අවුරුදු අටක් ගත වීමත් සමග දහදාහකින් සමන්විත විශාල සේනාවක් එක්රැස් කිරීමට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්හට හැකි විය. එම සේනාවත් සමග මක්කාවෙහි ජය අත්පත් කර ගත් අතර එතුමාණන්ටත් එතුමාණන්ගේ මිත්‍ර කණ්ඩායමටත් නොයෙකුත් තාඩන පීඩන හා වේදනාවන් දුන් අවසානයේ සිය වාසස්ථානය සැප සම්පත් හා ඥාතීන් පවා අත් හැර දමා සංක්‍රමණය වීමට පාදක වූ විරුද්ධවාදීන් පරාජය කර ඉමහත් ජයග්‍රහණයක් ස්ථාපිත කිරීමට හැකි විය. මෙකී අවුරුද්දට ජයග්‍රාහී අවුරුද්ද යනුවෙන් නම් කරන ලදී. මේ පිළිබඳ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ:

අල්ලාහ්ගේ (උපකාරය) ජයග්‍රහණය පැමිණෙන විට ද, අල්ලාහ්ගේ ධර්මයෙහි ජනතාව සමූහ වශයෙන් ඇතුළු වීම ඔබ දකින විට ද, ඔබේ දෙවියන්ගේ ප්‍රශංසාව තුළින් සුවිශුද්ධ කරන්න. ඔහුගෙන් ක්ෂමාව අයැදින්න. ඔහු ක්ෂමාව පිළිගන්නෙකු වේ.(ශුද්ධ වූ අල්කුර්ආනය 110:01-03)

ඉන් අනතුරුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මක්කාවාසී සියලු දෙනා එක්රැස් කොට ඔබලාට මා කුමක් සිදු කරන්නට යන්නේද පිළිබඳ ඔබලා දැනුවත් ද? එහි රැස් වී සිටි ජනයින් ඔබ නියත වශයෙන්ම යහපත් දෑම සිදු කරන්නෙහිය. මන්දයත් ඔබ උතුම් වූ ශ්‍රේෂ්ඨ වූ සහෝදරයෙකු වන අතර තවද ශ්‍රේෂ්ඨ වූ එක් සහෝදරයෙකුගේ පුත්‍රයාණන් වේ යනුවෙන් ඔවුන් සියලු දෙනා ප්‍රකාශ කර සිටියහ. ඉන් පසු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔවුනට කරුණාව දැක් වූ හේතුවෙන් ඔවුනට සමාව ලබා දී ඔබ සියල්ලන් මෙතැනින් විසිර යන මෙන් පවසා සිටියේය. (මූලාශ්‍රයඃ බයිහකී)

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මෙම කාරුණික හැසිරීම මක්කාවෙහි වාසය කළ බොහෝ දනන් ඉස්ලාමය කරා පැමිණීමට පාදක විය. ඉන්පසු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මදීනාව වෙත ගමන් කළේය. ස්වල්ප කලකට පසු හජ් කර්තව්‍ය ඉටු කිරීම සඳහා නැවත මක්කාව වෙත පැමිණි කල්හි එතුමාණන් සමඟ සගයින් 1,14,000 ක් පමණ එම යාත්‍රාවට එක් ව සිටියහ. මෙම හජ් කර්තව්‍ය හජ්ජතුල් වදා නම් සමුගැනීමේ හජ් කර්තව්‍ය යනුවෙන් හඳුන්වනු ලබයි. මන්දයත් උතුම්, ශ්‍රේෂ්ඨ පුද්ගලයා වූ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ වියෝවය ළඟා වූ හේතුවෙන් එය මුස්ලිම්වරුන් සඳහා එක් සමුගැනීමක් මෙන් තිබුණි. හිජ්රී 10 (එනම් ක්‍රි.වඃ 521) වන වසරේ දුල්හජ් මාසයේ නබිතුමා ඉටු කළ එකම හා අවසානම හජ් වන්දනාවේ දී එහි පැමිණ සිටි බැතිමතුන්හට කළ දේශනය පහත සඳහන් වේ.

මාගේ ජනයිනි! ඉතා සාවදානව මට කන් දෙන්න. එය මෙම වසරෙන් පසු කිසිදා මම ඔබ අතර වෙම්දැයි මා නොදන්නා බැවිනි. එබැවින් මා කියන දෙයට ඉතා හොඳින් කන් යොමු කර, අද දින මෙහි පැමිණීමට නොහැකි වුවන් අතරට ද මාගේ මෙම පණිවිඩය ගෙන යන්න.

ජනයිනි! ඔබ මෙම (දුල්හජ්) මාසයත් (අරෆා) දිනයත් මෙම (මක්කා) නගරයත් කොතරම් ශුද්ධත්වයෙන් සලකන්නේ ද එසේම සෑම මුස්ලිම්වරයෙකුගේම ජීවිතයත්, ධනයත්, ආත්මගරුත්වයත් ශුද්ධත්වයෙන් සලකන්න. ඔබේ භාරයේ කිසිවකුට අයත් යම් දෙයක්

වේ නම් එය නියම අයිතිකරුටම නැවත භාරදෙන්න. එහි කිසිවිටෙකත් වංචාවක් සිදු නොකරන්න. එසේම කිසිවෙකුට හිංසා නොකරන්න. එවිට කිසිවකු ඔබට හිංසා නොකරනු ඇත. සත්‍ය වශයෙන්ම ඔබගේ ස්වාමියාණන් (දෙවියන්) හමුවන බවත්, ඔහු සැබැවින්ම ඔබගේ ක්‍රියාවන් ගැන විමසන බවත්, හොඳින් මතක තබා ගන්න. පොලී ලබා ගැනීම අල්ලා තහනම් කර ඇත. එබැවින් පොලිය හා සම්බන්ධ (එනම් පොලී ලබාගැනීම, ලබාදීම) එයට උදව් කිරීම, සාක්ෂිකරුවකු වීම) යන සියලු බැඳීම් මින් මතු අත්හල යුතුයි.

ඔබේ ආගම හා ඔබේ ආරක්ෂාව උදෙසා ෂෙයිතාන් ගෙන් ප්‍රවේශම් වන්න. විශාල දේවලින් ඔබ නොමග යැවිය හැකිය යන විශ්වාසය ඔහු (සාතාන්) කෙරෙන් සම්පූර්ණයෙන්ම බිඳී ගොස් ඇත. එබැවින් ඔබලා සුළු යැයි සිතන කාරණයන් තුළින් ඔහුව අනුගමනය කිරීමෙන් ප්‍රවේශම් වන්න.

ජනයිනි! ඔබගේ ස්ත්‍රීන් සම්බන්ධයෙන් ඔබට යම් යම් අයිතීන් ඇති බව සැබෑය. ඔබගේ අයිතීන් සම්බන්ධයෙන් ඔවුන් ඔබට කීකරුවෙත් ඔබ විසින් ආදරයෙන් කවා, පොවා, වස්ත්‍ර සැපයීමේ අයිතිය ඔවුනට හිමි වේ. ඔබ ඔබේ ස්ත්‍රීන්ට හොඳින් සලකන්න. ඔවුනට කරුණාවන්ත වන්න. ඔවුන් ඔබගේ සහකාරියන් හා පක්ෂපාති උදව්කරුවන් වේ. ස්ත්‍රීන්ට ද තම ස්වාමියා සම්බන්ධයෙන් යම් වගකීම් ඇත. එනම් තම දරුවන් රැකබලා ගැනීමත්, තම ස්වාමියා විසින් අනුමත නොකරන අය සමග ඔවුන් සම්බන්ධකම් ඇති නොකර සිටීමත්, එසේම ඔවුන් කිසිකලෙකත් දුරාචාරයෙහි නොයෙදී තම ගෞරවය ආරක්ෂා කරගැනීමත් ඔවුන්ගේ වගකීම වේ.

ජනයිනි! ඉතා සාවදානව මට ඇහුම්කන් දෙන්න. අල්ලාහ්ට පමණක් නමදින්න. දිනපතා පස්වේල සලාතය ඉටු කරන්න. රමළාන් මාසයේ උපවාසයෙහි යෙදෙන්න. ඔබගේ ධනයෙන් සකාත් (මුස්ලිම්වරුන් විසින් දුප්පතුන්ට දෙන අනිවාර්ය බද්ධ) ලබා දෙන්න. වත්කම් ඇත්නම් හජ් වන්දනාවේ යෙදෙන්න. එක් මුස්ලිම්වරයෙකු තවත් මුස්ලිම්වරයෙකුගේ සහෝදරයෙකු බව නුඹලා දන්නෙහිය. ඔබ සියලු දෙනා (ජාතියෙන්, භාෂාවෙන් කිසිවෙක් කිසිවකුට උසස් නොවන සමානයෝ වෙති. එනමුත් ඔබලාගේ දේව භක්තිය හා සත්ක්‍රියාවන් හේතු කොටගෙන

නුඹලාගෙන් එක් අයෙකු තවත් අයෙකුට වඩා උසස් වන්නේය.

මතක තබා ගන්න! යම් දිනක ඔබගේ ස්වාමියා (අල්ලාහ්) ඉදිරියේ පෙනී සිට ඔබගේ (මෙලොව) ක්‍රියාවන් සම්බන්ධයෙන් පිළිතුරුදීමට සිදුවනු ඇත. ජනයිනි! මගෙන් පසු නබිවරයෙක් (වක්තෘවරයෙක්) පැමිණෙන්නේ නැත. එසේම අලුත් ධර්මයන් බිහි නොවනු ඇත. එබැවින් ප්‍රවේශම් වන්න. මාගේ වියෝවෙන් පසු කිසි කලෙකවත් සත්‍යයේ මාර්ගයෙන් ඈත් නොවන්න. ඒ සඳහා මා ඔබට පවසන වචන හොඳින් තේරුම් ගෙන බුද්ධිමත්ව සිතට ගන්න. මාගේ ජනයිනි! මා කරුණු දෙකක් නුඹලා හමුවේ තබා යමි. ඒ අල්කුර්ආනය (දේව වාක්‍ය අඩංගු ශුද්ධ වූ ලියවිල්ල) හා සුන්නාහ්ව - මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වචනයෙන්, ක්‍රියාවෙන් හා අනුමත කිරීම් තුළින් පෙන් වූ ආදර්ශනයන් - වේ. ඔබලා මේ දෙක පිළිපදිනතාක් කිසිවිටෙකත් නොමග නොයනු ඇත.

මාගේ ජනයිනි! මාගේ මෙම වදන් සවන් දෙන ඔබ මෙයට සවන් නොදුන් අයට ද දන්වා සිටින්න. එය සවන් දෙන අය තවත් අයට ද දන්වත්වා. මන්ද මෙම වදන් සෘජුවම සවන් දෙන අයට වඩා පසුව එන අය හොඳින් අවබෝධ කරගනු ඇත.

යා අල්ලාහ්! (මාගේ දෙවියනි) ඔබගේ පණිවිඩය මෙම ජනතාවට දැනුම් දුන් බවට ඔබම සාක්ෂිකරුවකු වන්න. (මූලාශ්‍ර: බුහාරි,මුස්ලිම්, අහ්මද්)

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් හිජ්රි එකළොස් වෙනි වර්ෂයෙහි (ක්‍රි.ව. 632) රබීඋල් අව්වල් මස දොළොස් වන දින අඟහරුවාදා මදීනාවෙහි මෙලොවෙන් සමුගත්තේය. පසුව එහිදීම එතුමාණන්ගේ උතුම් දේහය භූමිදානය කෙරුණි. එතුමාණන්ගේ වියෝවය ගැන දැනගත් විට මුස්ලිම්වරු කම්පාවට පත් වූ අතර ඇතැම් අනුගාමිකයෝ එය විශ්වාස නොකළහ. අනතුරුව අබූ බක්ර් (රළියල්ලාහු අන්හු) තුමාණන් ජාතිය අමතා පහත සඳහන් අල්කුර්ආන් වැකිය පාරායනා කර කරුණු පැහැදිලි කළේය.

මුහම්මද් දූතයෙක් මිස නැත. ඔහුට පෙර නොයෙක් දූතවරු පවා උකුත් වූහ. ඔහු මරණයට පත් වූයේ නම් හෝ ඝාතනය කරනු ලැබුවේ නම් හෝ නුඹලා පැමිණි මාර්ගයේ ම නුඹලා ආපසු හැරී යන්නෙහු ද?

යමෙක් පැමිණි මාර්ගයේ ම ආපසු හැරී යන්නේ ද ඔහු විසින් අල්ලාහ්ට කිසිඳු විපතක් සිදු කළ නොහැකිය. අල්ලාහ් කෘතඥ වන්නන්ට කුලිය පිරිනමනු ඇත.(ශුද්ධ වූ අල්කුර්ආන් 03:144)

මෙම වාක්‍යය වෙත සවන් දුන් කම්පාවට පත් උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් නොසැලී සිටින්නට වූහ. මන්දයත් එතුමාණෝ අල්කුර්ආනයට මහත් අයුරින් ගරු කරන්නෙකු හා එයට මුළුමණින්ම යටහත් වන්නෙකු ලෙස සිටියහ.


නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙලොවෙන් සමු ගත් අවස්ථාවේදී එතුමාණන්ගේ වයස අවරුදු හැටතුනකි. මක්කාවෙහි ධර්මදූත මෙහෙවර ලැබීමට පෙර අවරුදු 40 ක් වාසය කළ අතර එම මෙහෙවරට පසු අවුරුදු 13 ක් එහි වැඩ වාසය කර ඇරයුම් කටයුතු වල නිරත වූහ. ඉන්පසු මදීනාවට සංක්‍රමණය වී අවුරුදු 10 ක් එහි වාසය කළහ. නොකඩවා අවුරුදු 23 ක් ශුද්ධ වූ අල්කුර්ආනය අවශ්‍යතාවන්ට අනුකූලව පහළ වූ අතර එමඟින් ඉස්ලාම් දහම සර්ව සම්පූර්ණ විය.

මහාචාර්ය ජී ලිබෝන් මහතා අරාබි ශිෂ්ඨාචාරය නැමැති සිය කෘතියෙහි මෙසේ සඳහන් කරයි: මිනිසුන්ගේ වටිනාකම ඔවුන් සිදු කළ මහඟු කාර්‍යයන් වලින් මනිනු ලැබුවේ නම්, මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා වනු ඇත. බටහිර විද්වතුන් මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පිළිබඳ ප්‍රකාශ නිකුත් කිරීමේදී බොහෝ ඉතිසාඥයින් විසින් මධ්‍යස්ත පිළිවෙතක් අනුගමනය කළ නමුත් දුකට කරුණක් නම්, ආගම්වාදය හෙවත් උමතුව මගින් ඔවුන්ගේ දෑස් ආවරණය වී තිබීමයි.

# නබි (ﷺ) තුමාණන්ගේ හැඩරුව

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් (පිට සහ පපුව පළල් වූ හේතුවෙන්) උරහිස දෙක අතර වැඩි ඉඩ සහිත කෙනෙකි. එතුමාණන්ගේ හිසකෙස් කන්පෙති ස්පර්ෂ වන තරමට දීර්ඝව තිබුණි. ඒවා අධික රෝද රැලි සහිත කෙස් නොවුනු අතර සම්පූර්ණයෙන්ම ඍජු ලෙස පිහිටි කෙස්ද නොවීය. සමහර අවස්ථාවන්වලදී එතුමා හිසකෙස් මැදින් වෙන් කර පීරා ගැනීමට පුරුදුව සිටියහ. ඉතාමත් මණහර මුහුණක් සහිත කඩවසම් පෙණුමකින් යුක්තව සිටියහ. එතුමාණන් කැපී පෙණෙන තරමට උසින් හෝ කොටින් වැඩි නොවුහ. එතුමාණන්ගේ වර්ණය වඩා සුදු හෝ කළු නොව රතු (සුදු) පැහැති සමින් යුක්ත විය. එතුමාණන්ගේ ශරීරයේ හටගත් දහඩිය මුතු මෙන් දිලිසෙනු ඇත. එතුමාගේ යටි රැවුල කෙස්ගස් රාශියකින් යුක්ත විය.

ජාබිර් (රළි) තුමාගෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ මුහුණ අසිපතක් මෙන් (දිග මුහුණක්) තිබුණාදැ? යි කෙනෙක් විමසු විට,"එතුමාණන් මුහුණ පිරුණු පුන් සඳ මෙන් තිබුණි" යනුවෙන් පිළිතුරු දෙන ලදී. එතුමාණන්ගේ ඇහි බැම් දිගු හා ඝනකමින් යුත්ත විය. ශක්තිමත් අත් හා පාදයන් එතුමාට තිබුණි. අධික තරබාරුකම හෝ අධික කෙට්ටු බවක් එතුමාණන් තුළ දක්නට නොලැබිණි. එතුමාණන්ගේ අත්ල ඉතා සිනිඳුය. ඒ පිළිබඳ අනස් (රළි) තුමාණන් මෙසේ සඳහන් කරයි: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ අතට වඩා සුමුදු සේද රෙද්දක් මා ස්පර්ශ කර නැත. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ සිරුරෙන් නිකුත් වන සුගන්ධය මෙන් කිසිවක් මා ආඝ්‍රාණය කර නැත.(මූලාශ්‍රය බුහාරි සහ මුස්ලිම්)



# නබි (ﷺ)තුමාණන්ගේ චරිත ස්වභාවය

## 01 තීක්ෂන බුද්ධිය:

ලෝකයේ එදා මෙදා තුරු කිසිවෙකුට නොලැබූ ඥානයක් හා තීක්ෂණ බුද්ධියක් නබි(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සතුව තිබිණි. ඒ පිළිබඳ විශාරද ඉයාල් (රහ්) තුමා මෙසේ සඳහන් කරයි.

එතුමාගේ සංෂිප්ත සටහන්, අර්ථවත්භාවය, සාරධර්ම සහ සම්ප්‍රදායන්, එතුමාගේ යහපත් පුරුදු ,ආචාර ධර්ම හා සදාචාර චරිතය, තෝරාහ්ව සහ ඉන්ජීල් වැනි සුවිශේෂී අනෙකුත් දිව්‍ය ලියවිලි පිළිබඳ එතුමාගේ දැනුම, ප්‍රඥාවන්තයන්ගේ ප්‍රකාශ පිළිබඳ සහ අතීත සමූහයන් පිළිබඳ එතුමාගේ දැනුම, උපමා ඉදිරිපත් කොට යමක් පැහැදිලි කිරීමේ හැකියාව, ප්‍රතිපත්තීන් අනුගමනය කිරීම, චිත්තවේගාත්මක හැසිරීම් නිවැරදි කිරීම වස් එතුමා සතුව තිබූ හැකියාව යනාදී කරුණු තුළින්ද දේශපාලන, නීති ප්‍රතිසංස්කරණය, ව්‍යාකරණ, වෛද්‍ය, ගිණුම්කරණය, ඉතිහාසය වැනි විවිධ ශේස්ත්‍රයන්ට අදාල විශාරදයින් එතුමාගේ වාචික ප්‍රකාශ මඟින් උපුටා ගත් ආදර්ශයන් ඇතුළත් එතුමාගේ රාජකාරී කටයුතු පිළිබඳ කියවා එතුමාගේ චරිත පාදනය කෙසේ වීද යන්න හොඳහැටි අවබෝධ කර තිබීම තුළින්ද එතුමාණන්ගේ තීක්ෂන බුද්ධිය හා බුද්ධි ගෝචරය කෙබඳදු යන්න කෙනෙකුට වටහා ගත හැකි වේ.

මෙවන් වූ ගති ලක්ෂණ වලින් එතුමාණන් පිරිපුන් වූවද, එතුමාණන් උගතුන් වෙත ගොස් ශිල්පය හදාරා හෝ අතීත සමූහයන්ගේ ලියකියවිලි කියවා හෝ ඒවා පිළිබඳ අවබෝධය ලබා ගත්තේ නැත. එයින් ඔබ්බට එතුමාණන් ලියන්නට හා කියවන්නට තරම් අකුරු ශාස්ත්‍රය දැන සිටි කෙනෙකු ද නොවූහ. "උම්මි" නම් සාක්ෂර නොවූ වක්තෘවරයාණන් යනුවෙන් එතුමාණන් හඳුන්වනු ලැබීය. උත්තරීතර අල්ලාහ් එතුමාණන්ගේ සිත ඉස්ලාම ධර්මය තුළින් විවර කර සමස්ත

ඥානය එතුමාණන් කෙරෙහි පිරිනමා ඒවා සියල්ල කියවා පෙන්වන තෙක් කිසිවක් පිළිබඳ පූර්ණ අවබෝධයක් එතුමාණන් තුළ නොතිබිණි.

එතුමාණන්ගේ බුද්ධි මට්ටමට අනුව එතුමාණන් වෙත දන්වන ලද අල්ලාහ්ගේ ඉමහත් වූ හැකියාවන් සමඟ සම්බන්ධ අතීතකාල හා අනාගතකාල කාරණාවන් පිළිබඳ දැනුම වනාහි වෙනත් කාරණාවන් පිළිබඳ එතුමාණන් සතු වූ දැනුමත් සමඟම ඒකරාශි වී තිබුණු බව නිරීක්ෂණය කර බැලීමේදී තේරුම් ගත හැක.

## 02 අල්ලාහ්ගෙන් වේතනය අපේක්ෂා කිරීම:

වේතනය අපේක්ෂා කරන දනන් අතුරින් ප්‍රමුඛයා ලෙස එතුමාණන්ව නම් කළ හැකි තරම් තම දේව දූත මෙහෙවර ඉටු කිරීමෙහිලා නොයෙකුත් අන්දමින් පැමිණි කරදර හා තාඩන පීඩන ඉදිරියේ ඉවසීමෙන් යුතුව කටයුතු කළහ. මෙබඳු ඉවසීම පිටුපස තිබූ රහස නම් උත්තරීතර අල්ලාහ්ගේ අමිල වේතනය හා ඉමහත් තෘප්තිය ළඟා කර ගැනීමේ අපේක්ෂාව මිස අන් කිසිවක් නොවේ. එතුමාණන් සතු වූ වේතනය අපේක්ෂා කිරීමේ ගුණාංගය විදහා පෙන්වන සිදුවීම් කිහිපයක් පහත දැක් වේ.

අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළියල්ලාහු අන්හු) තුමාණන් වරක් මෙසේ ප්‍රකාශ කළේය:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සිය මුහුණින් ගැලූ රුධිරය පිස දමමින්, අල්ලාහ්ගේ වක්තෘවරුන් අතුරින් එක් වක්තෘවරයෙකුට ඔහුගේ ජන සමූහය පහර දුන් ආකාරය මෙනෙහි කරමින් අහෝ දෙවිඳුනි! මාගේ සමූහය කෙරෙහි ඔබ සමාව ලබා දෙනු මැනව! මන්දයත් ඔවුන් නොදැනුවත්කමින් පසුවන්නෝ වෙති යනුවෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඒදින පැවසූ එකී අවස්ථාව මාගේ දෑස් ඉදිරියේ තවමත් මැවී පෙනෙනු ඇත. (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

එක් සටනක දී නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ එක් ඇඟිල්ලක් තුවාල විය. එවිට එම ඇඟිල්ල දෙස බලමින් නුඹ තුවාල වූ හුදෙක් එක් ඇඟිල්ලක් පමණි. දෙවිඳුන්ගේ මාර්ගයෙන් මා කිසිවක් මුහුණපා නැත යනුවෙන් ප්‍රකාශ කර සිටි බව ජුන්දුබ් ඉබ්නු

සුෆ්යාන් (රළියල්ලාහු අන්හු) තුමාණන් වාර්තා කරයි.(මූලාශ්‍රය:බුහාරි හා මුස්ලිම්)

## 03 චිත්ත පාරිශුද්ධිය හා අවංකභාවය:

අල්ලාහ්ගේ ආඥාවට අනුකූලව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔහුගේ සෑම විෂයක්ම චිත්ත පාරිශුද්ධිය ඇතිව අවංකභාවයෙන් සිදු කළ බව නොරහසකි. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ පහත අයුරින් නියෝග කරයි: නියත වශයෙන්ම මාගේ සලාතය: නැමදුම (මාගේ පුද පූජාවන්, මාගේ ජීවිතය හා මාගේ මරණය විශ්වයාධිපති වූ අල්ලාහ්ටම යැයි (නබි මුහම්මද්) පවසනු. (අල්කුර්ආන් 06:162)

## 04 සදාචාරය ,ආචාර ධර්මය සහ ඇසුර:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා සියලු මනුෂ්‍යයන් වෙත ජීවමාන ආදර්ශයක් විය. ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමියගෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගේ සදාචාරය කෙසේ වීදැයි විමසන ලදී. එවිට එතුමිය එතුමාගේ සදාචාරය ශුද්ධ වූ අල්කුර්ආනය වියැයි පිළිතුරු දුන්නාය.

එයින් අදහස් වන්නේ එතුමාණන් එම අල්කුර්ආනය තුළින් නියෝග කරන ලද දෑ අනුව කටයුතු කරමින් එහි සඳහන් කරන ලද යහපත් ක්‍රියාවන් තුළින් සිය ජීවිතය අලංකාරමත් කර ගත් බව හා ඒ තුළින් තහනම් නියෝග පනවන ලද බාහිර හා අභ්‍යන්තර දැයින් වැළකී සිටි බවයි.

"යහපත් සදාචාරයන් හා ක්‍රියාවන් සම්පූර්ණ කිරීම පිණිස දෙවියන් විසින් මා එවන ලදී" යනුවෙන් වරක් එතුමාණන් ප්‍රකාශ කළේය. (මූලාශ්‍රය: අදබුල් මුෆ්රද් හා අහ්මද්)

උත්තරීතර අල්ලාහ් එතුමාණන් පිළිබඳ ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

"නියත වශයෙන්ම ඔබ ශ්‍රේෂ්ඨ යහපත් ක්‍රියාවන්ගෙන් යුක්තව සිටින්නෙහිය"(අල්කුර්ආන් 68:04)

එතුමා පදිංචිව සිටින විටත් ගමනක නිරතව සිටින විටත් අවුරුදු දහයක අඛණ්ඩ සේවයක නිරතව සිටි එතුමාගේ සේවකයකු වූ අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ විස්තර කරයි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ලෝ වාසි සමස්ත ජනතාව අතුරින් යහපත් ගතිපැවතුම් සහිත අති ශ්‍රේෂ්ඨ පුද්ගලයකු වූහ. (මූලාශ්‍රය: බුහාරි හා මුස්ලිම්)

තව දුරටත් ඔහු මෙසේ විස්තර කරයි: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කිසිදු දවසක හෝ දොස් පවරන කෙනෙකු නොවූ අතර අසභ්‍ය ලෙස කථා කරන තවද ශාප කරන පුද්ගලයෙකු ද නොවීය. ඔහු විසින් කිසියම් අයෙකුට තරවටු කිරීමේදී ඔහු සමග වූ වැරැද්ද කුමක් දැයි අසා දෝෂාරෝපනය කරනු ඇත.

## 05 ආචාර විදි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් හොඳ පුරුදු විදහා පෙන්වූ අතර, කුඩා දරුවන් ඇතුලුව සියල්ලන් කෙරෙහි කාරුණික විය. මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වරක් රැස්වීමක සිටයදී එතුමා වෙත පානය කිරීමට යමක් ගෙන එන ලදී. එතුමාණන් එය පානය කළහ. එවිට එතුමාගේ දකුණු දෙසින් කුඩා පිරිමි ළමයෙක් සිටි අතර වම් දෙසින් මහලු වැඩිහිටියන් විය. එම වැඩිහිටියන්ගේ ගෞරවය සලකා බලා දරුවාගේ හැඟීම්වලටද හානියක් නොවෙන අයුරින් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මා එම වැඩිහිටියන්ට පානය කරන්නට මෙය දෙන්නදැයි එම කුඩා දරුවාගෙන් විමසා සිටියහ. එවිට එම දරුවා අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ඔබෙන් ලැබුනු මෙකී කොටස අන් කිසිවෙකු සඳහා මා ලබා දීමට සූදානම් නැතැයි පැවසීය. එම කුඩා දරුවාගේ ඉල්ලීමට අනුව නබි(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ එම පානය ඔහුටම ලබා දුන්හ. (මූලාශ්‍රය:බුහාරි හා මුස්ලිම්)

## 06 සමගිය ඇති කිරීම සඳහා වූ ඇල්ම:

සමගිය ඇති කිරීමේ යම් තත්වයක් ඇති වූ විට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ඒ කෙරෙහි ඉක්මන් වනු ඇත. එකල්හි කුබා

ප්‍රදේශයේ විසූ ජනයින් යම් කාරණයක් සම්බන්ධයෙන් එකිනෙකා සමග මතභේද වී ආරවුලක නිරත වන බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට ආරංචි විය. එය දැනගත් විගස අප සැම තත්ත්වය සමථයකට පත් කර ඔවුනතර සාමය ඇති කරමු යැයි පවසා එතුමාණන් ඒ වෙත දිව ගියේය. (මූලාශ්‍රය:බුහාරි)

## 07 යහපත අවධාරණය කර අයහපත වළකාලීම:

ඉස්ලාම්හි යම් මූලධර්මයකට විරුද්ධ වූ ක්‍රියාකලාපයක් දුටු විගස නිසි අයුරින් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එය හෙළා දකිනු ඇත. ඒ හා සම්බන්ධ සිද්ධියක් අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් (රළි) තුමාණන් මෙසේ විස්තර කරයි:

අල්ලාහ්ගේ දූතයාණන් වරක් රන් ආභරණ පැළඳ සිටි මිනිසෙකු දුටුවේය. ඔහු වෙත ගොස් එම රණ් ආභරණය ඔහුගෙන් ඉවත් කර විසි කළේය. ඔබලාගෙන් අයෙකු නිරයේ දැවෙන අඟුරු ගෙන විත්, සිය දෑතහි පළඳින්නට කැමතිද? යි අසා තදින් අවවාද කළේය. එකී ස්ථානයෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් බැහැරව ගිය පසු එහි සිටි උදවිය එම ආභරණය ඇහිඳ ගෙන එයින් යම් ලාභයක් සොයා ගනු යනුවෙන් එම ආභරණය හිමි පුද්ගලයාට උපදෙස් දුන්හ. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විසි කළ යමක් කිසිදා මම නොගනිමි යනුවෙන් ඔහු පවසා සිටියේය. (මූලාශ්‍රය:මුස්ලිම්)

## 08 පවිත්‍රත්වය:

ඒ පිළිබඳ දන්වන සිදුවීමක් මෙලෙසින් මුහාජිර් ඉබ්නු කුන්ෆුද් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් වාර්තා කරන ලදී:

වරක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මුත්‍රා කරමින් සිටියදී පුද්ගලයෙකු පැමිණ සලාම් පවසා සිටියේය. අර්ධ දෝවනය කර පිරිසිදු වන තෙක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඒ සඳහා ඔහුට පිළිතුරු ලබා නොදුන්හ. පසුව ඒ පිළිබඳ කණගාටුව ප්‍රකාශ කර මා අපිරිසිදුව සිටියදී අල්ලාහ්ගේ නාමය මෙනෙහි කිරීමට කැමති නැතැයි උපදෙස් දුන්හ. (සහීහ් අන් නසාඊ / ඉබ්නු හුසයිමා)

## 09 දිවි ආරක්ෂා කර ගැනීම:

අබ්දුල්ලාහ් බින් අවිෆ් (රළි) තුමාණන් මෙසේ වාර්තා කර ඇත: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අධික ලෙස අල්ලාහ්ව මෙනෙහි කරන්නෙකු ලෙසත්, අධික ලෙස අනවශ්‍ය කතාවල නිරත නොවන කෙනෙකු ලෙසත්, දේශනාවන් කරන විට එය කෙටියෙන් අවසන් කරන කෙනෙකු ලෙසත් සිටියහ. තවද එතුමාණන් දිළිඳු හා අසරණ අය වෙත ගොස් ඔවුන්ගේ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර දෙන පුද්ගලයකි. (මූලාශ්‍රය:අන්නසාඊ)

## 10 වන්දනාව:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ වන්දනාව කෙබඳුද යන්න ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය වරක් මෙසේ විස්තර කළාය:

රාත්‍රියේ සිටගත් අයුරින් අල්ලාහ්ට වන්දනාමාන කිරීම හේතුවෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ පාද ඉදිමී තිබෙනු දක්නට ලැබුණි. මේ පිළිබඳ සෝදිසියෙන් සිටි එතුමිය අහෝ නබි තුමණි! අල්ලාහ් ඔබගේ පෙර හා පසු අකුසල් සියල්ල සඳහා සමාව දී තිබියදීත් මේ අයුරින් වන්දනාමාන කළ යුත්තේ මන්දැයි විමසා සිටියාය. එවිට අල්ලාහ්ට කෘතවේදී සේවකයකු මෙන් කටයුතු කිරීමට මා කැමැත්තෙමි යනුවෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වදාලහ.(මුලාශ්‍රය:බුහාරි හා මුස්ලිම්)

## 11 මෘදුභාවය හා සෙනෙහස:

තවුසී ගෝත්‍රයට අයත් අස්සුබයිල් ඉබ්නු අම්ර් හා ඔහුගේ මිත්‍රවරුන් කිහිප දෙනෙක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! නියත වශයෙන්ම තවුසී ගෝත්‍රිකයන් ඔබ තුමාණන්ගේ ඇරයුම ප්‍රතික්ෂේප කොට අනිසි අයුරින් කටයුතු කරමින් සිටින හේතුවෙන් ඔවුනට ශාප කරන මෙන් ඉල්ලා සිටියෝය. ඒ වටා සිටි උදවිය තවුසී ගෝත්‍රිකයන්ට ශාප කළ නමුත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අහෝ දෙවිඳුනි! එම ගෝත්‍රයට යහමඟ පෙන්වා මෙම දහම වෙත ඔවුන්ව රැගෙන එනු මෙන් ප්‍රාර්ථනා කර සිටි බව අබූ හුරයිරා (රළි) තුමාණන් ප්‍රකාශ කළේය. (මූලාශ්‍රය:බුහාරි හා මුස්ලිම්)

## 12 අලංකාරමත් බාහිර පෙනුම:

බරා ඉබ්නු ආසිබ් (රළි) තුමාණන් මෙසේ දන්වයි."එතුමාණන් මධ්‍යම ප්‍රමාණව උසට සිටි අතර (පිට සහ පපුව පළල් වූ හේතුවෙන්) උරහිස දෙක අතර වැඩි ඉඩ සහිත කෙනෙකි. එතුමාගේ හිසකෙස් කන් පෙත්ත දක්වා දිගට තිබුණි. දිනක් එතුමාණන් රතු පැහැති ඇඳුමෙන් දුටුවෙමි. එයට වඩා ලස්සන ඇඳුමක් මා කිසි විටෙක දැක නැත. (මූලාශ්‍රය:බුහාරි)

## 13 ලෞකික සැප සම්පත් සම්බන්ධයෙන් මධ්‍යස්ථභාවය:

අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද් (රළි) තුමාණන් ඒ පිළිබඳ මෙසේ විස්තර කරයි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් රටඉඳි අතුවලින් වියන ලද පැදුරක නිදාගෙන නැගිට සිටියේය. එවිට එම අතුවල රේඛා සළකුණු එතුමාණන්ගේ පිට මත තිබෙන දුටු අප "අල්ලාහ්ගේ දූතයාණනි! ඔබට පුළුන් වලින් සාදන ලද පැදුරක් සකස් කර දෙන්නදැයි" විමසා සිටියෙමු. එවිට මා හා මෙම ලෞකික ජීවිතයත් අතර සම්බන්ධය කුමක් වීද? මෙලොවෙහි මාගේ ස්ථාවරය මගියෙකු මෙන්ය. එම මගියා තම විඩාව නිවාලීමට ගසක් පාමුල ස්වල්ප වේලාවක් නතර වී ඉන් අනතුරුව එම ගස අතහැර යනු ඇතැයි පැවසූහ. (මූලාශ්‍රය:තිර්මිදි)

අම්ර් ඉබ්නු හාරිස් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මියැදෙන අවස්ථාවේදී මිලමුදල්, රන් හා රිදී ආභරණ, වහල්ලුන් වැනි සැපසම්පත් අත්හැර ගියේ නැත. මියැදෙන අවස්ථාවේදී එතුමාණන් සතුව තිබුණේ සුදු කොටළුවකු හා යුධ ආයුධ ස්වල්පයක් පමණි. එතුමාණන් සතුව හයිබර් ප්‍රදේශයේ යම් ඉඩමක් තිබුණි. එයද බයිතුල් මාල් නම් රාජ්‍ය පොදු දේපල සඳහා ප්‍රධානය කර තිබුණි. (මූලාශ්‍රය:බුහාරි)

## 14 අන් අය කෙරෙහි දැක්වූ ප්‍රමුඛත්වය:

සහ්ල් ඉබ්නු සඅද් (රළියල්ලාහු අන්හු) තුමාණන් නබි තුමාණන්ගේ මෙම ගුණාංගය පිළිබඳ එක් සිදුවීමක් මෙසේ වාර්තා කරයි:

කාන්තාවක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත වියන ලද කබායක් ගෙන විත් නබි තුමනි! ඔබ පැළඳීම සඳහා මෙය මා මාගේ දෑතින්ම වියන ලද කබායකි යනුවෙන් පවසා එය එතුමාණන් වෙත පිරිනැමුවාය. පසුව නබි(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඉතා උනන්දුවෙන් එය ලබා ගෙන පසුව එය පැළඳ ගෙන අප වෙත පැමිණියේය. එවිට එහි සිටි පුද්ගලයෙකු අහෝ නබි තුමනි! එය මට ලබා දිය හැකිදැයි විමසා සිටියේය. එසේය මා එය ඔබට ලබා දෙමි යනුවෙන් පවසා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තමා ඇඳ සිටි කබාය ගලවා විමසා සිටි පුද්ගලයා වෙත පිරිනැමුවේය. රැස්ව සිටි ජනයින් ඔහුට දොස් පවරමින් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත කවරෙකු හෝ යමක් විමසුවේ නම් එසැනින් එය ලබා දෙන බව නුඹ නොදන්නෙහිදැ? යි ඇසුවෝය. නියත වශයෙන්ම එය මා ලබා ගත්තේ මා මිය යන විට මාගේ ශරීරය එම කබාය මඟින් ආවරණය කිරීම සඳහා මිස වෙන හේතුවක් මත නොවේ යැයි එය ලබා ගත් පුද්ගලයා පිළිතුරු දුන්නේය. එම පුද්ගලයා මිය ගිය පසු එම කබාය මඟින්ම ආවරණය කළ බව මෙම නබි වදන සඳහන් කළ සහ්ල් (රළි) තුමාණන් වාර්තා කරයි. (මූලාශ්‍රය: බුහාරි)

## 15 ශක්තිමත් දේව විශ්වාසය හා දෙවියන් මත යැපීම:

ඒ පිළිබඳ අබූ බක්ර් (රළි) තුමාණන් මෙසේ විස්තර කරයි:

මා හා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සවුර් ගුහාවෙහි සැඟවී සිටි අවස්ථාවෙහි, අප සොයා පැමිණි සතුරන්ගේ පාද අපට ඉතා සමීප වන බව දුටුවෙමි. එවිට මා අල්ලාහ්ගේ දූතයාණනි! සතුරන් අතුරින් කෙනෙකු පහත් වී සොයන්නේ නම් අපව දකිනු ඇතැයි පැවසුවෙමි. අහෝ අබූ බක්ර්! අප දෙදෙනාත් සමඟ තුන්වැන්නා වශයෙන් අල්ලාහ් සිටීම පිළිබඳ නුඹ කුමක් සිතන්නෙහිද යනුවෙන් ශක්තිමත් දේව විශ්වාසයෙන් යුතුව එතුමාණන් විමසා සිටියේය. (මූලාශ්‍ර:බුහාරි හා මුස්ලිම්)

## 16 කරුණාව හා දයානුකම්පාව:

මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ජනතාව කෙරෙහි කාරුණික වූ අතර, විශේෂයෙන් ළදරුවන් කෙරහි එතුමා දැක්වූ

කරුණාව හා ආදරය සම්බන්ධයෙන් සඳහන් වන පහත සඳහන් වාර්තාවෙහි මෙම ගුණාංගය ඉතා පැහැදිලි වේ.

අබූ කතාදා (රළි) තුමාණන් මෙසේ වාර්තා කර ඇත:

උමාමා යන නමින් හඳුන්වනු ලැබූ අබූ ආස් නැමැත්තාගේ කුඩා දියණියව උරහිස මත උසුලමින් අල්ලාහ්ගේ දූතයාණන් සලාතය මෙහෙයවීම පිණිස අප වෙත පැමිණියේය. පසුව සලාතය අතරතුර එතුමා නැමෙන විට ඇයව පහළින් තබා නැවත වරක් නැඟිට සිටින විට එතුමා ඇයව නැවත උසුලනු ඇත. (මූලාශ්‍ර: බුහාරි හා මුස්ලිම්)

## 17 සැහැල්ලුභාවය:

සලාතය දීර්ඝ ලෙස මෙහෙවිය යුතුයි යන චේතනාවෙන් මා සලාතය ආරම්භ කරමි. එවිට සලාතය සඳහා පැමිණ සිටි මව්වරුන්ගේ කුඩා දූදරුවන් හඬන ශබ්දය ඇසුනු විගස මා සලාතය කෙටියෙන් නිම කරමි. මන්දයත් දූදරුවන් හඬන ශබ්දය ඇසූ විට මව්වරුන්ගේ හදවත් කෙතරම් කලබලයට පත්වේද යන්න පිළිබඳ මා හොඳහැටි දැන සිටිමි යනුවෙන් නබි(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වරක් පවසා සිටි බව අනස් (රළි) තුමාණන් වාර්තා කරයි. (මූලාශ්‍රය: බුහාරි)

## 18 ධර්මිෂ්ඨකම:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වරක් වදාල බව අබූ හුරෙයිරා (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

ඇතැම් අවස්ථාවන්හිදී මා නිවසට පැමිණි විට නිදියහන මත රට ඉඳි වැනි පළතුරු දකිනු ඇත. මා එය අනුභව කිරීමට තැත් කළ නමුත් එය සකාත් හෙවත් අනිවාර්ය දුගී බද්ධ මාර්ගයන් පැමිණි බව මා බියට පත්වී එය අත්හැර දමන්නෙමි.[1](මූලාශ්‍ර:බුහාරි හා මුස්ලිම්)

## 19 අල්ලාහ්ගේ මාර්ගයෙන් වියදම් කිරීම:

ඒ පිළිබඳ අනස් (රළි) තුමාණන් මෙසේ විස්තර කරයි:

1 මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට හෝ එතුමාණන්ගේ පවුලේ උදවියට සකාත් පරිහරණය කිරීම අල්ලාහ් විසින් තහනම් කර ඇත.

ජනයා ඉස්ලාම් දහම වැළඳ ගැනීම පිණිස එතුමාණන් සතු සියල්ල වියදම් කරන්නෙකු වූහ. වරක් හුනයින් සටනට පසු මිනිසෙකු නබි(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණි අතර ඔහු සඳහා කඳු දෙකක් අතරමැදියක සිටිය හැකි ප්‍රමාණයක බැටළුවන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්‍රධානය කළේය. ඔහු තම සමූහය වෙත පැමිණ අහෝ මාගේ සමූහය! ඉස්ලාම් දහම වැළඳ ගනු. නියත වශයෙන්ම මුහම්මද් නම් මෙම වක්තෘවරයා දරිද්‍රතාවයට බිය නොවන තරම් ධානය පරිත්‍යාග කරනු ඇත යනුවෙන් ප්‍රකාශ කර සිටියේය. (මුලාශ්‍රය: මුස්ලිම්)

ඉබ්නු අබ්බාස් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

පොදුවේ නබිඳුන් ඉතා ත්‍යාගශීලී පුද්ගලයකු වූහ. රමළාන් මසෙහි දේවදූත ජිබ්‍රීල් (අලෙයිහිස් සලාම්) තුමාණන් බැහැ දකින කාලවකවානුව තුළ පුරුද්දට වඩා ඉමහත් ත්‍යාගශීලීයෙකු වූහ. නබිඳුන් ශුද්ධ වූ අල්කුර්ආනය සමාලෝචනය කිරීම පිණිස රමළාන් මසෙහි දේවදූත ජිබ්‍රීල් (අලෛ) තුමාණන් බැහැ දකිනු ඇති අතර එම මසෙහි හමන සුළඟට වඩා වේගයෙන් ත්‍යාගශීලි වීමට යුහුසුලු වූහ. (මුලාශ්‍රය:බුහාරි)

අබූ දර් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

මා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමග මදීනාවේ කඳු සහිත ප්‍රදේශයක ගමන් කරමින් සිටින අවස්ථාවේදී උහද් නැමැති කඳු ගැටය අපට හමුවුණි. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් උහද් නැමැති මෙම කඳු ගැටයේ ප්‍රමාණයට සමාන රන් ප්‍රමාණයක් මා සතු වේ නම්, රාත්‍රියක් හෝ රාත්‍රි තුනක් ඇතුළත දෙවියන් උදෙසා මා එය වියදම් කර දමමි. ණය බරින් පෙළෙන අය කෙරෙහි උපකාර කිරීම සඳහා මා රන් කැබැල්ලක් පමණක් තබා ගන්නෙමි යනුවෙන් පැවසීය. (මුලාශ්‍රය: බුහාරි)

ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් ඔහු සතු යම් දෙයක් කවරෙකු හෝ ඉල්ලා සිටින්නේ නම් එය පරිත්‍යාග කරනු ඇත. (මුලාශ්‍රය: බුහාරි)

## 20 සහයෝගිතාව:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් නිවසෙහි සිටියදී එතුමා කුමක් කරමින් සිටින්නේ දැයි වරක් ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමියගෙන් විමසන ලදී. එතුමාණන් නිවසෙහි වැඩකටයුතු සඳහා තම භාර්යාවන්ට සහයෝගය දකවයි. එනමුත් සලාතයේ වේලාව පැමිණි කල්හි ඒ වෙත යනු ඇත යනුවෙන් ප්‍රකාශ කළාය. (මූලාශ්‍රය:බුහාරි)

තවද බරා ඉබ්නු ආසිබ් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කරයි: හන්දක් නැමති සටනේදී (මදීනාව වටා ආරක්ෂක උපක්‍රමයක් ලෙස මුස්ලිම්වරුන් කපා තිබූ) අගල කපමින් සිටියදී මා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව දුටුවෙමි. එවිට එතුමාණන් සිය උදර ප්‍රදේශයේ තිබෙන කෙස් පසින් ආවරණය වන තරම් වෙහෙස වී පස් උසුලමින් සිටියේය. (මූලාශ්‍රය: බුහාරි)

## 21 සත්‍යතාවය:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තුළ වඩාත් කෝපය ඇති කරවන සුළු ගතිලක්ෂණයක් ඇත්නම් එය අසත්‍ය ප්‍රකාශ කිරීමයි. යම්කිසි මිනිසෙකු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත අසත්‍ය ප්‍රකාශ කරන්නේ නම් ඔහු ඒ පිළිබඳ පසුතැවිලි වන තෙක් ඔහු පිළිබඳ මතකය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තුළ තිබෙනු ඇත යනුවෙන් ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය දන්වයි. (මූලාශ්‍රය: අත්තිර්මිදි)

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ සතුරන් පවා එතුමාණන් සත්‍යවාදී බව තහවුරු කරයි. එතුමාණන් සමග ඉතා කුරිරු ලෙස සතුරුකම් පෑ එම අබූ ජහල් පවා දිනක් නබිඳුන් දෙස බලා මෙසේ පවසා සිටියේය. අහෝ මුහම්මද්! ඔබ මුසාබස් දොඩවන්නෙකු බව මා නොපවසමි. එසේ තිබියදීත් ඔබ දේව වැකි යනුවෙන් යමක් පවසා සිටින්නේ කුමක්ද එය හා ඒ වෙත ඔබ කරන ඇරයුම මා ප්‍රතික්ෂේප කරන බව ඔහු පවසා සිටියේය.

ඔහුගේ මෙම ස්ථාවරය අපහාසයට ලක් කරමින් ශුද්ධ වූ අල්කුර්ආනයේ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි:

(නබි මුහම්මද්! නුඹ බොරුකාරයකු යැයි) පවසන්නන් (ගේ වදන්) නියත වශයෙන්ම නුඹට දුක් දෙන්නක් බව අපි දනිමු. ඇත්තෙන්ම ඔවුන් නුඹව බොරු කාරයකු කරන්නේ නැත. එනමුත් අපරාධ කරන්නෝ අල්ලාහ්ගේ ආයාත් (අණපනත් - සංඥාවන්) බොරු යැයි කියමින් ඒවා ප්‍රතික්ෂේප කරන්නෝ වෙති. (ශුද්ධ වූ අල්කුර්ආන් 06:33)

## 22 අල්ලාහ් විසින් ඇති කරන ලද සීමාවන් ඉමහත් කොට සැලකීම:

ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය මෙසේ වාර්තා කර ඇත:

අකුසල් නොවන විෂයන් දෙකක් අතර තෝරාගැනීමේ නිදහස නබි(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත වී නම් එයින් ඉතා සැහැල්ලු විෂය එතුමාණන් තෝරා ගනු ඇත. ඒවා අකුසල් වී නම් එයින් එතුමාණන් ඉතා දුරස්ව කටයුතු කරයි. දෙවියන් වූ අල්ලාහ් මත දිවුරා පවසමි! කවරෙකු හෝ අල්ලාහ්ගේ විෂයෙහි අයුතු ලෙස කටයුතු කළේ නම් මිස හුදෙක් තමා හට සිදු වූ වරදක් වෙනුවෙන් කිසිදා අන් අයෙකුට ප්‍රතිහිංසා කර නැත. (මුලාශ්‍ර: බුහාරි හා මුස්ලිම්)

## 23 සෙනෙහෙබර හැඟීම් ප්‍රකාශනය:

අල්ලාහ්ගේ දූතයාණන් මෙන් සිනාහමුසු මිනිසෙකු මා කිසිදා දැක නැත යනුවෙන් අබ්දුල්ලාහ් බින් හාරිස් (රළියල්ලාහු අන්හු) තුමා ප්‍රකාශ කරයි. (මූලාශ්‍රය: අත්තිර්මිදි )

## 24 අවංකභාවය හා විශ්වාසවන්තභාවය:

මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ අවංකභාවය ඉතා ප්‍රකටය. එය කෙතරම්දයත් එතුමාණන් හට හා එතුමාණන් ධර්ම දූතයෙකු බව පිළිගත් එතුමාණන්ගේ සහායකයින් හට නොයෙකුත් අන්දමින් කරදර බාධාවන් මක්කාවෙහි ජීවත් වූ ජනයා විසින් සිදු කළද ඔවුන් යම් ගමනක නිරත වන්නේ නම් සිය වටිනා බඩුභාණ්ඩ යනාදිය සුරක්ෂා කිරීම වස් එතුමාණන් වෙත භාර දී යනු ඇත.

එතුමාණන්ගේ අවංකභාවයට තවත් උදාහරණයක් නම්: කුරයිෂ් ගෝත්‍රය නියෝජනය කරමින් සාම ගිවිසුමක් සඳහා පැමිණ සිටි සුහයිල්

බින් අම්ර් නැමැත්තා සමඟ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ගිවිසුමකට එළැඹීය. එනම්: දෙපිරිස අතර සාමය ස්ථාපිත කිරීම වස් මක්කාවෙහි ඉතිරිව සිටින මුස්ලිම්වරුන් අතුරින් කෙනෙකු හෝ මුස්ලිම්වරුන් සමඟ පිටවී නොයෑම, මුස්ලිම්වරයෙකු මෙයින් පිටි වී ගොස් නැවත මක්කාව වෙත පැමිණීමට කැමති නම් ඔහුව නොවැළැක්වීම, මුස්ලිම් හෝ මුස්ලිම් නොවන කවරෙකු හෝ මදීනාව වෙත පැමිණියේ නම් ඔහු මක්කාව වෙත නැවත හරවා යැවීම, නමුත් මුස්ලිම්වරුන් අතුරින් කවරෙකු හෝ මක්කාවට පැමිණියේ නම් ඔහු කිසිදා නැවත මදීනාවට හරවා යවනු නොලැබීම යනාදි අසාධාරණ කොන්දේසීන් මත ගිවිසුමකට එළඹීය. මෙම කොන්දේසි හේතුවෙන් මුස්ලිම්වරුන් තුළ දැඩි කෝපයක් ඇති වුණි. එසේ තිබියදීත් මෙය නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අනුමත කළේය.

ගිවිසුම අනුමත කරන අතරවාරයේදීම කුරයිෂි නියෝජිත සහ්ල් නැමැත්තාගේ පුත්‍රයා වන අබූ ජන්දල් (රළි) තුමාණන් සතුරන් විසින් ඔහුට දමා තිබූ දම්වැල් සමඟ මුස්ලිම්වරුන් අතරට පැමිණ එක් විය. එනමුත් අනුමත වූ ගිවිසුමට අනුව අබූ ජන්දල් (රළි) තුමාණන් නැවත වරක් කුරයිෂි නියෝජිත සහ්ල් වෙත භාර දෙන ලදී. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අබූ ජන්දල්! ඉවසිලිමත් වන්න, නියත වශයෙන්ම අල්ලාහ් ඔබට හා ඔබ වැනි පීඩා විඳින්නන් සඳහා ගැලවුම් මාර්ගයක් ලබා දෙනු ඇත. අප ඔවුන් සමඟ ගිවිසුමක් අත්සන් කර ඇත්තෙමු. අපි නිසැකවම ද්‍රෝහී ලෙස ක්‍රියා නොකරමු යනුවෙන් ඔහු වෙත කියා සිටියේය. (මූලාශ්‍රය: බුහාරි)

ඉන්පසු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මදීනාවට නැවත පැමිණියේය. දිනක් ඉස්ලාම් දහම වැළඳ ගනිමින් අබූ බසීර් (රළි) තුමාණන් මදීනාවට පලා ආවේය. ඔහුව සොයා මක්කාවෙන් දෙදෙනෙකු ආ කල ඔහුද ගිවිසුමට අනුව ඔවුන් සමඟ නැවත යවනු ලැබීය.

## 25 වීරත්වය සහ ධෛර්යය:

අලි (රළි) තුමාණන් මෙසේ පවසයි:

බද්ර් සටන හට ගත් දින, නබිඳුන් ඉමහත් වීරත්වයෙන් යුතුව සතුරන්ට

වඩාත් සමීපව සිටීහ. එදින එතුමාණන් විසින් අප සැමට ආරක්ෂාව සපයන ලදී.

යුධ වාතාවරණයක් නොමැති අවස්ථාවේදී එතුමාණන්ගේ වීරත්වය කෙසේ වීද යන්න පිළිබඳ අනස් (රළි) තුමාණන් පහත අයුරින් විස්තර කරයි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඉතා අලංකාරමත් හා ධෛර්ය සම්පන්න චරිතයකි. දිනක් රාත්‍රී කාලයේදී මදීනාවාසීන් එක්තරා ශබ්දයක් හේතුවෙන් බියට පත් වී සිය නිවස්වලින් පිටතට පැමිණ එම ශබ්දය නිකුත් වූ ස්ථානය වෙත ගමන් කරමින් සිටියෝය. එවිට නබිඳුන් තම අසිපත ගෙලෙහි එල්ලා අබූ තල්හා (රළි) තුමාණන්ට අයත් එක් අශ්වයෙකුගේ පිටෙහි අසුන් ගෙන ඔවුන් ඉදිරියට පැමිණ බිය නොවන්න! බිය නොවන්න! එම ශබ්දය කිසිවක් නොව මෙම අශ්වයාගේ ශබ්දය වේ යනුවෙන් පවසා කිසිදු කරදරයක් සිදු නොවුණු බව තහවුරු කළේය. (මූලාශ්‍රය: බුහාරි)

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඝන කළුවරින් යුතු රාත්‍රියක පවා කාරණය කුමක්ද යන්න පිළිබඳ සෙවීම සඳහා තමන් සමඟ කවරෙකු හෝ පැමිණිය යුතු බව බලාපොරොත්තු නොවී තනිවම ඒ ශබ්දය නිකුත් වූ ස්ථානය වෙත හඹා ගිය ධෛර්‍යය මෙයින් මනා පැහැදිලි වේ.

මේ අයුරින්ම, උහද් සටනේදී නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම මිතුරන් සමඟ සාකච්ඡාවක නිරත විය. එහිදී සටනක් සිදු කළ යුතු බව එම මිතුරන් අදහස් ප්‍රකාශ කර සිටියෝය. එනමුත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ අදහස එයට පටහැනි වූ යමක් වූවද එම අදහසට එතුමාණන් එකඟ වුණි. පසුව එතුමාණන්ගේ මිතුරන් විසින් ලබා දුන් අදහස එතුමාණන්ගේ අදහසට පටහැනි යමක් බව ඔවුන් දැනගත් කල්හි ඒ පිළිබඳ දුකට පත් වී අන්සාරිවරුන් වන මදීනාවාසීන් අප සැම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ තීරණය ප්‍රතික්ෂේප කළාදෝ! යනුවෙන් පවසමින් අල්ලාහ්ගේ දූතයාණනි! එසේ නම් ඔබේ ස්ථාවරය කුමක්දැයි විමසුවෝය. එවිට නබිඳුන්: නියත වශයෙන්ම කවරහෝ නබිවරයකු සටනක් සඳහා යුද සේනාවක් සූදානම් කළේ නම් එම සටන අවසන්

වන තුරු එය විසුරුවා හැරීමට අවසර නැත යනුවෙන් පවසා සිටියේය. (මූලාශ්‍රය: අහ්මද්)

## 26 නිර්ලෝභීකම හා උදාරත්වය:

ඉබ්නු අබ්බාස් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

රමළාන් මසෙහි දේව දූත ජිබ්රීල් (අලෙයිහිස් සලාම්) තුමා බැහැ දකින කාලවකවානුව තුළ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් (වියදම් කිරීම විෂයෙහි) ඉමහත් ත්‍යාගශීලි විය. නබිඳුන් ශුද්ධ වූ අල්කුර්ආනය සමාලෝචනය කිරීම පිණිස රමළාන් මසෙහි දේවදූත ජිබ්රීල් (අලෙයිහ්ස් සලාම්) තුමාණන් බැහැ දකිනු ඇති අතර එම මසෙහි හමන සුළඟට වඩා වේගයෙන් ත්‍යාගශීලි වීමට යුහුසුලු වූහ. (මූලාශ්‍රය: බුහාරි)

අබූ දර් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

මා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමඟ මදීනාවේ කඳු සහිත ප්‍රදේශයක ගමන් කරමින් සිටින අවස්ථාවේදී උහද් නැමැති කඳු ගැටය අපට හමුවුණි. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් උහද් නැමැති මෙම කඳු ගැටයේ ප්‍රමාණයට සමාන රන් ප්‍රමාණයක් මා සතු වේ නම්, රාත්‍රියක හෝ රාත්‍රි තුනක් ඇතුළත දෙවියන් උදෙසා මා එය වියදම් කර දමමි. ණය බරින් පෙළෙන අය කෙරෙහි උපකාර කිරීම සඳහා මා රන් කැබැල්ලක් පමණක් තබා ගනිමි යනුවෙන් පැවසීය.(මූලාශ්‍රය: බුහාරි)

ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගෙන් ඔහු සතු යම් දෙයක් කවරෙකු හෝ ඉල්ලා සිටින්නේ නම්, එය පිරිනමනු ඇත. (මූලාශ්‍රය: බුහාරි)

## 27 ලැජ්ජාව:

මෙය එතුමාණන්ගේ තවත් එක් උතුම් ගුණාංගයකි. අබූ සඊද් අල් හුද්රි (රළි) ඒ බව මෙසේ දන්වයි:

තිරයට පිටු පසින් සිටින කන්‍යාවියකට වඩා නබි (සල්ලල්ලාහු අලයිහි

වසල්ලම්) තුමාණන් අධික ලැජ්ජාවෙන් පසුවන කෙනෙකි. එනම් එතුමාණන් යමක් පිළිකුල් කළේ නම් එතුමාණන්ගේ මුහුණෙන් අපට එය දැක ගත හැකි වනු ඇත. (මූලාශ්‍රය: සහීහ් බුහාරි)

## 28 නිහතමානීකම:

අල්ලාහ්ගේ දූතයාණන් මිනිසුන් අතුරින් ඉතා නිහතමානීය. කෙතරම්දයත් නබි තුමාණන් අනුගාමිකයින් සමඟ වාඩි වී සිටියදී නාඳුනන කෙනෙකු සභාවට පිවිසේ නම්, ඔහුගේ සහායකයින්ගෙන් ඔහුව වෙන් කොට හඳුනාගත නොහැකිය. ඒ පිළිබඳ තවදුරටත් අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමාණන් මෙසේ පැහැදිලි කරයි :

දිනක් අප සැම නබි තුමාණන් සමඟ මස්ජිදය තුළ වාඩි වී සිටියෙමු. එවිට කෙනෙකු ඔටුවෙකු මත ගමන් කරමින් පැමිණ එයින් බැස එය ගැට ගසා එහි සිටි පුද්ගලයන්ගෙන් ඔබලාගෙන් මුහම්මද් යනු කවුරුන්ද යනුවෙන් විමසා සිටියේය. නබි තුමාණන් එවිට තම සහායකයින් අතර අසුන් ගෙන සිටියේය. මෙතැනින් අසුන් ගෙන සිටින මෙම සුදු පැහැති පුද්ගලයා වේ යනුවෙන් අප ඔහුට දන්වා සිටියෙමු. (මූලාශ්‍රය: මුස්ලිම්)

එමෙන්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එතුමාගේ නිහතමානිකම හේතුවෙන් දිළිඳු, අසරණ, අය වෙත ගොස් ඔවුන්ගේ අවශ්‍යතා සඳහා උපකාර කිරීමට පසුබට නොවූහ. මේ පිළිබඳ අනස් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි: මදීනාව සිට අසරණ ස්ත්‍රියක් නබි(සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාගේ ගරු සභාව වෙත පැමිණ, ඔබ මා හට යම් උදව්වක් කළ යුතු යැයි පවසා සිටියාය.එසේය, ඔබගේ අවශ්‍යතාවය තිබෙන්නේ මදීනාවෙහි කුමන ප්‍රදේශයෙහිද යනුවෙන් මා හට දන්වනු. මා ඒ වෙත ඔබ සමඟ පැමිණ එම අවශ්‍යතාවය සපුරා දෙන්නම් යනුවෙන් පවසා එම අසරණ කාන්තාවගේ අවශ්‍යතාවය සම්පූර්ණ වන තෙක් නබි තුමාණන් ඇයත් සමඟම රැඳී සිටියේය. (මූලාශ්‍රය: මුස්ලිම්)

## 29 කරුණාව හා දයාව:

අබූ මස්ඌද් අල් අන්සාරි (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි: නබි තුමාණන් වෙත කෙනෙකු පැමිණ ෆජ්ර් (අළුයම) සලාතය අධික ලෙස

දීර්ඝ කරමින් සලාතය මෙහෙයවන පුද්ගලයෙකු හේතුවෙන් මා එම සලාතය සඳහා ප්‍රමාද වී යනු ඇතැයි ප්‍රකාශ කළේය. නබි තුමාණන් එදින කෝපයට පත් ව දේශනාවේ නියලුනාක් මෙන් කිසිදිනක මා දැක නැතැයි අබූ මස්උෘද් (රළි) තුමාණන් ප්‍රකාශ කළේය. ඉන්පසුව, අහෝ ජනයිනි! නියතවශයෙන්ම මිනිසුන් අපහසුතාවයට පත්වන අන්දමින් කටයුතු කරන ඇතැමුන් ඔබලා අතර සිටිති. ඒ අනුව කවරෙකු හෝ ජනයින් සඳහා සලාතය මෙහෙය වන්නේ නම් එය කෙටියෙන් නිම කරනු. මන්දයත් සලාතය ඉටු කරන්නන් අතුරින් අවශ්‍යතා ඇත්තන්, අසරණයින්, රෝගීන් යනාදී උදවිය සිටිනු ඇත යනුවෙන් නබි(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අවවාද කළේය. (මූලාශ්‍ර: බුහාරි හා මුස්ලිම්)

තවද උසාමා ඉබ්නු සෙයිද් (රළි) තුමාණන් මෙසේ වාර්තා කර ඇත:

වරක් මරණාසන්නයේ සිටන සිය මුණුබුරන් බැලීමට එනු මෙන් එතුමාණන්ගේ දියණිය පණිවිඩයක් යැව්වාය. එවිට එතුමාණන් තම දියණියට සලාමය දන්වනු මෙන් හා යමක් පිරිනැමීම හා යමක් උදුරා ගැනීම අල්ලාහ් සතු අයිතියකි. නියත වශයෙන්ම සෑම විෂයක් සඳහාම යම් කාලනියමයක් තිබෙනු ඇත. එබැවින් ඉවසිල්ලෙන් යුතුව කටයුතු කරනු යනුවෙන් පවසන මෙන් එම පණිවිඩකරුවා වෙත දන්වා නැවත වරක් එව්වේය.

එවිට එතුමාණන්ගේ දියණිය අල්ලාහ් මත දිවුරා අනිවාර්ය ලෙස එතුමාණන් පැමිණ යුතු බව දන්වා පණිවිඩකරුවාව නැවත යවා තැබුවාය. ඉන් අනතුරුව, නබි තුමාණන් හා ඔහු සමඟ සඅද් බින් උබාදා, මුආද් බින් ජබල්, උබෙයි බින් කඅබ්, සෙයිද් බින් සාබිත් යන අයද නැගිට දියණිය වෙත පැමිණියෝය. නිවසට ඇතුල් වූ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත තම දියණිය මරණාසන්නයේ සිටින තම දරුවාව පෙන්වූ විට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කඳුළු සලන්නට විය. එය දුටු සඅද් (රළි) තුමාණන් අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! මෙලෙසින් කඳුළු සලන්නේ මන්ද යනුවෙන් විමසීය. එයට නබි තුමාණන් මෙය අල්ලාහ් විසින් තම ගැත්තන්ගේ සිත් තුළ ඇති කළ කරුණාව වේ. නියත වශයෙන්ම අල්ලාහ් තම ගැත්තන් අතුරින් කරුණාව ඇත්තන් සඳහාම කරුණාව දක්වනු ඇත යනුවෙන් උපදෙස් කළේය. (මූලාශ්‍ර: බුහාරි හා මුස්ලිම්)

## 30 ඉවසීම හා සමාව ලබා දීම:

අනස් බින් මාලික් (රළි) තුමාණන් මෙසේ වාර්තා කර ඇත:

දිනක් නබි තුමාණන් සමඟ මා ගමන් කරමින් සිටියෙමි. එවිට එතුමාණන් නජ්‍රාන් නම් යේමනයේ එක් ප්‍රදේශයක මසා නිම කරන ලද ඝන කබායක් ශරීරයේ පැළඳ සිටියේය. එවිට ගම්බද අරාබිවරයෙකු නබි තුමාණන්ව දැක එතුමාණන් පැළඳ සිටි එම ඝනකමින් යුතු කබායෙන් ඇද දමා අල්ලාහ් ඔබට ලබා දුන් ධනයෙන් ස්වල්පයක් මා හට ලබා දෙනු මෙන් ඔබේ අනුගාමිකයින් හට අණ කරනු යනුවෙන් ඉල්ලා සිටියේය. ඒ අයුරින් නබි තුමාණන්ව ඔහු ඇද දැමූ හේතුවෙන් එතුමාගේ ශරීරය තුවාල විය ග ඒ අවස්ථාවේදී ද නබි තුමාණන් ඔහු දෙස බලා සිනාසී පසුව ඔහුට අවශ්‍ය දෑ ලබා දෙනු මෙන් අණ කළේය. (මූලාශ්‍ර: බුහාරි හා මුස්ලිම් )

එතුමාගේ ඉවසීම පිළිබඳ තවත් නිදසුනක් නම්: සයිද් බින් සඃනා නැමැති යුදෙව් ආගමික නායකයෙකු සමඟ සිදු වූ සිදුවීමයි. එය පහත අයුරිනි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඉස්ලාමය වැළඳ ගත් ඇතැමුන්ගේ අවශ්‍යතාවයන් සපුරා දීම සඳහා එම යුදෙව් ආගමික නායකයාගෙන් ණයක් වශයෙන් ලබා ගෙන තිබුණි. එම ණය පියවීමට දවස් දෙකක් හෝ තුනක් ඉතිරිව තිබියදී නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අබූබක්ර්, උමර්, උස්මාන් (රළියල්ලාහු අන්හුම්) ඇතුළු තම මිත්‍ර කණ්ඩායම සමඟ මදීනාවෙහි සිදු වූ එක් අවමංගල කටයුත්තක් සඳහා පැමිණ සිටියේය. සයිද් බින් සඃනා නැමැති යුදෙව් ආගමික නායකයා මෙසේ පවසයි: එය අවසන් වූ පසු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එක් තැනක අසුන් ගත් අවස්ථාවේදී මා ඔහු වෙත කෝපයට පත් වූ මුහුණින් පැමිණ කමිස කොලරයෙන් අල්ලා ඇද දමා අහෝ මුහම්මද්! මාගෙන් ඔබ ලබා ගත් ණය නොගෙ වන්නේ මන්ද? දෙවියන් මත දිවුරා පවසමි, නියත වශයෙන්ම අබ්දුල් මුත්තලිබ්ගේ කුලය ඔබ මෙන් ණය ගෙවීමට ප්‍රමාද වන්නේ නැතැයි පවසා ඉන් අනතුරුව ඔහුට සමීපව සිටි උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් දෙස මදක් නෙත යොමු කළ බැලූ කළ ඔහුගේ දෑස් කෝපය හේතුවෙන් ඉදිමී රතුව තිබුණි. ඔහු මා දෙස බලා අහෝ දෙවියන්ගේ

සතුර! ඔබ දෙවියන්ගේ දූතයා සමඟ මේ ආකාරයෙන් හැසිරෙන්නෙහිද? දෙවියන් මත දිවුරා පවසමි මාගේ අසිපතින් නුඹගේ ගෙල කපා වෙන් කරමි යනුවෙන් පවසා සිටින අයුරු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දුටුවේය.

ඉන් අනතුරුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අහෝ උමර්! මා ඔබෙන් මීට පටහැනි යම් පිළිතුරක් අපේක්ෂා කළෙමි යනුවෙන් පවසා මොහු සමඟ ගොස් ඔහුගේ ණය ගෙවා අධික වශයෙන් සාඋ විස්සක ප්‍රමාණයක් (කිලෝ 50 ක්) ඔහුට ලබා දෙනු මෙන් අණ කළේය. මේ අයුරින් අධික ලෙස මා හට ලබා දෙන්නේ කුමන හේතුවක් මතදැයි උමර් (රළියල්ලාහු අන්හු) තුමාගෙන් අසා සිටියෙමි. එලෙස ලබා දෙන මෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තමන්ට අණ කළ බව උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් පැවසීය. එවිට මා, අහෝ උමර්! මා කවුරුන්ද යන්න ඔබ දන්නෙහිද යනුවෙන් ප්‍රශ්න කළෙමි. මා ඔබව නොදනිමි යනුවෙන් උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් පවසා නුඹ කවුරුද යනුවෙන් මාගෙන් විමසා සිටියේය. මා සයිද් බින් සඃනා යනුවෙන් ප්‍රකාශ කළෙමි. එසේද! ඔබ එම යුදෙව් ආගමික නායකයාද යනුවෙන් උමර් (රළියල්ලාහු අන්හු) තුමා විමසා සිටි පසු මා එසේය මා එම ආගමික නායකයා වෙමි යනුවෙන් පැවසුවෙමි. ඔබ ඒ අයුරින් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමඟ කටයුතු කිරීමට හේතුව කුමක්දැයි උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් මාගෙන් විමසා සිටියේය.

අහෝ උමර්! නබිත්වයට අදාල සලකුණු සියල්ල මා ඔහු දුටු විගස දැනගත්තෙමි. එනමුත් කරුණු දෙකක් මිස. ඒවා පරීක්ෂ කර බැලීම සඳහා එසේ කටයුතු කළෙමි යනුවෙන් මා පිළිතුරු දුනිමි. ඒවා නම් ඔහුගේ උදයෝගය හා ඉවසීම කෝපය අභිබවා යන්නකි. දෙවනුව, ඔහු සමඟ වඩා රළුව කටයුතු කළද ඔහු කාරුණිකව හා වඩා ඉවසිල්ලෙන් පසු වනු ඇත යනාදී කරුණු වේ. ඒ අනුව මා දැන් තෘප්තියට පත් වුනෙමි. නැමදීමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැති බවත් මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔහුගේ අවසාන දූතයකු බවත් මා සාක්ෂි දරමි යනුවෙන් පවසා "සයිද් බින් සඃනා" නැමැති යුදෙව් ආගමික නායකයා ඉස්ලාම් දහම වෙත ප්‍රවිෂ්ඨ විය.

ඉන්පසු එකල්හි හට ගත් බොහෝ සටන්වලදී එතුමා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමඟ එක්ව සටන් කළ අතර අවසානයේ තබූක් නැමැති සටනකදී එතුමාණන්ගේ ජීවිතය දෙවියන් වෙනුවෙන් දිවි පිදූහ. (මූලාශ්‍රය: ඉබ්නු හිබ්බාන්)

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ ඉවසීම හා සමාව ලබා දීමේ ගුණාංගය විදහා දක්වන තවත් සිදුවීමක් නම් මක්කා ජයග්‍රහනයට පසු තමන් කෙරෙහි බොහෝ පීඩාවන් එල්ල කළ මක්කාවාසීන් සියල්ල එකතු කර මා ඔබලාට කුමක් සිදු කරන්නට යන්නේදැයි ඔබලා සිතන්නේද? යනුවෙන් විමසා සිටියේය. ඔබ නියත වශයෙන්ම ගෞරවනීය සහෝදරයකි. තවද ගෞරවනීය සහෝදරයකුගේ පුත්‍රයෙකි යනුවෙන් ඔවුන් සියල්ල නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දෙස බලා අනුකම්පාවෙන් පවසා සිටිහ. ඔබලා සියල්ල නිදහස ලැබූවන් මෙන් මෙතැනින් පිටව යනු යනුවෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් නිවේදනය කළේය. (මූලාශ්‍රය: බයිහකී)

## 31 ඉවසීම:

ඉවසීම යන ගුණාංගයට ආදර්ශයක් ලෙස නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ජීවත් වූහ. එතුමාණන් තම ඒක දේව ප්‍රචාරය ආරම්භ කිරීමට පෙරාතුව තම ජනයා කරමින් සිටි අඥාන ක්‍රියාවන් හා පිළිම වන්දනාව වැනි දෑ පිළිබඳවත්, තම දේව ප්‍රචාරය ප්‍රත්‍යක්ෂ ලෙස එම ජනයා අතර දැනුම් දීමට ආරම්භ කරන විට මක්කාවාසීන් ඔහුට එල්ල කළ නොයෙකුත් පීඩනයන් ඉදිරියේත් අල්ලාහ්ගෙන් වේතනය අපේක්ෂා කරමින් ඉවසීමෙන් යුතුව කටයුතු කළේය. ඒ අයුරින්ම, මදීනාවෙහි විසූ කුහකයින් එල්ල කළ නොයෙකුත් තාඩන පීඩන ඉදිරියේදී ද ඉතා ඉවසිල්ලෙන් සිටියේය. එපමණක් නොව, තමන් ඇලුම් කරන යම් අයෙකු අහිමි වූ විට එතුමාගේ ඉවසීම තදබල පරීක්ෂණයට ලක් විය. ඔහුගේ බිරිඳ වන කදීජා (රළියල්ලාහු අන්හා) තුමිය ඔහුගේ ජීවිත කාලය තුළ මිය ගියාය. එමෙන්ම එතුමාණන්ගේ දරුවන්, මාමා වන හම්සා (රළියල්ලාහු අන්හු) තුමා සහ අබූ තාලිබ් ද අභාවප්‍රාප්ත විය.

අනස් ඉබ්නු මාලික් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

අප සැම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමග එතුමාණන්ගේ පුතුන් වන ඉබ්‍රාහීම් මරනාසන්නයේ සිටින විට ඔහු වෙත පිටව ගියෙමු. අල්ලාහ්ගේ දූතයාණන් තම පුත්‍රයා වන ඉබ්‍රාහීම්ව ඔසවා ඔහුව සිප ගත්තේය. මද වේලාවකට පසු නැවත වරක් ඔහු වෙත පැමිණි කල නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කඳුළු සලන්නට විය. මෙය දුටු අබ්දුර් රහ්මාන් බින් අවුෆ් (රළි) තුමාණන් අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! ඔබත් කඳුළු සලන්නේද යනුවෙන් විමසා සිටියේය. එවිට නබි තුමාණන් අහෝ! මෙය ආදරය හා සෙනෙහස හේතුවෙනි යනුවෙන් පවසා නියත වශයෙන්ම දෑස් කඳුළු සලන්නේය. හෘදය දුක් වන්නේය. අපගේ පරමාධිපති වූ අල්ලාහ්ට සුදුසු දෙයක් මිස අන් කිසිවක් අප නොපවසමු. අහෝ ඉබ්‍රාහීම්! ඔබගේ වෙන්වීමෙන් නියත වශයෙන්ම අප දුකට පත් වන්නෙමු යනුවෙන් නබි තුමාණන් ප්‍රකාශ කළේය. (මූලාශ්‍රය: බුහාරි)

## 32 යුක්තිය සහ සාධාරණත්වය:

සියළු කරුණු වලදී නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් යුක්තිය සහ සාධාරණත්වය යන ගුණාංගය පෙන්නුම් කළේය. විශේෂයෙන් අල්ලාහ්ගේ ආඥාවන් ක්‍රියාවට නැංවීමේදී යුක්තිසහගත ලෙස කටයුතු කළේය.

මේ පිළිබඳව ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය මෙසේ සඳහන් කරයි:

මහ්සූමියියා නැමැති ගෝත්‍රයට අයත් කාන්තාවක් කළ සොරකම ඉමහත් කතාබහට ලක් වුණි. එවිට කුරෙයිෂිවරුන් අතර මේ පිළිබඳ අල්ලාහ්ගේ දූතයා සමඟ ඇය වෙනුවෙන් මැදිහත් වී සමාව ලබා ගැනීමට ඉදිරිපත් වනුයේ කවුරුන්ද යන ගැටළුව මතු වුණි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ සමීප මිත්‍රයකු වන උසාමා (රළියල්ලාහු අන්හු) තුමා හැර වෙන කවරෙකු හෝ මේ සඳහා ඉදිරිපත් විය නොහැක යනුවෙන් ඔවුන් තීරණය කළෝය. ඒ අනුව උසාමා (රළියල්ලාහු අන්හු) තුමා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සමග එම සිදු වීම පිළිබඳ කතා කළ විට අහෝ උසාමා! ඔබ අල්ලාහ් නියම කළ එක් නීතියක් අහෝසි කිරීම පිණිස මැදිහත් වන්නේදැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විමසා ඉන්පසු නැගිට සිට දේශනා කිරීමට ආරම්භ කළේය. එහිදී,

ඔබලාට පෙරාතුව සිටි ජන සමාජය විනාශ වූයේ ඔවුන් අතුරින් කවර හෝ බලවත් කෙනෙකු යම් සොරකමක් කළේ නම් ඔහු සඳහා කිසිදු දඬුවමක් ලබා නොදී සිටි හේතුවෙන් හා ඔවුන් අතුරින් යම් අසරණ අයෙකු සොරකමක් කළේ නම් ඔහු සඳහා දඬුවම ක්‍රියාත්මක කිරීම හේතුවෙනි. මාගේ ප්‍රාණය කාගේ හස්තයෙහි ඇත්තේද ඔහු මත දිවුරා පවසමි.

" මාගේ දියණිය වන ෆාතිමා සොරකම් කර තිබුණාද නියත වශයෙන්ම ඒ හේතුවෙන් ඇගේ අත් කපන්නෙමි යනුවෙන් ප්‍රබල නිවේදනයක් නිකුත් කළේය ".

එසේම එතුමාණන් විසින් යම් අයෙකුට හානියක් සිදු වූ කළ ඒ සඳහා පලි ගැනීමට අවශ්‍ය නම් පලි ගත හැක යනුවෙන් විවෘතව ප්‍රකාශ කරන්නෙකු වූහ. දවසක් මදීනා වාසියෙකු විහුලු කර අන් අයව සිනා ගස්සමින් සිටියේය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම දෑතෙහි තිබූ එක් කෝටු කැබැල්ලකින් ඔහුගේ උදරයට සැහැල්ලුවෙන් පහර දුන්නේය. එවිට එම මිනිසා ඔබ මා හට පහර දුන්නාක් මෙන් මාද ඔබට පහර දිය යුතු යැයි ප්‍රකාශ කර සිටියේය. ඒ සඳහා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එකඟ වූ අතර එම මිනිසා ඔබ පහර දුන් විට මා උඩුකය නිර්වස්ත්‍රව සිටියෙමි. ඒ අයුරින් ඔබත් සිටිය යුතු බව ඉල්ලා සිටියේය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තමන් පැළඳ සිටි වස්ත්‍රය විවෘත කළ අවස්ථාවේදී ඔහු පලි ගැනීමට අමතරව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව වැළඳ එතුමාණන්ගේ ශරීරය සිප ගන්නට විය. අහෝ නබි තුමණි! මා අපේක්ෂා කළේ මෙය මිස අන් කිසිවක් නොවේ යනුවෙන් ප්‍රීතියෙන් ප්‍රකාශ කළේය. මෙම සිදුවීම උසෙයිද් ඉබ්නු හුලෙයිර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කළ බව අබූ දාවූද් ග්‍රන්ථයෙහි සඳහන් වී ඇත.

## 33 දේව බියභක්තිය:

ලෝ වාසීන් අතුරින් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අල්ලාහ්ට ඉතා බිය වන, අල්ලාහ් පිළිබඳ මනා දැනුවත් පුද්ගලයෙකු වූහ. ඒ පිළිබඳ අබ්දුල්ලාහ් ඉබ්නු මසූද් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කරයි.

වරක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මා වෙත පැමිණ අල්කුර්ආනය පාරායනය කර පෙන්වනු මෙන් ඉල්ලා සිටියේය. ඔබට පහළ කරන ලද දෑ ඔබටම මා පාරායනය කර පෙන්නවන්නදැ? යි පුදුමයෙන් විමසා සිටියෙමි. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එසේය, මා හට පාරායනා කර පෙන්වන්න යනුවෙන් ඉල්ලා සිටි විට මා අන්නිසා නැමැති පරිච්ඡේදයේ පහත සඳහන් වැකිය පාරායනා කළෙමි.

අහෝ නබි මුහම්මද්! අපි සෑම ජන සමාජයකින් ම සාක්ෂිකරුවෙකු ගෙනැවිත් මොවුනට එරෙහිව ඔබ සාක්ෂිකරුවෙකු ලෙස ගෙන එන විට (මොවුන්ගේ තත්ත්වය) කෙබඳු වේ ද? (ශුද්ධ වූ අල්කුර්ආනය 4:41)

මෙම වැකිය පාරායනය කළ පසු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දැනට මෙය ප්‍රමාණවත් වේ යනුවෙන් ප්‍රකාශ කළේය. එවිට මා එතුමාණන් දෙස බැලුවෙමි. එතුමාණන්ගේ දෙනතින් කඳුළු කැට ගලා යමින් තිබිණි. (මූලාශ්‍රය: බුහාරි / මුස්ලිම්)

එමෙන්ම, ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය පහත අයුරින් වාර්තා කරයි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වැහි වලාකුළු අහසෙහි තිබෙනු දුටු කල කළබලකාරී තත්වයක් සිදු වුනාක් මෙන් ඉදිරියට ගමන් කර පසුව පසුපසට නැවත ගමන් කරයි. සිය කාමරයට ඇතුල් වී නැවතත් එයින් පිටතට පැමිණේ. තවද එතුමාණන්ගේ සිය මුහුණ වෙනස් වේ. යම් අයුරින් වර්ෂාව ඇදහැලුනේ නම් එකී කළබලකාරී තත්වය එතුමාණන් තුළ උග්‍ර වනු ඇත. කෙසේ හෝ යම් දිනක එවැනි අයුරින් එතුමාණන් සිටින විට අල්කුර්ආනයෙහි සඳහන් පහළ සඳහන් වාක්‍ය පාරායනා කරමින් සිටියේය.

එය තම මිටියාවත් දෙසට එන වලාකුළක් යැයි (ආද් සමූහය) සිතූහ. මෙය අපට වැසි ලබා දෙන වලාකුළක් යැ" යි ද පැවසූ හ."නැත. නුඹලා කවරක් උදෙසා හදිසි වූයෙහු ද එයයි මෙය. පීඩාකාරි වේදනාවෙන් පිරි සුළඟක් යැ" යි පවසන ලදී.

ඉන් අනතුරුව මෙය එවැනි පීඩාකාරී වේදනාවෙන් යුත් වලාකුළක් විය හැකිදෝ යනුවෙන් මා බිය වෙමි යැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්‍රකාශ කළේය. (බුහාරි හා මුස්ලිම්)

## 34 හදවතෙහි පොහොසත්භාවය සහ සන්තෘප්තිය:

උමර් ඉබ්නු හත්තාබ් (රළි) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: මා වරක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ තමන් වැඩ සිටින එම සාමාන්‍ය නිවහන දෙස මදක් නෙත යොමු කළෙමි. එතුමන් නිදා සිටියේ ඇතිරිල්ලක් රහිත රටඉඳි අතු වලින් වියන ලද පැදුරකය. එවිට ඔහුගේ පිටහි එම පැදුරෙහි රේඛාවන් දක්නට ලැබුණි. කාමරයේ එක් පසක හමෙන් සාදන ලද ජල බඳුනක් ද තිබුණි. එවන් වූ අයුරින් ලොවට ආශිර්වාදයක් මෙන් පැමිණි අල්ලාහ්ගේ වක්තෘවරයාණන්ව දුටු මා ඇඬුවෙමි. එය දුටු නබි(සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔබ කඳුලු සලන්නේ කුමකටදැයි විමසා සිටියේය. මා නොහඬා කුමක් කරන්නද? කිස්‍රා - (කොස්‍රෝස්: පර්ෂියානු නායකවරුන් සඳහා කියනු ලබන විශිෂ්ඨ නාමයකි) සහ සීසර් (රෝමානු හමුදාමය සහ දේශපාලනික නායකයකු වේ) මේ ලෝකය තුළ භුක්ති විඳිති. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) වන ඔබේ ස්ථාවරය මෙසේද යනුවෙන් ප්‍රකාශ කළෙමි. අහෝ උමර්! කොස්‍රෝස් සහ සීසර් වැනි රාජ්‍ය නායකන් වෙනුවෙන් මෙම ලෞකික ජීවිතයේ සැප සම්පත් ලැබීමත් අප වෙනුවෙන් මතුලොවෙහි ස්වර්ග සැප සම්පත් හිමි වීමත් පිළිබඳව ඔබ තෘප්තියට පත් නොවන්නේ මන්ද? යනුවෙන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්‍රකාශ කළේය. (මූලාශ්‍රය: බුහාරි: මුස්ලිම්)

## 35 සතුරන් ඇතුළුව සියලු දනන් සඳහා යහපත අපේක්ෂා කිරීම:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ බිරින්දෑවරුන් අතුරින් එක් බිරිඳක් වන ආඉෂා (රළි) තුමිය මෙසේ වාර්තා කරයි:

උහද් සටනේදී ඔබ මුහුණ දුන් ඛේදවාචකයට වඩා ඉතා බරපතල ඛේදවාචකයක් ඔබ දැක තිබේද යනුවෙන් වරක් මා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගෙන් විමසා සිටියෙමි. උහද් සටන සිදු වූ දිනට වඩා අකබා දිනය ඉතා කුරිරුය. එනම් තාඉෆ් නගරයට ගොස් ධර්ම ප්‍රචාරය මෙහෙයවමින් සිටියදී මා එහි සිට පලවා හරින ලදී. එවිට මක්කාවටත් ඇතුල් වීමට නොහැකිව තිබූ අතර තාඉෆ් නගරයටද

නැවතත් ඇතුල් වීමට නොහැකි තත්ත්වයක පසු වූ මා, මක්කාවට ඇතුල් වීම සඳහා අබ්දුල් හිලාල් නැමැත්තාගෙන් ආරක්ෂාව හා රැකවරණය ඉල්ලා සිටියදී ඔහු එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ අතර ඒ හේතුවෙන් මා දුකට හා කම්පාවට පත් වී සිහිවිකල්ව ඇවිදමින් සිටියෙමි. කර්න් අස් සආලිබ් නැමැති කඳු ආශ්‍රිත ප්‍රදේශයකට මා පැමිණි පසු මා මාගේ හිස අහස වෙතට ඔසවා බැලූ කළ වලාකුළු මා සඳහා සෙවන ලබා දෙන බව දැක ගන්නට ලැබුණි. ඒ මත ජිබ්රීල් (අලෙයිහිස්සලාම්) තුමා සිටියේය.

නියත වශයෙන්ම ඔබේ සමූහය ඔබව ප්‍රතික්ෂේප කරමින් පැවසූ දෑ අල්ලාහ් සවන් දුන්නේය. ඒ අනුව ඔවුනට එරෙහිව ඔබ අභිමත කරන දෑ අන කිරීම වස් කඳුවලට භාරව කටයුතු කරන සුරදූත පිරිසද ඔබ වෙත යවා ඇත යනුවෙන් එතුමා මා අමතා ප්‍රකාශ කර සිටියහ. එවිට කඳුවලට භාර සුරදූතයින් මා වෙත පැමිණ සලාම් පවසා, අහෝ මුහම්මද්! ඔබ අභිමත කළ දෑ නියෝග කරනු! ඔබ අභිමත කළේ නම් මෙම කඳු දෙක ඉහළට ගෙන විත් එම සමූහය මත දමා විනාශ කර දමන්නෙමි යනුවෙන් ප්‍රකාශ කළේය. එවිට උත්තම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අනාගතයේ මෙම සමූහයාගේ පැලපතින් අල්ලාහ්ට පමණක් නැමදුම් කර ඔහුට කිසිවක් ආදේශ නොකරන සමූහයක් බිහි වනු ඇතැයි මම අපේක්ෂා කරමි යනුවෙන් පිළිතුරු දුන්හ. (මූලාශ්‍රයඃ බුහාරි හා මුස්ලිම්)

අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රළි) තුමා මෙසේ වාර්තා කරයිඃ

මුනාෆික් නම් කුහකයකු වූ අබ්දුල්ලාහ් ඉබ්නු උබෙයි ඉබ්නු සලූල් නැමැති පුද්ගලයා මරණයට පත් වූ අවස්ථාවේදී ඔහුගේ පුත්‍රයා වන අබ්දුල්ලාහ් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ තම පියාණන්ව ආවරණය කිරීම සඳහා තම වස්ත්‍රය ලබා දෙන මෙන් ඉල්ලා සිටියේය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එය ලබා දුන් පසු නැවත වරක් තම පියාණන් සඳහා සලාතය මෙහෙය වනු මෙන් ඔහු ඉල්ලා සිටියේය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සලාතය මෙහෙය වීම සඳහා නැගිට සිටගත් විට උමර් (රළියල්ලාහු අන්හු) තුමාණන් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පැළඳ සිටි වස්ත්‍රය අල්ලා එතුමාණන්ව නවත්වමින් අහෝ

අල්ලාහ්ගේ දූතයාණනි! ඔහු සඳහා ඔබ සලාතය මෙහෙය වන්නේද! එසේ ඔහු සඳහා සලාතය මෙහෙයවීම අල්ලාහ් තහනම් කර ඇතැයි ප්‍රකාශ කළේය! එනමුත් අල්ලාහ් මා සඳහා තෝරා ගැනීමේ නිදහසක් ලබා දී ඇති බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් පිළිතුරු දුන්හ. පසුවඃ- (මුහම්මද් !) ඔබ ඔවුන් වෙනුවෙන් පාප ක්ෂමාව අයැදින්න. නැතහොත් නොඅයැද සිටින්න. ඔබ ඔවුන් වෙනුවෙන් හැත්තෑ වරක් පාප ක්ෂමාව අයැදුවත් අල්ලාහ් ඔවුනට කිසිසේත් ම ක්ෂමාව නොදෙයි - යන අල්කුර්ආන් වැකිය පාරායනය කර මා හැත්තෑ වරකට වඩා වැඩියෙන් ඔහු වෙනුවෙන් පාප ක්ෂාමව අයැදින්නෙමි යනුවෙන් ප්‍රකාශ කළේය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සලාතය ඉටු කර අවසන් කළ පසු අල්ලාහ් විසින් පහත සඳහන් අල්කුර්ආන් වැකිය පහළ කරන ලදී.

ඔවුන් අතුරින් මරණයට පත් වූ කිසිවෙකු වෙනුවෙන් ඔබ සලාතය ඉටු නොකරන්න. කිසිවකුගේ සොහොන් වළෙහි ඔබ සිට නොගන්න.ඔවුහු අල්ලාහ් ද ඔහුගේ දූතයා ද පිළිගැනීමට ප්‍රතික්ෂේප කළහ. තව ද ඔවුහු වැරදි කරන්නෝ වශයන් මරණයට පත් වූහ. (ශුද්ධ වූ අල්කුර්ආනය 09:84)

# නබි (ﷺ) තුමාණන්ගේ ආචාරධර්ම ස්වල්පයක්

## 01 සමීපතමයින් සමග සමීප සම්බන්ධතාවය:

මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා එතුමාගේ මිත්‍රයින්ට ඉතා සමීපව සිටි අතර, එතුමාගේ චරිතාපදානය පිළිබඳ සවිස්තරාත්මක වාර්තා කියවන විට එය හොඳින් අවබෝධ කළ හැකි අතර එය අපේ ජීවිතය සඳහා ප්‍රයෝජනවත් වනු ඇත. මන්දයත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අපට එක් ආදර්ශයකි. ඒ අනුව සියලු විෂයන්වලදී ඔහුව ආදර්ශයක් ලෙස ගැනීම අපගේ යුතුකමකි.

මේ පිළිබඳව ජාබිර් ඉබ්නු අබ්දුල්ලාහ් (රළි) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී:

මා ඉස්ලාමය පිළිගැනීමෙන් පසු, නබිතුමාණන් සමග මා වාඩිවී සිටීම වළක්වා ගත්තේ නැත. එතුමාණන් මා දෙස බැලූ සෑම විටම සිනාසුණේය. වරක් මා විසින් අශ්වයෙකු පිට නැග ගමන් කිරීමේ අපහසුතාවය පිළිබඳ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණිලි කළෙමි. එවිට එතුමාණන්ගේ අත මාගේ පපුව මත තබා පහත අයුරින් ප්‍රාර්ථනා කළේය.

අහෝ දෙවිඳුනි! මොහුට ස්ථිරත්වය ලබා දෙනු මැනව! තවද අන් අයට යහමග පෙන්වන එමෙන්ම යහමග ලැබූ පුද්ගලයෙකු මෙන් පත් කරනු මැනව! (මූලාශ්‍රය: බුහාරි / මුස්ලිම්)

## 02 විනෝදය සහ විහිළුව:

මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඇතැම් අවස්ථාවන්වලදී එතුමාණන්ගේ අනුගාමිකයින් සමග විනෝද වී

ඔවුන් සමඟ විහිලුතහලු කරමින් සිටියේය. මේ පිළිබඳ අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මිනිසුන් අතුරින් ඉතා යහපත් ගතිගුණාංග වලින් පිරිපුන් පුද්ගලයකි. අබූ උමෙයිර් යනු මාගේ බාල සහෝදරයෙකි. ඔහු සතුව කුඩා පක්ෂියෙකු තිබුණු අතර එම පක්ෂියා සමඟ ඔහු සෙල්ලම් කරන්නෙකු විය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔහුව දකින සෑම විටකම අහෝ අබූ උමෙයිර්! නුඹේ පක්ෂියා නුඹට කුමක් කළේදැයි විහිළුවට මෙන් විමසා සිටියි. (මූලාශ්‍රය: බුහාරි)

තවද නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම කථනයෙහි පමණක් විහිලුතහලු කරන්නෙකු නොව එතුමාණන්ගේ ක්‍රියාවන් මඟින්ද තම මිත්‍රයින් සමඟ විහිලුතහලු කරමින් විනෝදයට පත් වන අවංක චරිතයකි. අනස් ඉබ්නු මාලික් (රළි) වරක් මේ අයුරින් වාර්තා කරයි.

සාහිර් ඉබ්නු හරාම් නැමැති සහාබිවරයා ව්‍යාපාර කටයුතු වල නිරතව සිටියදී නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔහු නොදැනුවත් වන අයුරින් ඔහුගේ පිටුපස සිට ඔහුගේ ඇස් දෙක දෙඅතින් වසා ගත්තේය. එවිට ඔහු, කවුරුන්ද මේ! මා අත්හරින්න! යනුවෙන් පවසා දඟලිමින් සිටියේය. පිටුපස සිටින්නේ නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් බව ඔහු දැනුවත් වූ පසු තම පිට නබි තුමාණන්ගේ හෘදය සමඟ එකට එකතු කර තද කර ගත්තේය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙම වහල්ලා මිලට ගන්නේ කවුරුන්ද යනුවෙන් විහිලුවට මෙන් කීවේය. එවිට ඔහු අහෝ අල්ලාහ්ගේ දූතයාණනි! මා නොවටිනා පුද්ගලයෙකු වේ ද යනුවෙන් විමසා සිටියේය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් එසේ නොව, නියත වශයෙන්ම ඔබ අල්ලාහ් ඉදිරියේ ඉතා කීර්තිමත් පුද්ගලයකු වේ යනුවෙන් ඔහුට පවසා සිටියේය.(මූලාශ්‍රය: ඉබ්නු හිබ්බාන්)

වහී නම් දිව්‍යමය මඟපෙන්වීම මඟින් සඳහන් නොවූ කරුණු පිළිබඳ සිය මිතුරන් සමඟ සුහද සාකච්ඡාවක නිරත වී ඔවුන්ගේ වටිනා අදහස් පිළිගෙන කටයුතු කරන ස්වභාවයද නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තුළ දක්නට ලැබුණි. ඒ පිළිබඳ අබූ හුරයිරා (රළි)

තුමාණන් වාර්තා කරන්නේ මේ අයුරිනි: මා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙන් මිතුරන් සමඟ සාකච්ඡා කරන පුද්ගලයකු දැක නැත.(මූලාශ්‍රය: තිර්මිදි)

## 03 රෝගීන් බැහැ දැකීම:

නියත වශයෙන්ම මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තම මිතුරන්ගේ සුවදුක් විමසන පුද්ගලයකු විය. ඔවුන් අතුරින් කවරෙකු හෝ රෝගාතුරැ වූ බව දැනුවත් වූයේ නම් තමන් හා තමන් සමඟ සිටින සෙසු මිතුරන් සමඟ ගොස් ඔහු පිළිබඳ සුවදුක් විමසයි. එම රෝගාතුරැ වූ පුද්ගලයා මුස්ලිම්වරයකු හෝ මුස්ලිම් නොවන අන්‍ය ආගමිකයකු වූවද ඒ අයුරින්ම එතුමාණන් කටයුතු කරන්නෙකු විය.

මේ පිළිබඳ පුවතක් අනස් ඉබ්නු මාලික් (රළියල්ලාහු අන්හු) තුමා මෙසේ වාර්තා කර ඇත:

යුදෙව් ජාතික තරුණයකු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙනුවෙන් ස්වෙච්ඡා සේවයෙහි නිරතවී සිටියේය. ඔහු රෝගාතුරැ වූ බව ආරංචි වන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔහු අසලට ගොස් ඔහුගේ සුවදුක් විමසා ඔබ ඉස්ලාම් දහම වැළඳ ගනු මෙන් ඉල්ලා සිටි විට එම තරුණයා සිය ආදරණීය පියාණන් වෙත නෙත් යොමු කළේය. එවිට ඔහුගේ පියාණන් අබුල් කාසිම්ට - මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ට - අවනත වනු මෙන් පැවසූ පසු එම තරුණයා ඉස්ලාම් දහම වැළඳ ගත්තේය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමණන්: අපාය ගින්නෙන් ඔහුව ආරක්ෂා කළ අල්ලාහ්ටම සියළු පැසසුම් හිමි වේවා යැයි පවසමින් එතැනින් පිටව ගියේය. (මූලාශ්‍රය: බුහාරි)

## 04 මිනිසුන් තමන් වෙත කළ යහපතට කෘතඥතාව පළ කිරීම හා ඔවුනට ප්‍රතිඋපහාර කිරීම:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ වරක් මෙසේ ප්‍රකාශ කළහ:

අල්ලාහ් වෙනුවෙන් කවරෙකු හෝ ඔබගෙන් ආරක්ෂාව ලබා දෙනු

මෙන් ඉල්ලා සිටින්නේ නම් ඔහුට ආරක්ෂාව සලස්වා දෙනු. අල්ලාහ් වෙනුවෙන් කවරෙකු හෝ ඔබගෙන් උදවු උපකාරයක් ඉල්ලා සිටින්නේ නම් ඔහුට උදවු උපකාර කරනු. යමෙක් ඔබට ආරාධනා කරන්නේ නම්, ඔහුගේ ආරාධනය පිළිගනු. ඔබ වෙනුවෙන් කවරෙකු හෝ කරුණාවන්ත ක්‍රියාවක් කරන්නේ නම්, ඒ හා සමාන ආකාරයකින් ඔහුටද ආපසු කරුණාවන්ත ක්‍රියාවක් කරනු. ඔබට එසේ කිරීමට නොහැකි වන්නේ නම්, ඔබ ඔහුට ආපසු කරුණාවන්ත ක්‍රියාවක් කළ බව ඔහු සෑහීමට පත් වන තුරු ඔහු සඳහා අධික ලෙස දෙවියන් ඉදිරියේ ප්‍රාර්ථනා කරනු. (මූලාශ්‍රය: අබූ දාවූද්)

ආඉෂා (රළි) තුමිය මෙසේ වාර්තා කරයි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් තමන් වෙත පිරිනැමෙන ත්‍යාග සුහදව පිළිගත් අතර එයට ප්‍රතිඋපකාරයක් මෙන් එතුමාද ඔවුන්ට යමක් පිරිනමා සංග්‍රහ කරනු ඇත. (මූලාශ්‍රය: බුහාරි)

## 05 අලංකාරමත් හා යහපත් කරුණු කෙරෙහි ඇල්ම:

අනස් ඉබ්නු මාලික් (රළි) තුමා මෙසේ වාර්තා කරයි:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ අතට වඩා සුමුදු සේද රෙද්දක් මා ස්පර්ශ කර නැත. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ සිරුරෙන් නිකුත් වන සුගන්ධය මෙන් කිසිවක් මා ආඝ්‍රාණය කර නැත. (මූලාශ්‍රය: බුහාරි/මුස්ලිම්)

## 06 යහපත වෙනුවෙන් මැදිහත් වීමෙන් අන් අයට උදව් කිරීම:

මේ පිළිබඳ ඉබ්නු අබ්බාස් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

බරීරා නැමැති කාන්තාව ඇගේ ස්වාමි පුරුෂයා වන මුගීස් වහලෙකු වූ හේතුවෙන් ඔහුගෙන් වෙන් වී ජීවත් වීමට තීරණය කළාය. ඒ හේතුවෙන් ඇගේ ස්වාමි පුරුෂයා මදීනාහි වීදිවල, ඔහුගේ රැවුල් තෙත් වන තරම් හඬා වැලපමින් ඇය පිටුපසින් ඇවිදිමින් සිටි අයුරු අදටත් මාගේ මතකයෙහි පවතී. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අබ්බාස් (රළියල්ලාහු අන්හු) තුමා දෙස බලා අහෝ අබ්බාස්!

මුගීස් බරීරා මත තබා ඇති ආදරය පිළිබඳවත් බරීරා මුගීස් මත තබා ඇති අකමැත්ත පිළිබඳවත් ඔබ මවිතයට පත් නොවන්නේද? යනුවෙන් විමසා බරීරාගෙන් ඔබ ඔබගේ සැමියා නැවත ලබා ගත්තේ නම් යසැසි ප්‍රකාශ කර සිටියේය. එවිට එම කාන්තාව අහෝ නබි තුමණි! මෙය ඔබ විසින් කරන ලද අණ කිරීමක්දැයි අසා සිටියාය. නැත, හුදෙක් මෙය මා විසින් කළ මැදිහත් වීමකි යැයි පැවසූ විට එසේ නම්, මට ඔහු අවශ්‍ය නොවන බව ඇය ප්‍රකාශ කළාය. (මූලාශ්‍රය: බුහාරි)

## 07 තමාගේ පෞද්ගලික වැඩකටයුතු තමා විසින්ම ඉටු කර ගැනීම:

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් නිවසෙහි සිටින විට කුමක් කරන්නේදැයි ආඉෂා (රළි) තුමියගෙන් විමසන ලදී. එවිට: වෙනත් සාමාන්‍ය පිරිමින් මෙන් එතුමාද හැසිරෙයි. තම ඇඳුම් සෝදා ගැනීම, එළුවන්ගෙන් කිරි දොවා ගැනීම සහ නිවසේ අනිකුත් වැඩ කටයුතුවලටද එතුමා සහභාගි වෙයි.(මූලාශ්‍රය: ඉබ්නු හිබ්බාන්)

එපමණක් නොව, එතුමාණන් සිය වැඩ කටයුතු කරනවාත් සමගම අන් අයගේ වැඩ කටයුතු සඳහාත් උදවු උපකාර කරන පුද්ගලයකු විය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් නිවසෙහි සිටින විට කුමක් කරන්නේදැයි ආඉෂා (රළි) තුමියගෙන් විමසන ලදී. එවිට: එතුමාණන් නිවසෙහි සිය භාර්යාවන්ට උදවු උපකාර කරනු ඇත. එනමුත් සලාතයේ ඇරයුමට සවන් දුන්නේ නම් සැනින් නිවසින් පිටවී යනු ඇත යනුවෙන් පැවසුවාය. (මූලාශ්‍රය: බුහාරි)



# නබි (ﷺ) තුමාණන් පිළිබඳ යුක්තිසහගත හා මධ්‍යස්ථවාදී ප්‍රකාශ

## 01 ජර්මානු කවියෙකු වන වුල්ෆ්ගෑන්ග් ගොත් [2]:

මා විසින් මානව ඉතිහාසයෙහි සුසමාදර්ශයක් පිළිබඳ නිරීක්ෂණයක නිරත වූ අතර එය මුහම්මද් තුමාණන් තුළ සොයාගන්නට හැකි වුණි.

## 02 මහාචාර්ය කීත් මෝර් (The Devoloping Human) නැමැති සිය කෘතියෙහි මෙසේ ප්‍රකාශ කරයි [3]:

මෙම විස්තර මුහම්මද් තුමාට ලැබී ඇත්තේ හුදෙක් දෙවියන්ගෙන් බව මට ඉතා හොඳින්ම පැහැදිළිය. මෙයට ප්‍රධාන හේතුව මෙම විද්‍යාත්මක කරුණු මනුෂ්‍ය වර්ගයා තම පර්යේෂණ මගින් දැන ගන්නේ එතුමාට ශතවර්ෂ කිහිපයකට පසුවය. මේ අනුව අනුව මුහම්මද් තුමා නිසැකවම දෙවිඳුන්ගේ ධර්ම දූතයකු බව මනාව ඔප්පු වන්නේය.

## 03 ආචාර්ය මොරිස් බුකෙයිල් [4] (The Quran and Modern Science) නැමැති සිය කෘතියෙහි මෙසේ සඳහන් කරයි:

අල්කුර්ආනයෙහි බාහිර වස්තූන් පිළිබඳ සම්පූර්ණ විමර්ශන නවීන දැනුමට අනුව පරීක්ෂා කිරීමේදී, නවීන දැනුම හා අල්කුර්ආනය අතර

2. ජර්මානු ලේඛකයෙක් හා විද්‍යාඥයෙක්. කවි, නාට්‍ය හා නවකතා පිළිබඳ උපාධිධාරියෙකි. ඔහු විවිධ ක්ෂේත්‍රවල විද්‍යාත්මක පර්යේෂණ පැවැත්වීය.
3. කැනේඩියානු කාය යාන්ත්‍රික සංගමයේ හිටපු සභාපතිවරයා - කායික විද්‍යා අංශය හා සෛල ජීව විද්‍යාව - ටොරොන්ටෝ විශ්ව විද්‍යාලය.
4. ඔහු ප්‍රවීණ ප්‍රංශ ශල්‍ය වෛද්‍ය විද්‍යාඥයෙක් වන අතර බයිබලය, අල්කුර්ආනය සහ විද්‍යාව යන කෘතියෙහි කතුවරයා ය.

ඇති එකඟතාව හඳුනා ගැනීමට අපව යොමු කරයි. මුහම්මද් තුමාගේ කාලයේ ජීවත් වූ සාමාන්‍ය මිනිසෙකු සතුව තිබූ දැනුම මුල්කරගනිමින් මෙවැනි ප්‍රකාශයන්හි නිරත විය හැකි යැයි සිතීම අපහසු ය. මෙවැනි නිරීක්ෂණයන් හා විමර්ශන දිව්‍යමය හෙළිදරව්ව වන අල්කුර්ආනය සඳහා අද්විතීය ස්ථානයක් හිමි කර දෙන සාධක අතුරින් එකකි.

## 04 ලේඛිකාවක් වන ඇනී බෙසන්ට් [5] (The Life and Teachings of Muhammad) නැමැති කෘතියෙහි මෙසේ සඳහන් කරයි:

අරාබියේ ශ්‍රේෂ්ඨ වක්තෘවරයකු වූ මුහම්මද් තුමාගේ ජීවිතය සහ චරිතය අධ්‍යනය කළ, එමෙන්ම එතුමන් උගන්වනු ලැබූ ආකාරය හා ජීවත් වූ ආකාරය ගැන දැනගත් කිසිවෙකුට ලෝතලයට සම්ප්‍රාප්ත වූ වක්තෘවරුන් අතුරින් ප්‍රබල වක්තෘවරයකු වූ ඔහුට ගරු කිරීමේ මානසිකත්වයක් හැර අන් කිසිවක් නොහැගේ. බොහෝ දෙනෙකුට හුරු පුරුදු වූ බොහෝ දේ ගැන මා (මෙම කෘතියෙහි) ඔබට පවසන නමුත් ඔහු පිළිබඳ එවැනි කරුණු නැවත නැවතත් කියවීමේදී පුදුමාකාර ආශාවක් හා එම ශ්‍රේෂ්ඨ අරාබි ගුරුවරයා කෙරෙහි ගෞරවයක් මා තුළ ඇති වේ.

## 05 ආචාර්ය ගුස්ටාව් වීල් [6] (History of the Islamic Peoples) නැමැති කෘතියෙහි මෙසේ සඳහන් කරයි:

මුහම්මද් යනු එතුමාගේ ජනතාවගේ ආදර්ශය වේ. එතුමාගේ චරිතය පිරිසිදු හා නිර්මල විය. එතුමාගේ නිවහන, ඇඳුම් පැළඳුම්, ආහාරය යනාදී දෑ දුර්ලභ සරළ භාවයකින් සමන්විත විය. එමනිසා ඔහු සිය මිත්‍රයන්ගෙන් කැපී පෙනෙන චරිතයක් නොවී ය. තමාට තමන් වෙනුවෙන් කළ හැකි දෑ වෙනත් සේවකයකුගෙන් ඔහු පිළිගන්නේ නැත. සෑම අවස්ථාවකදීම ඔහු සියල්ලන්ට ප්‍රවේශ විය හැකි සුළභ චරිතයක් විය. ඔහු අසනීප වූ අය වෙත ගොස් සුවදුක් විමසූ අතර සියලු දෙනා කෙරෙහි අනුකම්පාව දැක්වීය. ප්‍රජාවගේ සුභසාධනය සඳහා ත්‍යාගශීලීත්වය ද ඔහු සතු වූ ගුණාංගයකි.

5. දාර්ශනික සහ දේශපාලන චරිතයෙකි. ඉන්දියාවේ පාලනය සහ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටියා ය.
6. ගුස්ටාව් වීල් (අප්‍රේල් 1808 - අගෝස්තු 1889) ජර්මානු ප්‍රාචීන විද්‍යාඥයෙකි.

## 06 මෝරිස් ගෝද්ෆ්රෝයි [7] එතුමාණන් පිළිබඳ මෙසේ අදහස් දක්වා ඇත:

මුහම්මද් තුමාණන් දිව්‍යසිවරයකු මිස දේවත්වය උසුලන කෙනෙකු නොවේ. ඒ අයුරින් ඔහු ප්‍රචාරය නොකළ බවද සත් සුදක් සේ පැහැදිළි ය. ඔහු වටා එක්රැස් වූ සමූහය අල්ලාහ් වෙතින් එතුමාණන් ප්‍රකාශ කළ නීතියට කීකරු වීමෙන් හා එතුමාණන්ගේ ඉගැන්වීම් හා ආදර්ශ අනුගමනය කිරීමෙන්ද සෑහීමට පත් විය.

## 07 වොෂින්ටන් ඊර්වින්ග් මෙසේ පවසයි [8]:

ඔහුගේ හමුදාමය ජයග්‍රහණයන් ආත්මාර්ථකාමි අරමුණු ඉටු කර ගෙන නොතිබුනු හේතුවෙන්, කිසිදු ආඩම්බරයක් හෝ ගෞරවයක් ඔහු තුළ දක්නට නොලැබිණි. දුෂ්කර කාලවලදී මෙන් ම ඔහු සිය ශ්‍රේෂ්ඨතම බලයේ සිටි කාලවලදී ද ගතිගුණ හා බාහිර පෙනුම සරල ලෙස පවත්වා ගෙන ගියහ. එතුමණාන් සතුව රාජ්‍ය බලය තිබියදී ඔහු වෙත කවරෙකු හෝ පැමිණ එතුමණාන් කෙරෙහි සීමාව ඉක්මවා ගෞරවය දැක්වීම හෝ අසාමාන්‍ය ලෙස ප්‍රශංසා කිරීම එතුමාණන් අසතුටට පත් වන කරුණක් විය.

## 08 එඩ්මන්ඩ් බර්ක් මෙසේ පවසයි [9]:

ප්‍රබල හා සාමාන්‍ය කරුණු සමඟ බැඳී ඇති (ඉස්ලාමීය) නීතිය යනු ලෝකයේ වඩාත්ම උගත් හා අතිශයින්ම ප්‍රබෝධමත් වූ නූතනවාදී ක්‍රමවේදයක් සහිතව පවතින නීතියකි.

7. (දෙසැම්බර් 1862 - අගෝස්තු 1957) ප්‍රංශ අරාබි ජාතිකයෙක් විය. ඉස්ලාම් දහම සහ ආගම් ඉතිහාසය පිළිබඳ විශේෂඥයෙකි.
8. වොෂින්ටන් ඊර්වින්ග් යනු ප්‍රසිද්ධ ඇමෙරිකානු කෙටි කතා ලේඛකයෙකි. ඔහු 1859 දී මිය ගියේය.
9. මොහු අයර්ලන්තයෙහි ඩබ්ලින් නගරයේ උපත ලැබූහ. මොහු කතුවරයෙකු සහ දේශපාලන න්‍යායවාදියෙකු හා දාර්ශනිකයෙකි.



# නබි (ﷺ) තුමාණන්ගේ භාර්යාවන්

එතුමාගේ පළමුවන භාර්යාව වූ කදීජා තුමියගේ මරණයෙන් අනතුරුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ස්ත්‍රීන් කිහිපදෙනෙකුව විවාහ කර ගත්හ. එසේ විවාහ වූ කාන්තාවන් අතුරින් ආඉෂා තුමිය හැර අන් සියල්ලෝම වැන්දඹුවන් වූහ. ඔහුගේ බිරින්දෑවරුන් බොහොමයක් කුරෛයිෂ් ගෝත්‍රයට අයත් කාන්තාවන් වූ අතර අනෙක් අය වෙනත් පවුල් වලට අයත් කාන්තාවෝ වූහ.

මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙම කාන්තාවන් විවිධ හේතු නිසා විවාහ කර ගත් අතර ඒ පිළිබඳ පහත විස්තර කෙරේ.

## 01 ආගමික සහ ව්‍යවස්ථාමය අරමුණු:

මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ සයිනබ් බින්ති ජහෂ් නම් කාන්තාව විවාහ කර ගත් අතර අඥාන යුගයේ අරාබිවරු විසින් දරුකමට හදාගත් පුත්‍රයා යනු මිනිසෙකුගේ සැබෑ පුත්‍රයකු ලෙස සැලකූ හේතුවෙන් දරුකමට හදාගත් පුත්‍රයාගේ භාර්යාව විවාහ කර ගැනීම තහනම් යැයි විශ්වාස කරන ලදී. එනමුත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ඔහු හදාවඩා ගත් පුත්‍රයා වන සයිද් ඉබ්නු හාරිස් (රළි) තුමාගේ බිරිඳ වූ සයිනබ් බින්ති ජහෂ් සමඟ විවාහ විය. එමඟින් එකල තිබූ මෙම විශ්වාසය ඉවතලන ලදී. උත්තරීතර අල්ලාහ් මේ පිළිබඳ පහත අයුරින් ශුද්ධ වූ අල්කුර්ආනයේ සඳහන් කරයි.

"ඔබ බිය වීමට ඉතා සුදුස්සා අල්ලාහ් ය.සෙයිද් නැමැත්තා තම අවශ්‍යතාව ඇගෙන් ඉටු කර ගත් පසු (දික්කසාද කළ පසු) අපි ඇය ඔබට විවාහ කර දුනිමු. දරුකමට හදා වඩා ගත් පුතුන් තම භාර්යාවන්ගෙන් තම අවශ්‍යතාව ඉටු කර ගතහොත් (දික්කසාද කළ හොත්) හදා වඩා ගත් පියවරුන් වන (විශ්වාස කළ අය ඔවුන් විවාහ

කර ගැනීම වරදක් බවට පත් නොවනු පිණිස අපි මෙසේ කළෙමු. අල්ලාහ්ගේ අණ ඉටු කරනු ලැබිය යුත්තක් වේ.(ශුද්ධ වූ අල්කුර්ආන් 33:37)

## 02 දේශපාලන හේතු සහ ඉස්ලාම් හි ව්‍යාප්තිය සඳහා එමෙන්ම නොයෙකුත් සමූහයන් ඉස්ලාමයට ආරාධනා කිරීම සඳහා හා අරාබි ගෝත්‍රවල අනුග්‍රහය ලබා ගැනීම සඳහා ඒ අයුරින් විවාහ විය.

අල්ලාහ්ගේ දූතයාණන් විශාලතම හා ශක්තිමත්ම අරාබි ගෝත්‍රවලින් කාන්තාවන් විවාහ කර ගත් අතර මේ අයුරින් විවාහ වනු මෙන් එතුමාණන් විසින් තම මිතුරන්ටද උපදෙස් දෙන ලදී.

දවුමතුල් ජන්දල් නම් එක් ගෝත්‍රයක් වෙත නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් අබ්දුර්රහ්මාන් ඉබ්නු අවුෆ් නැමැති තම මිතුරෙකු ධර්ම ප්‍රචාරය සඳහා යැවීමේදී පහත අයුරින් ඔහුට උපදෙස් දුන්හ: ඔවුන් ඔබට යටහත් වූයේ නම් (ඉස්ලාම් දහම ඔවුන් වැළඳ ගත්තේ නම්) කල්බ් ගෝත්‍රයෙහි ප්‍රධානියාගේ දියණියව ඔබ විවාහ කර ගන්න.(ඉබ්නු හිෂාම්)

## 03 සමාජ හේතූන්:

මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඉස්ලාමය දේශනා කිරීම සඳහා වූ මෙහෙවරකදී මියගිය ඔහුගේ අනුගාමිකයන්ගේ භාර්යාවන් කිහිපදෙනෙකුව විවාහ කර ගත්හ. එම කාන්තාවන් එතුමාණන්ට වඩා වයසින් වැඩි වුවත්, ඔවුන්ට ද ඔවුන්ගේ ස්වාමිපුරුෂයන්ට ද ගෞරව කිරීම පිණිස ඒ අයුරින් විවාහ විය.

ඉතාලියේ අරාබි හා ඉස්ලාම් අධ්‍යයන පුරෝගාමී ලෝරා වීසියා වැග්ලියරි තම "Defense of Islam" නැමැති කෘතියෙහි මෙසේ ප්‍රකාශ කොට ඇත: එතුමාගේ යෞවන කාලය පුරාවට මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විවාහ වී ඇත්තේ එක් කාන්තාවක් පමණි. මේ කාලය තුළ මිනිසාගේ ලිංගිකත්වය උච්චතම අවස්ථාවක පවතී. එපමණක් නොව, එතුමාණන් ජීවත්වූ සමාජයේ බහු විවාහය සාමාන්‍ය

නීතියක් ලෙස සැලකුනු අතර, දික්කසාදය ඉතා පහසු කාර්යයක් ලෙස තිබිණි. එනමුත් තමාට වඩා වයසින් වැඩි එක් කාන්තාවක් පමණක් එතුමාණන් විවාහ කර ගත්තේය. එතුමාණන් තම පළමු භාර්යාව සඳහා විශ්වාසවන්ත ස්වාමිපුරුෂයෙකු වූ අතර අනෙක් කාන්තාවක් සමඟ එතුමාණන් විවාහ වූයේ ඇයගේ මරණයෙන් අනතුරුවයි. ඒ වන විට එතුමාගේ වයස අවුරුදු පනහක් විය. ඉන්පසු එතුමාණන් සිය අනෙකුත් භාර්යාවන්ව සමාජීය හෝ දේශපාලන අරමුණු වෙනුවෙන් විවාහ විය. ආචාරශීලී කාන්තාවන්ට ගෞරව කිරීම හා ඇතැම් ගෝත්‍රවල පක්ෂපාතීත්වය ලබා, ඉස්ලාමය ඔවුන් අතර ප්‍රචාරය කිරීම එතුමාගේ ප්‍රධාන අරමුණ විය. ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය හැර මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් විවාහ වූ සියලු භාර්යාවන් කන්‍යාවියන් නොවූ අතර ඔවුන් තරුණ හෝ ලස්සන ද නොවීය. එසේ නම් එතුමාණන් කාමුක අයෙකු බව කවරෙකුට නම් කිව හැකිද?

එපමණක් නොව එතුමාණන් මිනිසෙකු මිස දෙවියකු නොවේ. පුතෙකු ඇති කිරීමට ඔහු තුළ තිබූ ආශාව මෙවැනි විවාහ සඳහා පාදක විය හැකිය. කදීජා (රළියල්ලාහු අන්හා) තුමියගෙන් ලැබූ පිරිමි දරුවන් සියල්ලෝම මියගිය අතර විශාල ආදායමක් නොමැතිව තම විශාල පවුලෙහි මූල්‍යමය වගකීම් තමන් විසින් ඉටු කරන ලදී. එතුමාණන් එම භාර්යාවන් සියල්ලන් අතර සාධාරණ හා යුක්තිසහගත විය. ඔවුන් අතර කිසිඳු වෙනසක් නොපෙන්වූහ. මෝසෙස් වැනි පෙර සිටි වක්තෘවරුන්ගේ ව්‍යවහාරය එතුමාණන් අනුගමන කළේය. කිසිවෙකු ඔවුන්ගේ බහු විවාහයට විරෝධය දැක්වූයේ නැත. කෙසේහෝ මුහම්මද් තුමාගේ බහු විවාහය පිළිබඳව ඇතැම් ජනතාව තම විරෝධය පළ කිරීම මඟින් ඔහුගේ ජීවිතයේ සෑම හෝරාවක් පිළිබඳ තොරතුරු අප දැන සිටීමට හැකි වූ අතර, එතුමාට පෙර වක්තෘවරුන්ගේ දෛනික ජීවිතය පිළිබඳ තොරතුරු එතරම් ම නොදැන සිටිමු.

ස්කොට්ලන්ත දාර්ශනිකයෙකු හා සිනමා රචකයෙක් වූ තෝමස් කාර්ලයිල් මෙසේ සඳහන් කරයි:

අසාධාරණ ලෙස චෝදනා එල්ල වුව ද, මුහම්මද් තුමාණන් කාන්තාවන් කෙරෙහි කාමුක හැඟීමෙන් පසුවන අයෙකු නොවීය. එතුමාණන් කාමුක

අයෙකු බවත් එතුමාණන්ට සිය කාමුක හැඟීම නිවා ගැනීම හැර වෙනත් අරමුණක් නොමැති බවත් ප්‍රකාශ කිරීමේදී සාවද්‍ය චෝදනාවක් එතුමාණන් කෙරෙහි අප සිදු කරන්නෙමු. එනමුත් එතුමාණන් එවැනි චරිතයක් නොවේ. එවැනි ගුණාංගවලින් එතුමාණන් පරිශුද්ධය.

# මුහම්මද් (ﷺ)තුමාණන්ගේ ධර්ම දූතත්වය සැබෑ බව හඟවන ලිඛිත සාක්ෂි

## ශුද්ධ වූ අල්කුර්ආනය ඇසුරින්

01 උත්තරීතර අල්ලාහ් මෙසේ ප්‍රකාශ කොට ඇත:

මුහම්මද් ඔබලාගේ පිරිමින් අතුරින් කිසිවකුගේ පියකු නොවීය. නමුත් ඔහු අල්ලාහ්ගේ දූතයාණන්ය. නබිවරුන්ගේ මුද්‍රාවයි. තවද සියළු දෑ පිලිබඳව අල්ලාහ් සර්වඥානී විය.(33:40)

02 වක්තෘ මුහම්මද් තුමාගේ කථාන්තරය ගැන යේසුස් වහන්සේ ප්‍රකාශ කොට ඇති බව උත්තරීතර අල්ලාහ් පාරිශුද්ධ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

ඉස්‍රාඊල් දරුවනි! මා ඉදිරියේ ඇති තව්රාතය තහවුරු කරන්නෙකු ලෙසින් ද මගෙන් පසුව පැමිණෙන තම නාමය අහ්මද් නමැති දූතයකු ගැන ශුභාරංචි දන්වන්නකු ලෙසින් ද මම නුඹලා වෙත පැමිණ ඇති අල්ලාහ්ගේ දූතයකු වෙමි යැයි මර්යම්ගේ පුත් ඊසා පැවසූ අවස්ථාව සිහියට නගනු. එනමුත් ඔවුන් වෙත පැහැදිලි සාධක සහිතව ඔහු පැමිණ කල්හි මෙය පැහැදිලි හූනියමකි යැයි ඔවුහු පැවසූහ. (61: 6)

## නබි (ﷺ) තුමාගේ වදන් ඇසුරින්

මා හා මා පෙර විසූ ධර්ම දූතයින් සඳහා කදිම උදාහරණයක් නම් නිවසක් සම්පූර්ණයෙන් තනා එක් ගඩොලක ප්‍රමාණයක ඉඩක් ඉතිරි කළ පුද්ගලයකු මෙන්ය. ජනයින් එකී නිවස වටා එක්රැස් වී විමතියට පත් වෙමින් මෙම හිස්තැන ගඩොලක් මඟින් සම්පූර්ණ කරන්නේ නම් යහපතකි යැයි ඔහු ඉදිරියේ ප්‍රකාශ කර සිටියේය. එම ගඩොල මා

වෙමි. ධර්ම දූතවරුන් අතුරින් අවසානයා මා වෙමි යැයි නබි (සල්) තුමාණන් පවසා සිටියේය.

## පෙර තිබූ ශුද්ධ ලියවිලි ඇසුරින්

අතා බින් යසාර් (රළි) මෙසේ පවසයි:

මා, අබ්දුල්ලාහ් බින් අම්ර් බින් අල් ආස් හමුවී,අල්ලාහ්ගේ දූතයන් ගැන තව්රාතයේ සඳහන් විස්තරය ගැන මට පවසන්න! යැයි ඇසුවෙමි. ඔහු මෙසේ පිළිතුරු දුන්හ. එසේය, අල්ලාහ් මත දිවුරා පවසමි. අල් කුර්ආනයේ ඔහු ගැන සඳහන් ගති ලක්ෂණ වලින් සමහරක් භාවිතා කරමින් තව්රාතයේ ද ඔහු ගැන විස්තර කරනු ලැබ තිබේ. මෙයට නිදසුනක් ලෙස අපි ඔබ සාක්ෂිකරුවෙකුව ද සුබාරංචි කියන්නෙකුව ද අවවාද කරන්නෙකුව ද එව්වෙමු. එසේම ඉගෙනුම නොලත් ජනතාවට අරාක්ෂකයෙකු වශයෙන් එව්වෙමු. ඔබ මාගේ සේවකයා හා මාගේ පණිවුඩකරුවාය. මා ඔබට (අල් මුතවක්කිල්) අල්ලාහ් මත රඳා පවතින්නා යැයි නම් තැබුවෙමි. ඔබ අවනීත හෝ කුරිරු පුද්ගලයකු නොවන අතර වෙළඳ පොලේ ඝෝෂා නගන්නෙකුද නොවේ. ඔබට එදිරිවාදිකම් කරන්නන්ට ඔබ එදිරිවාදිකම් කරන්නේ නැත. ඔවුන් සමඟ කරුණාවන්ත ලෙස කටයුතු කරන අතර සමාව ලබා දෙන්නේය. අන්ද ඇස්, බිහිරි කන් හා වැසුනු හදවත් විවර කරන අකාරයෙන්, නැමදීමට සුදුසුකම අල්ලාහ් හැර වෙන කිසිවකුට නැත යැයි කීම තුළින් දුෂ්ට ජනයා ශිෂ්ට ජනයන් බවට පත්කරන තුරු ඔහුව අල්ලාහ් මිය යාමට සලස්වන්නේ නැත.

තවද අතා බින් යසාර් මෙසේ පවසයි:

මම රබ්බි කඅබ් හමුවූ අතර, මේ කථාව ගැන ඔහුගෙන් විමසූවෙමි. ඔහු අබ්දුල්ලා බින් අම්ර් බින් ආස් සමග විරුද්ධ නොවීය. (මූලාශ්‍රය:බයිහකී)

පාදිලිකෙනෙක් ව සිටි, පසු ව ඉස්ලාමය වැළඳගත් මහාචාර්ය අබ්දුල් අහද් දාවූද් මෙසේ සඳහන් කරයි:

ලතින්, ග්‍රීක හෝ අරාමීය භාෂා කතිකාවක් සඳහා කිසිසේත් ඉඩ නොදෙමින් හුදෙක් බයිබලය මත මාගේ තර්ක ගොඩ නැගීමට මා

උත්සාහ කරමි. බ්‍රිතාන්‍යය සහ විදේශීය බයිබල් සමාජය විසින් ප්‍රකාශයට පත් කරන ලද අනුවාදයේ වචන මා විසින් පහත දැක්වෙන උපුටා දැක්වීම සපයනු ලැබේ.

දෙවියන් මෝසෙස් තුමාණන්ට කථා කොට මෙසේ පැවසූ බව බයිබලය සඳහන් කරයි:

මම ඔවුන්ගේ සහෝදරයන්ගෙන් නුඹට සමාන අනාගත වක්තෘ කෙනෙකු ඔවුන්ට නැගිටුවා දී මාගේ වචන ඔහුගේ මුඛයෙහි තබන්නෙමි . මා ඔහුට අණ කරන සියල්ල ඔහු ඔවුන්ට කියන්නේ ය.(ද්විතීය කථාව 18:18)

මෙම වදන් මුහම්මද් (සල්) තුමාට අදාළ නොවේ නම්, ඒවා තවමත් ප්‍රත්‍යක්ෂ වශයෙන් සම්පූර්ණ නොවූ වැකි ලෙස පවතිනු ඇත. යේසුස් වහන්සේ පවා මෙයින් අදහස් කරනුයේ තමන් බව ප්‍රචාරය නොකළ අතර ඔහුගේ සමකාලීනයන් හා අනුගාමිකයින් එකී මතයෙහිම සිටියහ. ඔවුන්ගෙන් බහුතරයක් එම දිව්‍යමය අනාවැකිය සාක්ෂාත් කර ගැනීම පිණිස යේසුස් තුමාණන්ගේ දෙවන පැමිණීම බලාපොරොත්තුවෙන් සිටි.

(මම ඔවුන්ගේ සහෝදරයන්ගෙන් නුඹට සමාන අනාගත වක්තෘ කෙනෙකු ඔවුන්ට නැගිටුවා දී) යන පදමාලාව යේසුස් වහන්සේගේ පළමු පැමිණීම සඳහා සාධකයක් නොවේ. එමෙන්ම ඔහුගේ දෙවන පැමිණීම ද එකී වචනාර්ථයෙන් උපුටා ගත නොහැකිය. කිතුනු පල්ලිය මඟින් විශ්වාස කරනු ලබන්නේ යේසුස් නීති සම්පාදකයෙකු ලෙස නොව විනිශ්චයකරුවෙකු ලෙස අනාගතයේ පෙනී සිටියි යන්නයි. එනමුත් බයිබලයේ පොරොන්දුව නම් තම දකුණතෙහි නීතිය උසුලමින් නීති සම්පාදකයෙකු ලෙස පැමිණෙනු ඇත යන්නයි.

පොරොන්දු වූ අනාගතවක්තෘගේ පෞරුෂත්වය තහවුරු කිරීම සඳහා මෝසෙස් තුමාගේ අනෙක් අනාවැකිය නම් මක්කාවෙහි කඳුකරයක් වන පාරාන් සිට විහිදෙන දෙවියන්ගේ ආලෝකය යන වදන වේ. ද්විතීය කතාව පොතේ 33 වන පරිච්ඡේදයේ 2 වන පදය මෙසේ පවසයි:

සැබෑ දෙවිගේ සේවකයා වූ මෝසෙස් තම මරණයට කලින් ඊශ්‍රායෙල් සෙනඟට ආශීර්වාද කළේය. ඔහු ඔවුන්ට මෙසේ පැවසුවේය:

යෙහෝවා දෙවි සීනයි කන්දෙන් බැස ආවේය. ඔහුගේ දීප්තිය සේයිර් කඳුකරයෙන් පැමිණ ඔවුන් අතරේ පැතිර ගියේය. ඔහුගේ ආලෝකය පාරාන් කඳුකරයේ සිට විහිදී ආවේය. ඔහු සමඟ දසදහස් සංඛ්‍යාත වූ ඔහුගේ ශුද්ධ දේවදූතයෝ සිටියෝය. දකුණත ගිනි දැල්ලක් (එනම් නීතියක්)සමඟ වැඩියේය.

මේ වදන් තුළ  දෙවියන් දීප්තියක් සමග සංසන්දනය කර ඇති අතර දෙවි සීනයි කන්දෙන් බැස ආ බවත් ඔහුගේ දීප්තිය සේයිර් කඳුකරයෙන් පැමිණ ඔවුන් අතරේ පැතිර ගිය බවත් ඔහුගේ ආලෝකය පාරාන් කඳුකරයේ සිට විහිදී ආ බවත් ඔහු සමඟ දසදහස් සංඛ්‍යාත වූ ඔහුගේ ශුද්ධ දේවදූතයෝ සිටි බවත් සඳහන් වේ.

යේසුස් ඇතුළුව කිසිම ඉශ්‍රායේල්වරයෙකුට පාරාන් සමඟ සම්බන්ධයක් තිබුණේ නැත. හගර් (හාජර්) ඇගේ පුත් ඉෂ්මායෙල් සමඟ බෙයර් - ෂෙබාහි කාන්තාරයෙහි සැරිසරමින් සිටි අතර පාරාන් නම් පාළුකරයේ වාසය කළ බව බයිබලයේ උත්පත්ති කථාව 21:21 හි සඳහන් වේ.

ඉෂ්මායෙල් ඊජිප්තු කාන්තාවක් සමඟ විවාහ වූ අතර  ඔහුගේ කුලුඳුල් පුත්‍රයා වන කේදාර්ගේ (අද්නාන්) පරම්පරාව වන අරාබිවරුන් එදා සිට අද දක්වා පාරාන් පාළුකරයේ වාසය කරති. ඒ අනුව මුහම්මද් නබි තුමාණන් සියල්ලෝම දන්නා පරිදි ඉෂ්මායෙල් හා ඔහුගේ පුත්‍රයා වන කේදාර්ගේ පරම්පරාවෙන් පැවත ආ කෙනෙකු නම්, එමෙන්ම එතුමාණන් මක්කාවෙහි කඳුකරයක් වන පාරාන් කඳුකරයේ සිට දස දහස් ගණනින් යුක්ත දේව විශ්වාසවන්තයින් සමඟ ධර්ම දූතයෙකු ලෙස නව නීතියක් සම්පාදනය කරමින් මක්කාවෙන් හෙළි වූයේ නම් මෙය නොවේද ඉහත සඳහන් වූ බයිබල් පදය මඟින් අදහස් කරනු ලබන්නේ?

බයිබල්හි හබක්කුක් පොතෙහි (3: 3) සඳහන් අනාවැකියේ වචන විශේෂයෙන් සැලකිය යුතු ය.

ශුද්ධ තැනැත්තාණන් පාරාන් කන්දේ සිට පැමිණියේය. ඔහුගේ තේජසින් මුළු අහස්තලයම වැසී ගියේය. ඔහුට ලැබුණු ප්‍රශංසා පොළොවේ එක් කෙළවරක සිට අනික් කෙළවර දක්වා පැතිර ගියේය.

මෙහි සඳහන් ප්‍රශංසාව යන පදය ඉතා වැදගත් පදයකි. මන්දයත් අවසාන වක්තෘවරයාණන්ගේ නාමය වන මුහම්මද් යන වචනයෙහි

අර්ථය නම් ප්‍රශංසාවට ලක් වූ තැනැත්තා වේ.

පාරාන්හි වැසියන්ට එනම් අරාබිවරුන් සඳහා දිව්‍යමය එළිදරව්වක් පහළ වන බව බයිබලයේ මෙසේ සඳහන් වේ.

සමිඳුන් හට නව ගීයක් ගයන්න. මුළු ලොව පුරා පැසසුම් පතුරුවා හරින්න. මුහුදේ යාත්‍රා කරන එහි ජීවත් ව සිටින ද්වීප හා මුහුදුබඩ වැසියෙනි! සමිඳුන් හට පැසසුම් කරන්න. කාන්තාරය හා එහි නගර ද කේදාර්හි සිටින සෙනඟ ද සේලා නගර වැසි සියල්ලෝ ද කඳු මුදුන්වල සිට ප්‍රීති ඝෝෂා නඟත් වා! ද්වීප හා මුහුදුබඩ වැසියෙනි! සමිඳුන් හට පැසසුමත්, එතුමන් හට මහිමයත් පිරිනමත් වා! සමිඳාණෝ බලවතෙකු සේ නික්ම එන සේක. එතුමාණෝ රණ වීරයෙකු සේ දිරිගන්වන සේක. රණ හඬ පතුරා, සිහ නද නඟා, සතුරන් අබිබවා සිය බලය පෙන්වන සේක. (යෙසේයා: 42:10-13)

මෙම මාතෘකාව යටතේ බයිබල්හි සඳහන් කේදාර් (අද්නාන්) පිළිබඳ අනාවැකි යුවලක් කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.

පළමුවන අනාවැකිය:

ස්ත්‍රිය! නැඟිට ඔබේ ආලෝකය විහිදුවන්න. මන්ද ඔබට ආලෝකය උදා වී ඇත. යෙහෝවා දෙවිගේ තේජස ඔබ වටේට බැබළෙයි. පොළොව අඳුරෙන් වැසී යයි. ඝන අන්ධකාරය ලෝවැසියන්ව වෙළාගනියි. එහෙත් ඔබ මත යෙහෝවා දෙවිගේ ආලෝකය බැබළෙයි. ඔහුගේ තේජසද ඔබෙන් දිස් වෙයි. ඔබේ දීප්තිමත් ආලෝකය වෙතට විවිධ ජාතීහුද රජවරුද ඇදී එන්නෝය . ඔබේ දෙනෙත් ඇර වටපිට බලන්න! ඒ සියල්ලන්ම එකතු වී ඔබ වෙතට පැමිණෙන බව ඔබට පෙනෙයි. දුර ඈත සිට පැමිණෙන ඔබේ පුත්‍රයන් දෙස බලන්න. ඔවුන් ඔබේ දූවරුන්ව උකුළේ තබාගෙන සුරැකිව රැගෙන එන ආකාරය දෙසත් බලන්න. එය දැක ඔබේ මුහුණ දීප්තිමත් වෙයි. ඔබේ සිත සතුටින් පිරී ඉතිරී යයි. මන්ද සමුද්‍රයේ සියලු සම්පත්ද ජාතීන්ගේ වස්තූද ඔබට හිමි වෙයි. මිදියන් සහ ඒෆාහි තරුණ ඔටුවන්ගෙන් ඔබේ දේශය පිරී යයි. ෂෙබා දේශයේ සිට ඔටුවන් පිට නැඟී අතිමහත් පිරිසක් පැමිණෙති. රන්ද කට්ටකුමංජල්ද රැගෙන එන ඔවුහු සියල්ලන් ඉදිරියේ යෙහෝවා දෙවිට ප්‍රශංසා කරති. කේදාර් ගෝත්‍රිකයන්ගේ මුළු සත්ව රැළම ඔබ වෙතට රැගෙන එනු ඇත. නෙබායොත් ගෝත්‍රිකයන්ගේ බැටළුවනුත්

ඔබේ ප්‍රයෝජනය සඳහාය. මාගේ පූජාසනය මත තබන උන්ව මම පිළිගන්නෙමි. මෙසේ, මම මාගේ ගෘහයේ අලංකාරය තව තවත් වැඩි කරන්නෙමි. (යෙසායා: 60: 1-7)

## දෙවන අනාවැකිය:

පාළුකරයට විරුද්ධව දුන් තීන්දුව මෙයයි. දෙදාන් ගෝත්‍රයට අයත් තවලම්කරුවෙනි! පාළුකරයේ පිහිටි වනයක ඔබට රාත්‍රිය ගත කරන්න සිදු වෙයි.ග තේමා දේශයේ වැසියෙනි! පිපාසිතයන්ට බොන්න වතුර දෙන්න. පලා යන අයව මුණගැසී ඔවුන්ට කෑමට යමක් දෙන්න. මන්ද සතුරෝ ඔවුන්ට විරුද්ධව යුද්ධයට සැරසී ඇත.කඩුවෙන්ද දුන්නෙන්ද මැරුම් නොකන පිණිස ඔවුහු පලා යන්නෝය. යෙහෝවා දෙවි මට මෙසේ කියා තිබේ. කුලීකරුවෙකුගේ සේවා කාලය නිම වන දවස නිශ්චිත වන්නාක් මෙන් තව අවුරුද්දකින් කේදාර් ගෝත්‍රිකයන්ගේ තේජස මුළුමනින්ම පහ වී යයි. (යෙසායා: 21: 13-17)

යේසායා පරිච්ඡේදයේ සඳහන් ඉහත සඳහන් අනාවැකි යුවල පාරාන් කඳුකරයෙන් පැමිණෙන දීප්තිය පිළිබඳ කථාකරන බයිබල්හි වෙනත් පරිච්ඡේදයන් සමඟ සසඳමින් කියවා බලන්න.

ඉෂ්මායෙල් පාරාන් නම් පාළුකරයේ ජීවත් වූවා නම්, ඔහු අරාබිවරුන්ගේ මුතුන්මිත්තෙකු වූ කේදාර්ට උපත ලබා දුන්නේ නම්, කේදාර්ගේ පරම්පරාව සඳහා දෙවියන්ගෙන් එළිදරව්වක් පහළ වූයේ නම්, තවද ඉහත සඳහන් බයිබල් වැකිවල සඳහන් අනෙකුත් අනාවැකි සසඳා බැලීමේදී ඒවා සඳහා මුහම්මද් (සල්) තුමාණන් හැර අන් කිසිවෙක් සුදුසුකම් නොලබන බව සත් සුදක් සේ පැහැදිලි නොවන්නේද?

## බයිබලෙහි අළුත් ගිවිසුම ඇසුරින් සාක්ෂි:

නව ගිවිසුමේ කොටස් ගණනාවක්ම මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ගේ පැමිණීම පිළිබඳ ඔහුගේ ක්‍රියාකාරිත්වයේ හා ක්‍රියාකාරකම්වල ස්වභාවය පෙන්වා දෙමින් පැහැදිලිව සඳහන් වේ.

යුදෙව්වරුන්ගේ නායකයන් යෙරුසලමේ සිටි පූජකයන්ව සහ ලෙවීවරුන්ව යොහන් වෙතට යවා,"ඔබ කවුද" කියා ඔහුගෙන් ඇසූ විට ඔහු දුන් සාක්ෂිය මෙයයි. 20) මම ක්‍රිස්තුස් නොවෙයි කියා ඔහු

නොසඟවාම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය. 21) එවිට ඔවුහු, එහෙමනම් ඔබ කවුද? ඔබ එලියාද? කියා ඔහුගෙන් ඇසූහ. එවිට ඔහු මම එලියා නොවෙයි, කියා පිළිතුරු දුන්නේය. එන්න සිටින අනාගතවක්තෘවරයා ඔබද? කියාත් ඔවුහු ඇසුවෝය.එයටත් ඔහු, නැහැ කියා පිළිතුරු දුන්නේය. 22) එහෙයින් ඔවුහුඃ එහෙමනම් ඔබ කවුද? අපව එවූ අයට අප පිළිතුරක් දිය යුතුයි. ඔබ ගැන ඔබට කියන්න තිබෙන්නේ මොනවාද, කියා ඔහුගෙන් ඇසූහ. 23) ඔහු මෙසේ පිළිතුරු දුන්නේය. අනාගතවක්තෘ යෙසායා පැවසූ දේ ඔබට මතකද? ඔහු කිව්වේ යෙහෝවා දෙවිගේ මඟ සමතලා කරන්න කියා යමෙක් පාළුකරයේ සිට හඬ නගන්නේය කියායි. ඒ තැනැත්තා මමයි. 24) යොහන් වෙතට එවූ ඒ අය පරිසිවරුන්ය. 25) ඔවුහුද ,ඔබ ක්‍රිස්තුස්වත් එලියාවත් එන්න සිටින අනාගතවක්තෘවරයාවත් නොවෙයි නම් ඇයි ඔබ මිනිසුන්ව බව්තීස්ම කරන්නේ? කියා ඔහුගෙන් ඇසූහ. (යෝහන්ඃ 1ඃ 20-25)

මෙම පරිච්ඡේදය තුළ සඳහන් වක්තෘවරයා යේසුස් තුමාණන් නොවේ. ඔහු මුහම්මද් (සල්) තුමාණන් ය. මන්දයත් යෝහන් යේසුස් තුමාණන්ගේ ජීවිත කාලය තුළම එම අනාගතවක්තෘවරයාගේ පැමිණීම දේශනා කර බව්තීස්ම කිරීම සහ පුරෝකථනය කරමින් සිටි බැවිනි.

## යේසුස් තුමාණන් ප්‍රකාශ කළ දෑඃ

අනාගතවක්තෘවරයෙකුගේ පැමිණීම ගැන යේසුස් තුමාණන් අනාවැකි පළ කළේ මේ අයුරිනිඃ

‘I will pray the Father, and He shall give you another Comforter(Periqlytos), that he may abide with you forever.’

මම පියාණන්ගෙන් තවත් ඉල්ලීමක් කරනවා. එවිට ඔබේ උපකාරයට ඔහු යමක් එවයි. ඒ දේ ඔබට සැමදා උපකාරයක් වෙයි (යෝහාන් 14:16)

Periqlytos යන ග්‍රීක වචනයේ අර්ථය, කීර්තිමත්, යන්නයි. අහ්මද් යන අරාබි වචනයේ අර්ථයද මෙයයි. අහ්මද් නමින් නබිවරයෙකු එතුමා පසුපස පැමිණෙන බව යේසුස් තුමාණන් අනාවැකි පළ කළ බව අල් - කුර්ආනයෙහි තහවුරු වී ඇතඃ

ඉස්‍රායීල්ගේ දරුවනි! මම නුඹලා වෙත (එවන ලද) අල්ලාහ්ගේ දූතයා වෙමි.

මට පෙර පැවති තව්රාතය සත්‍ය කරවන්නෙක්මි.මට පසුව පැමිණීමට නියමිත අහ්මද් නමැති දූතයෙක් ගැන සුබාරංචි කියන්නෙක් මි" යි මර්යම්ගේ පුත් ඊසා කී සැටි සිහි කරන්න. ඔවුන් වෙත පැහැදිලි සාධක ගෙන ආ විට මෙය පැහැදිලි හූනියමක් යැ"යි ඔවුහු පැවසූ.:61:6)

# අල්ලාහ්ගේ දූතයාණන්ගේ දූතත්වය තහවුරු කරන බුද්ධිමය සාධකයන්

**01** මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ අකුරු ලිවීමට හෝ කියවීමට නොදත් අයෙකු වේ.

ඔහු කියවීමට හෝ ලිවීමට නොදත් අයෙකු වේ. ඔහු කියවීමට හෝ ලිවීමට නොදත් මිනිසුන් අතර ජීවත් විය. එමනිසා, අල්කුර්ආනය මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමා විසින් ලියනු ලැබූ බව ප්‍රකාශ කළ නොහැක. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ ප්‍රකාශ කරයි:

(නබිතුමණි) ඔබ මීට පෙර කිසිම ධර්මයක් කියවන්නෙකු නොව. ඔබගේ දකුණතින් ඔබ එය ලියා (පුරුදු පුහුණු වූ) කෙනෙකුද නොව. එසේ වූවේ නම්, (මෙම බොරුකාරයින්) මෙය ඔබ විසින් තමන්ම මනක්කල්පිත කර ගත්තා මිස, දෙවියන් විසින් පහළ කළ දැයක් නොව යයි, සැක සිතිය හැකිය. (29:48)

**02** අරාබි වරුන් වෙත අල්කුරානයට සමාන යමක් ගෙන එනු මෙන් අභියෝග කළ ද එවැන්නක් ඔවුන්ට ගෙන ඒමට නොහැකි විය.

අල් කුර්ආනයෙහි අලංකාරය, එහි ව්‍යුහය හා ගැඹුරු අර්ථයන් අරාබිවරුන්ව මවිතයට පත් කළේය. මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ සදාකාලික ආශ්චර්යය වන්නේ අල් කුර්ආනය යි. ඒ පිළිබඳ එතුමාණන් මෙසේ වදාල ඇත:

මට පෙර විසූ ධර්ම දූතයින්ගේ ප්‍රාතිහාර්යයන් ඔවුන්ගේ කාලයට පමණක් සීමා වී ඇත. මා හට ලබා දී ඇති ප්‍රාතිහාර්යය වන්නේ සදාකාලික වූ කුර්ආනයයි. එබැවින්, මා වඩාත් අනුගාමිකයන් පිරිසක් සිටින ධර්ම දූතයෙකු වීමට බලාපොරොත්තු වෙමි. (බුහාරි)

මුහම්මද් (සල්ලල්ලාහු අලෛයිහි වසල්ලම්) තුමාණන්ගේ කාළයෙහි ජීවත්වූ ජන සමූහය විශිෂ්ට ලෙස කාව්‍ය නිර්මාණ සඳහා ප්‍රසිද්ධව සිටිය ද, උත්තරීතර අල්ලාහ් අල්කුර්ආනයට සමාන පොතක් ගොණු කරනු මෙන් ඔවුනට අභියෝග කළ නමුත් ඔවුනට එය කළ නොහැකි විය. ඉන්පසු ඒ හා සමාන එක් පරිච්ඡේදයක් ගොණු කරනු මෙන් අභියෝග කළේය. එයටද ඔවුන් අපොහොසත් විය. ඒ පිළිබඳ ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

අපගේ වහලා (මුහම්මද්) ට අපි පහළ කළ දැයෙහි නුඹලා සැක කොට (එහි) නුඹලා සත්‍යවන්තයින් නම් මෙවැනි පරිච්ඡේදයක් ගෙන එන්න.(ඒ සඳහා) අල්ලාහ් හැර නුඹලාගේ සෙසු සහකරුවන් ද කැඳවා ගන්න.(2:23)

තවද සමස්තයක් ලෙස අල්ලාහ් මුළු මානව වර්ගයාටම අල්කුර්ආනය හා සමාන යමක් ගෙන එනු මෙන් අභියෝග කරයි:

"මොහු මෙය ප්‍රබන්ධ කළේ යැ" යි ඔවුහු පවසන්නෝ ද? එසේ නොවේ. ඔවුහු විශ්වාස නොකරති. ඔවුන් සත්‍යවන්තයින් නම් මෙවැනි පුවතක් ඔවුහු රැගෙනෙත්වා. (52:33-34)

03 මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ නොකඩවා ශුභාරංචිය දේශනා කරමින් ජනයා අමතා ඉස්ලාමය වෙත කැඳවූ අතර ඒ හේතුවෙන් ඔහුට දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදු වුණි.නබි (සල්) තුමාණන් දිගටම ශුභාරංචිය දේශනා කරමින්, ඉවසිලිවන්තව සිටියේය. ඔහු වංචාකරුවෙකු නම් ඔහු සිය ජීවිතයට භයවී දේශනා කිරීම නවතා තබන්නට තිබුණි.

ආචාර්ය ඩබ්.මොන්ට්ගොමරි වොට් [10] මෙසේ සඳහන් කරයි:

ඔහු ඉදිරිපත් කළ විශ්වාසයන් ඉදිරියේ වධහිංසා පැමිණෙන බව දැන දැනත් ඒ සඳහා තිබූ ඔහුගේ පෙර සූදානම, ඔහු කෙරෙහි විශ්වාස කළ මිනිසුන්ගේ උසස් සදාචාර චරිතය සහ ඔවුන් නායකයෙකු ලෙස ඔහුව රැක බලා බැලීම සහ ඔහුගේ අවසන් ජයග්‍රහණයේ ශ්‍රේෂ්ඨත්වය

10. විලියම් මොන්ට්ගොමරි වොට් ස්කොට් ජාතික ඉතිහාසඥයෙක්, ප්‍රාචීන ශාස්ත්‍රඥයෙක් සහ ඇන්ග්ලිකන් පූජකයකු විය. ඔහු එඩින්බර්ග් විශ්ව විද්‍යාලයේ අරාබි හා ඉස්ලාම් අධ්‍යයන පිළිබඳ මහාචාර්යවරයෙක් විය.

යනාදී සියල්ලම ඔහුගේ මූලික අවංකභාවය පිළිබඳ කරුණු ගෙනහැර දක්වයි. එපමණක් නොව, මුහම්මද් තුමාණන් මෙන් ඉතිහාසයේ නොයෙකුත් ශ්‍රේෂ්ඨ පුද්ගලයන් බටහිර රටවල් තුළ ඉතා දුර්වල ලෙස අගය කොට ඇත. එබැවින්, මුහම්මද් තුමාණන් පිරිසිදු චේතානාවකින් හා සත්‍යතාවයෙන් පිරිපුන් කෙනෙකු ලෙස පමණක් සඳහන් නොකර අප ඔහුව තේරුම්ගත යුතු නම්, එසේම එතුමා පිළිබඳ අතීතයෙන් උරුම වී ඇති වැරදි මත අප විසින් නිවැරදි කිරීමට නම්, අසත්‍ය වුවද සත්‍යයක් මෙන් පෙනෙන කරුණු වලට වඩා ස්ථිරසාර සාක්ෂි පිළිබඳ වඩා සැලකිලිමත් වීම අත්‍යවශ්‍යයි.

04 ලෞකික ජීවිතයේ දී සෑම පුද්ගලයෙක් විසින්ම විසිතුරු භාණ්ඩ හා අලංකාරයට ඇලුම් කරනු ඇති අතර ඔවුන් සියල්ල මෙවන් විෂයන් කෙරෙහි වසඟ වනු ඇත.

උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ ප්‍රකාශ කරයි:

ස්ත්‍රීන්, පිරිමි දරුවන්, රැස් කරන ලද රන් හා රිදී ගොඩවල්, දැකුම්කළු අශ්වයින්, සිවුපාවුන් හා වගා බිම් ආදී සිත් පිනවන සුළු දේවලට ඇලුම් කිරීම මිනිසුන්ට අලංකෘත කර ඇත. මේවා හුදෙක් ම මෙලොව ජීවිතයේ සැප සම්පත් ය. අල්ලාහ් වෙත අලංකාර වාසස්ථානය ඇත. (3:14)

මිනිසා ස්වභාවයෙන්ම, මේ ලෝකයේ සුඛෝපභෝගීත්වය සහ සුන්දරත්වය රස විඳීමට ඇලුම් කරයි. මේ දේවල් අත්පත් කර ගැනීමට භාවිතා කරන ක්‍රමය අනුව මිනිසුන් එකිනෙකාට වෙනස් වේ. සමහරුන් මේ දේවල් ලබාගැනීමට නීත්‍යානුකූල ක්‍රම යොදාගන්නා අතර අනෙක් අය මේ දේවල් අත්පත් කර ගැනීමට නීති විරෝධී ක්‍රම යොදාගනී.

නබි තුමාගේ කාලයේ කුරෙයිෂ් ගෝත්‍රයට අයත් ධනවත් හා ගෞරවාන්විත ඇතැම් පුද්ගලයින් විසින් ඉස්ලාමය වෙත කැඳවීමේ මෙහෙවර නතර කිරීම වස් එතුමාණන්ව ඒත්තු ගැන්වීමට උත්සාහ කරන ලදී. කුරෙයිෂ් ගෝත්‍රයේ නායකයෙකු බවට පත් කරනු ඇති බවත්, වඩාත් ලස්සන ගැහැණු කතුන් සමග විවාහ කරවා දෙන බවත්, ඔවුන් අතරේ පොහොසත්ම මිනිසෙකු බවට පත් කරන බවත් ඔවුහු නබි තුමාණන් ඉදිරියේ පැවසූහ. එනමුත් එතුමාණන් මෙම ආකර්ෂක

පෙළඹවීම්වලට ප්‍රතිචාර දක්වන්නේ මේ අයුරිනි.

මෙකී මෙහෙවර අත්හැර දමනු වස් මාගේ දකුණතෙහි සූර්යයා ද වමතෙහි චන්ද්‍රයා ද තබනු ලබන්නේ නම් උත්තරීතර අල්ලාහ් එය සර්ව සම්පූර්ණ කරන තෙක් හෝ එකී මෙහෙවර සමාජයට ප්‍රචාරය කරමින් සිටියදී මා ඝාතනය වන තෙක් එය මා අත්නොහරිනු ඇත. (ඉබ්නු හිෂාම්)

නබි (සල්) තුමාණන් ප්‍රෝඩාකාරයකු නම් මෙම දීමනාවන් එතුමාණන්ගේ ජීවිතය සුඛෝපභෝගී ලෙස ගත කිරීම සඳහා උපයෝගී වන හෙයින් ඒවා පිළිගන්නට තිබුණි.

05 යම්කිසි රාජධානියක සියළු පහසුකම් හා ධන සම්පත් රජතුමාගේ කැමැත්තට සහ ඔහුගේ සේවාවන් වලට යටත් බව හොඳින් දන්නා කරුණකි.

මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් මේ ජීවිත කාලය තාවකාලික වේදිකාවක් බව දැන සිටියේය.අබ්දුල්ලාහ් (රළි) තුමාණන් මෙසේ ප්‍රකාශ කරයි:

නබි (සල්) තුමාණන් පැදුරක් මත නිදා ගනිමින් සිටියේය. ඒ හේතුවෙන් ඔහුගේ පිටහි එම පැදුරෙහි රේඛාවන් දක්නට ලැබුනි. එය දුටු මා අල්ලාහ්ගේ දූතයාණෙනි! ඔබ නිදා සිටින මේ පැදුර මත ඇඳ ඇතිරිලි තැබීමට ඉඩ දෙන්න. එමගින් ඔබේ පිටට එය බලපෑමක් නොවෙනු ඇත යනුවෙන් පැවසුවෙමි. එය ඇසූ මුහම්මද් (සල්) තුමාණන්: මේ ජීවිතයට සාපේක්ෂව මාගේ ආදර්ශය නම් ගසක සෙවනක යට විවේකයක් ලබා ගන්නා මගියෙකු මෙන්ය. විවේකය ලබා ගත් පසු ඔහු සිය ගමන නැවත ආරම්භ කරනු ඇත. (ඉබ්නු මාජාහ්)

නුමාන් ඉබ්නු බෂීර් (රළි) තුමාණන් වරක් මෙසේ ප්‍රකාශ කළේය:

ඔබලාගේ නබිඳුන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ව දවසක් මා දුටුවෙමි. එතුමාණන්ගේ කුස පිරවීම සඳහා රටඉඳි ස්වල්පයක් පවා සොයා ගැනීමට එතුමාණන් හට නොහැකි විය.(මුස්ලිම්)

අබූ හුරයිරා (රළි) තුමාණන් මෙසේ සඳහන් කරයි:

අල්ලාහ්ගේ දූතයාණන් මරණය දක්වා අඛණ්ඩව දින තුනක් ඔහුගේ

කුසගිනි නිවෙන තරම් ආහාර නොගත්තේය. (බුහාරි)

අරාබි අර්ධද්වීපය එතුමාගේ පාලනය යටතේ තිබුණ ද, ජනයාට යහපත්කමෙහි උල්පතක් ලෙස එතුමාණන් ජීවත් වුවද, එතුමාණන් සඳහා ඇතැම් විට කුස ගින්න නිවා ගැනීම සඳහා ආහාර ප්‍රමාණවත් නොවනු ඇත.

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ බිරිඳ වන ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ ප්‍රකාශ කරන ලදී: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් යුදෙව්වෙකුගෙන් පසු ගෙවීමේ ක්‍රමයට සමහර ආහාර මිල දී ගත් අතර ඇපයක් ලෙස සිය ආයුධය ඔහුට ලබා දුන්හ. (මුස්ලිම්)

මෙයින් අදහස් කරනු ලබන්නේ, එතුමාණන්ට අවශ්‍ය දේ ලබා ගැනීම නොහැකි වූ බව නොවේ. නිදසුනකට,රන් කාසි සහ ධන සම්පත් එතුමාගේ මස්ජිදය ඉදිරියේ තබනු ඇති අතර ඒවා අවශ්‍ය දුප්පත් ජනයා අතර බෙදා දෙන තෙක් එතුමාණන් තම ස්ථානයෙන් ඉවත් නොවී ය. එතුමාගේ අනුගාමිකයන් අතර ධනවත් හා පොහොසත් උදවිය එතුමා වෙනුවෙන් සේවය කිරීමට ඉක්මන් වූ අතර ඔහු වෙනුවෙන් වඩාත්ම වටිනා දේ අතහැර දැමීමට සූදානම් විය. එසේ තිබියදීත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මේ ලෝකයෙහි ධනවත්කම අත්හැරියේ ලෞකික ජීවිතයේ යථාර්ථය එතුමාණන් හොඳින් දැන සිටි නිසාය. එතුමාණන් මෙසේ වදාලය:

මරණින් මතු ජීවිතයට සාපේක්ෂව ලෞකික ජීවිතය සඳහා කදිම නිදසුනක් නම්: සාගරයක් තුළ තම ඇඟිල්ලක් ගිල්වා ගත් පුද්ගලයකු ඔහු සිය ඇඟිල්ල ආපසු ගත් විට එහි තැවරුනු ජල ප්‍රමාණය කොපමණක්දැයි දකින්නේද ඒහා සමාන වේ. (මුස්ලිම්)

බොස්වර්ත් ස්මිත් එතුමාණන් පිළිබඳ මෙසේ පවසයි:

නිවැරදි දිව්‍යමය මඟපෙන්වීමකින් යුතු පාලනයක් අත් පත් කළ පුද්ගලයකු සිටින්නේ නම් එය මුහම්මද් තුමාණන් පමණකි. මන්දයත් ඉතා විශාල හමුදාවකගේ හෝ වෙනත් බලතල වල සහයක් නොතිබුණද, සියළු බලතල එතුමාණන් සතුව තිබුණි. එතුමාණන් බලය රඳවා තබා හැඩගැන්වීම පිළිබඳ සැලකිලිමත් වූයේ නැත. ඔහුගේ පෞද්ගලික

ජීවිතයේ සරලභාවය ඔහුගේ පොදු ජීවිතයට ද අනුකූල විය.

06

දෙවියන් අල්ලාහ්ගේ වක්තෘවරයාණන් ඉදිරියේ යම්කිසි සිදුවීමක් සඳහා පැහැදිලි කිරීමක් අවශ්‍ය වූ කල්හි, ඒ පිළිබඳව යම් දිව්‍යමය හෙළිදරව් කිරීමක් නොමැති අවස්ථාවක් වේ නම් එකී විෂය සම්බන්ධව යම් දිව්‍යමය හෙළිදරව්වක් පහළ වෙන තෙක් ඒ පිළිබඳ ඔහු කිසිවක් නොපවසා සිටිනු ඇත.

මෙම කාලය තුළ (සිද්ධිය හා දිව්‍යමය හෙළිදරව්ව පළ වන කාලය) එතුමාණන් විඩාපත් වනු ඇත. එයට ආසන්නම සිදුවීමක් නම් ආඉෂා (රළි) තුමිය පිළිබඳ පටබැඳුණු සිදුවීමයි. මාසයක කාළයක් ඒ සිදුවීම පිළිබඳ කිසිදු දිව්‍යමය හෙළිදරව්වක් පහළ නොවීය. ඔහුගේ සතුරන් එතුමන් පිළිබඳ නොයෙකුත් කථාවන් කියන්නට පටන් ගත්හ. ආඉෂා (රළි) තුමියගේ සත්‍යවන්තභාවය පිළිබඳ හෙළිදරව්ව පහළ වූයේ ඉන් පසුවයි. එතුමාණන් ප්‍රෝඩාකාරයකු නම් මේ අයුරින් දිව්‍යමය හෙළිදරව්ව බලාපොරොත්තු නොවී සැනින් මේ ප්‍රශ්නය සඳහා විසඳුමක් ලබා දෙන්නට තිබුණි. උත්තරීතර අල්ලාහ් ශුද්ධ වූ අල්කුර්ආනයේ මෙසේ සඳහන් කරයි:

ඔහු චිත්තාභිලාෂයට අනුව කථා නොකරයි. (53:03)

07

මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ එතුමාව ප්‍රශංසා කරන්නැයි ජනයාගෙන් ඉල්ලා සිටියේ නැත.

එසේම යම්කිසි පුද්ගලයෙකු ඔහුට කිසියම් ආකාරයක ගෞරවයක් ලබා දෙන්නේ නම් ඒ පිළිබඳවද නබි (සල්) තුමාණන් සතුටු නොවනු ඇත. අනස් (රළි) තුමාණන් විසින් මෙසේ වාර්තා කරන ලදී.

අනුගාමිකයන් හට අල්ලාහ්ගේ දූතයාණන්ට වඩා ප්‍රියමනාප වූ කිසිම කෙනෙකු නොසිටීය. එසේ තිබියදීත් එතුමාණන් ඔවුන් අතර පැමිණෙන විට එතුමාණන්ව ගෞරවය කිරීම පිණිස ඔවුන් අතුරින් කවරෙකු හෝ නැගී සිටින්නේ නැත. මන්දයත් ඒ අයුරින් නැගිටී සිටීම පිළිබඳ නබි(සල්) තුමාණන් කැමති නොවන බව ඔවුන් සියල්ල දැනුවත් බැවිනි.

වොෂින්ටන් ඉර්වින් මෙසේ පවසයි:

ඔහුගේ හමුදාමය ජයග්‍රහණයන් ආත්මාර්ථකාමි අරමුණු ඉටු කර ගෙන

නොතිබුනු හේතුවෙන්, කිසිදු ආඩම්බරයක් හෝ නිෂ්ඵල ගෞරවයක් ඔහු තුළ දක්නට නොලැබිණි. දුෂ්කර කාලවලදී මෙන් ම ඔහු සිය ශ්‍රේෂ්ඨතම බලයේ සිටියදී ද ගතිගුණ හා බාහිර පෙනුම සරල ලෙස පවත්වා ගෙන ගියහ. කෙසේදයත් එතුමණ් සතුව රාජ්‍ය බලය තිබියදී ඔහු වෙත කවරෙකු හෝ පැමිණ එතුමණ් කෙරෙහි සීමාව ඉක්මවා ගෞරවය දැක්වීම හෝ අසාමාන්‍ය ලෙස ප්‍රශංසා කිරීම එතුමාණන් අසතුටට පත් වන කරුණක් විය.

**08** ඇතැම් සිදුවීම් හේතුවෙන් නබි (සල්) තුමාණන් හට අවවාද කිරීමක් වශයෙන් අල්කුර්ආනයෙහි සමහර වාක්‍යයන් පහළ විය. එවැනි වාක්‍ය වලින් සමහරක් පහත දැක් වේ.

**A** නබිවරය! අල්ලාහ් ඔබට අනුමත කළ දැය ඔබේ භාර්යාවන්ගේ තෘප්තිය තකා ඔබ තහනම් කර ගන්නේ ඇයි? අල්ලාහ් ක්ෂමා කරන්නෙකි. අසම සම දයාවන්තයෙකි. (66:01)

එතුමාගේ සමහර භාර්යාවන්ගේ හැසිරීම හේතුවෙන් එතුමාණන් මී පැණි අනුභව කිරීමෙන් වැළකී සිටියේය. දෙවියන් අල්ලාහ් විසින් නීත්‍යානුකූල කර ඇති දෙය තමන් විසින් තහනම් කළ නිසා මෙම අල්කුර්ආන් වැකියෙන් එතුමාණන් අවවාද කෙරිණි.

**B** (මුහම්මද්!) අල්ලාහ් ඔබ ක්ෂමා කළේය. සත්‍ය පවසන්නන් කවුරුන් දැයි ඔබට පැහැදලි වී අසත්‍ය පවසන්නන් කවුරුන්දැයි ඔබ අවබෝධ කර ගන්නා තුරු ඔබ ඔවුනට අවසර දුන්නේ ඇයි? (9:43)

මෙහිදී අල්ලාහ් නබිතුමාට අවවාද කළේ තබූක් සටනෙහි පසුබට වූ කුහකයන් ප්‍රකාශ කළ අසත්‍ය කරුණු එතුමාණන් විසින් ක්ෂනිකව පිළිගත් නිසාය. ඔවුන් ඉදිරිපත් කළ නිදහසට කරුණු තහවුරු නොකරමින් එතුමාණන් විසින් ඔවුන්ට සමාව දෙන ලදී.

**C** තමන් වෙතට ඒ අන්ධයා පැමිණි නිසා මොහු (මුහම්මද්) අප්‍රසන්න ගතියක් දැක්විය. නොසලකා හැරියේ ය. ඔහු පිවිතුරු කෙනෙක් විය හැකි යැයි (මුහම්මද්) ඔබ දන්නේ කෙසේ ද? නැතහොත් ඔහු අනුශාසනාවක් ලැබිය හැකිය. ඒ අනුශාසනාව ඔහුට ප්‍රයෝජනවත් විය හැකිය.(80:1-4)

උම්මි මක්තූම් නැමැත්තාගේ පුත්‍රයා වන අබ්දුල්ලාහ් ඇස් අන්ධ කෙනෙකි. නබි නායක (සල්) තුමාණන් උසස් කුලයක් සමඟ කථා කරමින් සිටි සභාවකට පැමිණ මොහු නබි නායක (සල්) තුමාණන්ට සලාම් කීවේය. එවිට නබි නායක (සල්) තුමාණන් කෝපයට පත් වී මුහුණ ඔරවා ගත් හ. ඒ පිළිබඳ අවවාද කරමින් ඉහත සඳහන් අල්කුර්ආන් වැකිය පහළ විය.

එතුමාණන් ප්‍රෝඩාකාරයකු නම් මෙවැනි අවවාද සඳහන් වාක්‍ය අල්කුර්ආනය තුළ දක්නට නොහැකි වේ.

මුහම්මද් මාර්මුදුකේ පික්ටෝල් [11] මෙසේ සඳහන් කරයි: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් කුරෙයිෂ් ගෝත්‍රයට අයත් ශ්‍රේෂ්ඨ පුද්ගලයකු සමග ඉස්ලාමයේ සත්‍යතාව පිළිබඳ ඒත්තු ගැන්වීමට උත්සාහ කරමින් සංවාදයක යෙදී සිටියදී, අන්ධ මිනිසෙකු ඇවිත් විශ්වාසය පිළිබඳව ප්‍රශ්නයක් විමසීය. නබි නායක (සල්) තුමාණන් ඔහු සමඟ කෝපයට පත් වී මුහුණ හරවා ගත්හ. මෙම පරිච්ඡේදය තුළ මිනිසෙකුගේ වැදගත්කම ඔහුගේ පෙනුම හෝ ලෞකික ස්ථානයෙන් විනිශ්චය නොකළ යුතු බව සඳහන් වේ.

**09** අල්කුරානයෙහි ලහබ් පරිච්ඡේදය තුළ (111 වන පරිච්ඡේදය) එතුමාගේ නබිත්වය පිළිබඳ ස්ථිර සංඥාවක් සොයාගත හැකිය. උත්තරීතර අල්ලාහ් එම පරිච්ඡේදයෙහි දැළුලා දැවෙන ගින්නක් වෙත නබිවරයාගේ මාමා කෙනෙකු වන අබූ ලහබ් දමනු ලබන බව සඳහන් කරයි. මෙම පරිච්ඡේදය අනාවරණය වූයේ ඉස්ලාමය වෙත කැඳවීමේ මුල් අවධියේදී ය. නබිවරයකු වන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ප්‍රෝඩාගකාරයකු නම් එතුමාගේ මාමා වූ අබූ ලහබ් ඉස්ලාමය පසු කාලයේදී පිළිගැනීමට අවස්ථාවක් තිබෙන හෙයින් මේ ආකාරයේ නියෝගයක් නිකුත් නොකරනු ඇත.

ආචාර්ය ගැරී මිලර් [12] මෙසේ සඳහන් කරයි:

නිදසුනක් වශයෙන්, නබිතුමාට අබූ ලහබ් නමින් මාමා කෙනෙකු

11. ඉංග්‍රීසි භාෂාවෙන් ශුද්ධ වූ අල් කුර්ආනයේ මුල්ම පරිවර්තකයකු වූ මොහු බ්‍රිතාන්‍ය ජාතික මුස්ලිම්වරයෙක් විය. ඔහුගේ පරිවර්තනය මුලින්ම ප්‍රකාශයට පත් කළේ 1930 දී ය.
12. ආචාර්ය ගැරී මිලර් (අබ්දුල් අහද් උමර් නමින් හැඳින්වෙන) මොහු කැනේඩියානු ගණිතඥයෙකු හා ඉස්ලාම් ආගමට හැරුණු හිටපු ක්‍රිස්තියානි මිෂනාරිවරයෙකි.

සිටියහ. මොහු ඉස්ලාමයට වෛර කරන්නෙකු විය. නබි තුමාට අපහාස කිරීම පිණිස එතුමා පසුපසම ඔහු යමින් සිටීය. නබි තුමාණන් ආගන්තුකයින් සමඟ කථාබහක යෙදෙන්නේ නම් කථාබහ අවසන් කර නැවත යනතෙක් අබූ ලහබ් රැඳී සිට එම ආගන්තුකයා වෙත ගොස් නබි තුමාණන් කුමක් ප්‍රකාශ කළේ දැයි විමසා එතුමා පවසන දෑ විශ්වාස නොකරන බව කියමින් නබි තුමා කී දෑට පටහැනි යමක් පවසමින් සිටියේය.

කෙසේ වෙතත්, අබූ ලහබ් අභාවයට පත්වීමට වසර දහයකට පෙර අල්කුර්ආනයෙහි කුඩා පරිච්ඡේදයක් නබි තුමාට අනාවරණය විය. එම පරිච්ඡේදය පැහැදිලිවම කියා සිටියේ ඔහු ගින්න (එනම් නිරය) වෙතට යන බවය. වෙනත් වචනවලින් කිවහොත්, ඔහු කිසිම විටෙක මුස්ලිම්වරයෙකු නොවන බව එහි සඳහන් වේ.

මෙකී අවුරුදු දහය තුළ අබූ ලහබ්ට කරන්නට තිබුණේ මිනිසුන් ඉදිරියේ පැමිණ අල්කුර්ආනයේ මා ඉස්ලාම් දහම වැළඳ නොගන්නා බව හා මා අපායට යන බව දන්වන පරිච්ඡේදයක් මුහම්මද් හට පහළ වී තිබේ. එසේ නම් මා දැන් ඉස්ලාමය වැළඳ ගත්තේ නම් අහෝ මුහම්මද් ඔබේ දිව්‍යමය හෙළිදරව්වෙහි සත්‍යතාව පිළිබඳ ඔබ කුමක් සිතන්නේදැයි අසන්නට තිබුණි.

අවුරුදු දහයක් තිස්සේම ඔහු ඉස්ලාම් දහම වැළඳ නොගත් අතර ඉස්ලාමය පිළිබඳ යම් ඇල්මක් හෝ ඔහුගෙන් දැක ගන්නට නොහැකි විය. මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සැබැවින්ම අල්ලාහ්ගේ දූතයකු නොවන්නේ නම් අබූ ලහබ් කුර්ආනීය හෙළිදරව්ව සාක්ෂාත් කරන බව මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දැන ගත්තේ කෙසේද? එකම පිළිතුර නම් ඔහු අල්ලාහ්ගේ දූතයා බවයි. එවැනි අවදානම් අභියෝගයක් කිරීම සඳහා දිව්‍යමය එළිදරව්වීමක් ඔහු සතු වූ බව මුලුමනින් ම විශ්වාස කළ යුතුය.

10 අල්කුර්ආනයෙහි එක් පරිච්ඡේදයක නබි තුමාණන් මුහම්මද් වෙනුවට අහ්මද් යනුවෙන් කැඳවන ලදී.

"ඉස්‍රායීල්ගේ දරුවනි! මම නුඹලා වෙත (එවන ලද) අල්ලාහ්ගේ දූතයා වෙමි. මට පෙර පැවති තව්රාතය සත්‍ය කරවන්නෙක්මි. මට

පසුව පැමිණීමට නියමිත අහ්මද් නමැති දූතයෙක් ගැන සුබාරංචි කියන්නෙක් මි" යි මර්යම්ගේ පුත් ඊසා කී සැටි සිහි කරන්න. ඔවුන් වෙත පැහැදිලි සාධක ගෙන ආ විට, මෙය පැහැදිලි හූනියමක් යැ"යි ඔවුහු පැවසූහ.(61:06)

එතුමාණන් ප්‍රෝඩාකාරයකු නම් අල්කුරානය තුළ ඔහුගේ නම අහ්මද් යනුවෙන් සඳහන් නොවනු ඇත. මන්දයත් සමාජය තුළ එතුමා මුහම්මද් යන නාමයෙන් හඳුන්වන ලදී.

11 ඉස්ලාම් ආගම අදටත් පවතින අතර එය ලොව පුරා පැතිර පවතී.

ලොව පුරා පුද්ගලයින් රාශියක් ඉස්ලාම් ධර්මය වැලඳගන්නා අතර ඉස්ලාමය කෙරෙහි අනෙක් සියලූ ආගම්වලට වඩා වැඩි කැමැත්තක් දක්වයි. ඉස්ලාමය වෙත අමතන්නන් සඳහා අපේක්ෂා කළ පරිදි මූල්‍යමය අනුග්‍රහයන් නොලැබුණා ද, ඉස්ලාම් ව්‍යාප්තිය නවතා දැමීමට ඉස්ලාම් සතුරන්ගේ නොයෙකුත් ප්‍රයත්නයන් තිබියදීත් මේ අයුරින් සිදු වෙමින් පවතී. ශුද්ධ වූ අල්කුර්ආනයේ උත්තරීතර අල්ලාහ් මෙසේ සඳහන් කරයි.

අපි ම මෙම උපදේශය පහළ කළෙමු. අපි ම එය ආරක්ෂා කරන්නෙමු. (15:09)

දෙවියන් අල්ලාහ් විසින් මෙම කුර්ආනය සැබැවින්ම සුරක්ෂිතව තබා ඇත. එය පොතක් වශයෙන් පමණක් නොව, පරම්පරාවෙන් පරම්පරාවට මුළු හදවතින් ම පාඩම් කර මතක තබා ගැනීම මඟින් ද එම අල්කුර්ආනය හදවත් තුළ සුරක්ෂිතව තබා ඇත. නියත වශයෙන්ම මෙය මතක තබා ගැනීම සහ එය නැවත කියවීමට අමතරව එය ඉගෙන ගැනීම හා ඉගැන්වීම කෙරෙහි මුස්ලිම්වරුන් දැඩි උනන්දුවක් දක්වයි. මන්දයත් නබි (සල්) තුමාණන් මේසේ දේශනා කර ඇත:

ඔබලාගෙන් ඉතා ශ්‍රේෂ්ඨමත් උදවිය කවුරුන්දයත් අල්කුර්ආනය හදාරා එය අන් අයට උගන්වන අය වේ. (බුහාරි)

තෝමස් කාර්ලයිල් මෙසේ පවසයි:

අසත්‍ය මිනිසෙකු විසින් විස්මිත දහමක් බිහි කළ හැකි බව ඔබ කවදා

හෝ අසා තිබේ ද? නැත, එය කිසිදා විය නොහැකි කරුණකි. එක් ශක්තිමක් නිවහනක් අටවන කෙනෙකු සතුව එම නිවහන තැනීමට අවශ්‍ය ගල්, වැලි වැනි මූලික දෑ පිළිබඳ අවබෝධයක් නොමැති නම් ඔහුට එය අටවන්නට නොහැකි වනු ඇත. එවැනි අත්දැකීමක් නොමැතිව ඔහු එම නිවහන අටවන්නේ නම් එය ශක්තිමත්, සර්ව සම්පූර්ණ නිවහනක් ලෙස නොතිබේ. හුදෙක් අසම්පූර්ණ දෝෂසහිත ගොඩනැගිල්ලක් වශයෙන් හෝ නොදුරු අනාගතයේදී කැඩීබිඳී යන ස්ථානයක් මෙන් පමණක් එය තිබෙනු ඇති අතර දශක 12 ක කාලයක් මිලියන 200 ක පුද්ගලයින් ජීවත් වීමට සුදුසු ගොඩනැගිල්ලක් වශයෙන් නොතිබනු ඇත.

එබැවින් මා අවබෝධ කළ කරුණක් නම් මිනිසා සැමදා ස්වභාව ධර්මයෙහි නීති වලට අනුකූල විය යුතුයි. එමෙන්ම එහි සත්‍යතාවය සමඟ බැඳී සිටිය යුතුයි යන්නයි. එය කවදා හෝ දිනක පිළිතුරු දෙනු ඇත. ඇතමුන් විසින් ඉස්ලාම් දහම පිළිබඳ අසත්‍ය කරුණු සත්‍යයක් ලෙස වමා පෙන්වමින් මිනිසුන් අතර ප්‍රචාරය කළ පමණින් ඒවා සත්‍යය බවට පත් නොවෙන අතර එය කිසිදා අසත්‍යයක් හැර වෙනකක් නොවේ. එමෙන්ම, මෙවැනි අසත්‍ය ප්‍රචාරයන් මඟින් මුළු සමාජයම නොමඟ යැවීම අති විශාල සාපාරාධී ක්‍රියාවකි.

බොහෝ උදවිය විසින් අල්කුර්ආනය තුළට අලුතින් යම් යම් වාක්‍යයන් ඇතුළත් කිරීමටත්, එහි ඇති ඇතැම් වාක්‍ය හකුලුවන්නටත් උත්සාහ කර ඇතත්, ඒවා කිසි විටෙක සාර්ථක වී නැත. එවන් වැරදි ක්ෂණිකවම සොයා ගනු ලැබේ. මුල් පිටපත සමඟ ඓතිහාසිකව සංරක්ෂණය කර ඇති එකම දිව්‍යමය හෙළිදරව්ව මෙම අල්කුර්ආනය පමණි. වර්තමානයේ පවතින අරාබි අල්කුර්ආන් පිටපත් මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන්ගේ සහ ඔහුගේ අනුගාමිකයින්ගේ කාලයේ තිබූ අල්කුර්ආන් පිටපත සමඟ සන්සන්දනය කළේ නම් කිසිම වචනයක තනි වෙනසක් හෝ සොයාගත නොහැකිය.

ඉස්ලාමීය නීති ව්‍යවස්ථාවේ දෙවන මූලාධාරය වන නබි (සල්) තුමාණන්ගේ ජීවන මඟ හා ප්‍රකාශ ද ශ්‍රද්ධාවන්ත උගතුන් විසින් එදා සිට වර්තමානය දක්වා ආරක්ෂා කරන ලදී. ඔවුහු තම ජීවිත ඒ සඳහා පරිත්‍යාග කළහ. එම ප්‍රකාශ අතුරින් දුර්වල හා විශ්වාස කළ

නොහැකි ප්‍රකාශ වෙන් කර හඳුනා ගැනීම සඳහා ඉමහත් ලෙස කැපවී ක්‍රියා කළහ. හදීස් කලාව පිළිබඳ රචිත ග්‍රන්ථ පරිශීලනය කිරීමේදී ඔවුන් කෙතරම් කැපවී ක්‍රියා කළාද යන්න කෙනෙකුට මනා අවබෝධ කළ හැක.

12 නබි තුමාණන් ගෙන ආ ධර්මය සත්‍යභාවයෙන් සහ නිවැරදිභාවයෙන් පිරිපුන් ධර්මයකි. එමෙන්ම ඒවා සෑම කලකටම සහ සෑම ස්ථානයකටම වලංගු වීමේ ස්වභාවයෙන් යුත්තකි.

ඉස්ලාම් ධර්මය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල ඉතා පැහැදිලි ය. එම ප්‍රතිඵල මඟින් නබි (සල්) තුමාණන් ගෙන ආ ඉස්ලාමය යනු සැබවින්ම දෙවියන්ගෙන් පැමිණි දිව්‍යමය හෙළිදරව්වක් බව සනාථ වේ. එසේ නම් මුහම්මද් තුමාණන් පෙර එවන ලද ධර්ම දූතයන් මෙන් එක් ධර්ම දූතයකු වීමට නොහැකි වන්නේ කෙසේද? මෙම විමසුම සඳහා පිළිතුර: එය එසේ විය නොහැක යන්න නම්, අප මෙසේ විමසා සිටින්නෙමු. මුහම්මද් තුමාගේ නබිත්වය ප්‍රතික්ෂේප කර එතුමාට පෙර ආ නබිවරුන්ගේ නබිත්වය තහවුරු කිරීමට හේතුව කුමක්ද?

මයිකල් හාර්ට් මෙසේ පවසයි:

මුහම්මද් තුමාණන් මුළු ලොවටම ශ්‍රේෂ්ඨ ආගමක් ප්‍රකාශයට පත් කළ අතර අතිශයින්ම ඵලදායී දේශපාලන නායකයෙකු බවට පත්විය. සිය මරණයෙන් සියවස් දහතුනකට පසුව ද, එතුමාගේ බලපෑම තවමත් බලවත් ලෙස පැතිර පවතී.

13 වැඳුම් පිදුම්, දේශපාලනය, ආර්ථිකය, යුගදිවිය, ගණුදෙනු වැනි අනෙකුත් ක්ෂේත්‍රයන්ට අදාලව නබි (සල්) තුමාණන් මඟින් ඉස්ලාම් දහම ඉදිරිපත් කළ නීතිරීති වලට සමාන නීතිරීතින් මුළු මානව සංහතියම එකතු වී ගෙන එන්නට උත්සාහ කළද එවන් වූ නීතිරීතීන් හා සාරධර්ම ඔවුනට ගෙන එන්නට නොහැකිය.

එසේ නම්, අකුරු ලියන්නට හා කියවන්නට බැරි නූගත් පුද්ගලයෙකු හරහා ලෞකික හා ආධ්‍යාත්මක ජීවිත හා සම්බන්ධ කරුණු එකට මිශ්‍ර කරමින් සර්ව සම්පූර්ණ වූ නීති ව්‍යුහයක් බිහි කළ හැකිද යන්න


සිතා බැලිය හැකි ද? එසේ නම් මෙය එතුමාගේ නබිත්වය සඳහා පැහැදිලි සාධකයක් නොවන්නේ මන්ද?

**14** එතුමාණන් වයස අවුරුදු හතළිහක් වන තෙක් ඉස්ලාමය වෙත කැඳවීමේ මෙහෙවර ආරම්භ කළේ නැත.

තම යෞවන කාළය ගත කර පසු නබි (සල්) තුමාණන් ඉස්ලාමය වෙත කැඳවීමේ මෙහෙවර ආරම්භ කළේ වයෝවෘද්ධියෙහි ආරම්භක කාළ වකවානුව තුළයි.

තෝමස් කාර්ලයිල් මෙසේ ප්‍රකාශ කරයි:

නියත වශයෙන්ම මුහම්මද් (සල්) තුමාණන් සිය නබිත්වයෙහි සත්‍යවන්තයෙකු ලෙස නොසිටි බව ප්‍රකාශ කිරීම අසත්‍ය චෝදනාවකි. මන්දයත් එතුමාණන් තම යෞවනය ඉතා සැහැල්ලුවෙන් තම භාර්යාව වන කදීජා (රළි) තුමිය සමඟ ගත කළහ. එම කාලවකවානුව තුළ එතුමාණන් මිනිසුන් අතර යම් කරදරකාරී තත්ත්වයක් ඇති කර එමගින් ප්‍රසිද්ධත්වයක් හෝ ධනසම්පත් රැස් කිරීමක් හෝ යම් පදවියක් ලබා ගැනීමට උත්සාහ කළේ නැත.


ادخلوها بسلام آمنين
باب
قباء
باب رقم ٥ - ج
للصعود بالسطح
QUBA
GATE
DOOR NO. 5 B

# නිගමනයන් සහ නිර්දේශයන්

අප මෙම පොත අවසන් කරන්නේ ඇල්ෆොන්ස් ඩි ලාමාර්ටින් විසින් තුර්කියේ ඉතිහාසය යන නමින් රචිත පොතෙහි සඳහන් වචන ස්වල්පයක් මගිනි. ඔහු මුහම්මද් (සල්) තුමාණන් පිළිබඳ මෙසේ සඳහන් කරයි:

ඉතිහාසයේ කිසිදු කාලවකවානුවකවත් කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් මෙවැනි ඉමහත් සේවයක් සිදු නොවීය. මන්දයත් මුහම්මද් (සල්) තුමාණන් කළ මෙම සේවය මිනිසාගේ ශක්තිය ඉක්මවූ සේවයක් විය. එමගින් මිනිසා හා දෙවියන් අතර බාධකයන් ලෙස තිබූ නොමග යෑම් සියල්ල බිඳ දමා දෙවියන්ව මිනිසා සමගත් මිනිසාව දෙවියන් සමගත් සම්බන්ධ කරන්නට හැකි වුණි. එමෙන්ම එකල්හි ජීවත් වූ ජනයින් බහු දේව විශ්වාසය මත සිටි අතර නබි තුමාණන්ගේ එම සේවය මගින් නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසිවෙකු නොමැත යන විශ්වාසය නැවත ගොඩනගන ලදී.

දුබල හා අවම පහසුකම් ළග තබා ගනිමින් මානව ශක්තීන් සියල්ල ඉක්මවා ගොස් ජයගැනීමට ඉදිරිපත් වීම යනු ඉතිහාසයේ මෙයට පෙර කිසි දිනක නොසිදුවුණු කරුණකි. එතුමාණන් මෙම මහගු සේවය දියත් කිරීම සඳහා තමා විසින්ම නායකත්වය දරන ලදී. සුවිශාල එකී වැලිකතරේ එතුමා වෙනුවෙන් මෙම සේවය සඳහා උදවු කිරීමට සිටියේ ඉතා ස්වල්ප ප්‍රමාණයකි. මින් පෙරාතුව ලෝකය තුළ මෙවැනි දැවැන්ත හා කල්පවත්නා විප්ලවයක් කවරෙකු විසින් හෝ සිදු කර නැත. මන්දයත් ඉස්ලාමය ප්‍රවර්ධනය වී දශක දෙකක කාළයක් තුළ සමස්ත අරාබියම සිය පාලනය යටතට ගෙන ආවේය. පසුව අල්ලාහ්ගේ මාර්ගයෙන් සටන් කර පර්සියාව, රෝමය, කුරාසානය, ඉරාකය, බටහිර ඉන්දියාව,මධ්‍යධරණී මුහුදේ දූපත්, ස්පෙයිනය වැනි රටවල් වනතෙක් විශාල ඉඩ ප්‍රමාණයක් සිය පාලනය යටතේ ගෙන ආවේය.

පරමාර්ථයේ ශ්‍රේෂ්ඨත්වය, පහසු මාර්ග හා විස්මිත ප්‍රතිඵල යන මානව සුචරිතයේ නිර්ණායක තුන අප සළකා බලන කළ නව ඉතිහාසයේ මුහම්මද් (සල්) තුමාණන් සමග සසඳා බැලීම සඳහා කිසියම් හෝ බලවත් පුද්ගලයෙකු දැක ගත හැකි ද? එවැනි බලවතුන් බිහි කළේ ආයුධ, නීතිරීතීන් හා අධිරාජ්‍යයන් පමණකි. බොහෝ අවස්ථාවන්වලදී ඔවුන්ගේ ඇස් ඉදිරිපිටම ඒවා සියල්ල විනාශ වී ගියහ.

එනමුත් මුහම්මද් නම් එම මහඟු මිනිසා හුදෙක් යුධසේනාවන්, ආගම්, දහම්, අධිරාජ්‍යයන් හා  මනුෂ්‍ය සමාජ පමණක් නිර්මාණය කළේ නැත. ඉන් ඔබ්බට එවකට ජනාවාසය වූ මිලියන ගණනක මිනිසුන් හා අදහස් උදහස් ඇතුළුව මුළු විශ්මය පරිවර්තනය කළහ. ඉන්පසු එම සමූහය ජාති, වර්ණ, කුල භේද නොමැතිව එකමුතුව ජීවත් විය. ඒකීය දෙවියන් වන්දනාමාන කර ඔහුට යමක් ආදේශ නොකිරීමේ විශේෂ ගුණාංගයද අප අතර තබා ගියහ.

විශ්වය අවිධිමත් කරවන පිළිම වන්දනාමානය හා දෙවියන් වෙනුවට වෙනකක් අටවා එයට වන්දනාමාන කිරීම යනාදී දෑ කෙරෙහි දැඩි ලෙස එරෙහි වීම මගින්ම මුහම්මද් (සල්) තුමාණන් සැබෑ විශ්වාසවන්තයා හඳුනා ගනු ඇත. ඒ අයුරින් ලෝ වාසීන් සියල්ලම මෙම විශ්වාසය කෙරෙහි පෙළඹවීම යනු එක් බුද්ධිමය ප්‍රාතිහාර්යයකි.

නබි (සල්) තුමාණන්ගේ කාළයෙහි ඉමහත් හාස්කමක් මෙන් සළකන ලද පිළිම වන්දනාමානය හා නොයෙකුත් වත්පිළිවෙත් මැද එතුමාණන් ප්‍රචාරය කළ ඒකදේවවාදයේ හාස්කම කෙසේදයත් එය ප්‍රචාරය කිරීම ආරම්භ කරපු සැනින්ම පිලිම වන්දනාමාන කරන දේවස්ථාන සියල්ල අවිධිමත් වී ගියහ.

නියත වශයෙන්ම ලෝකයේ එතුමාගේ ජීවිතය හා චින්තනයන්, නොමඟ යෑම් හා අසත්‍ය විශ්වාසයන්ට එරෙහිව එතුමාණන්ගේ විප්ලවයත්, පිළිම වන්දනාකරුවන් ඉදිරියේ අභීතව මුහුණදීමත්, මක්කාවෙහි නොකඩවා අවුරුදු 13 ක කාළයක් එතුමාණන් හට මුහුණ පෑමට සිදු වූ දුක්කරදර වලදී එතුමාණන්ගේ ඉවසීමත්, තමාගේ වගකීම ඉටු කරමින් තම සමාජයෙන් සිදු වන අසාධාරණයන් දරා ගැනීමත්, අඥාන යුගයේ සිරිත් විරිත් හා අශිලාචාර හැසිරීම් වලට එරෙහිව එතුමාගේ සටනත්, තම මෙහෙවරෙහි ජයගන්නා බව තම ස්ථිර විශ්වාසයත්, ජය ගත්

පසු තම අවංකභාවයත්, නමක් හෝ ප්‍රශංසාවක් අපේක්ෂා නොකර තම ඒකමතික මතවාදය වෙත පමණක් තබා ගත් එකී අරමුණාත්, එතුමාගේ ස්ථිර වන්දනාමානය හා ප්‍රාර්ථනාවත්, එතුමාගේ මරණයත්, මරණයෙන් පසු ලබා ගත් විශාල ජයග්‍රහනයන් යනාදී සියල්ල අප විසින් එක් ප්‍රෝඩාකාරයෙකු අනුගමනය නොකරන බවට හා අප සියල්ල ශක්තිමත් විශ්වාසයක් මත සිටින බවට කදිම සාක්ෂියකි. තවද එතුමාණන් තම හැකියාවන් සියල්ල ආගම නඟා සිටුවීම පිණිය පරිහරණය කළේය. එතුමණ් එක් දර්ශණවාදියෙකි. එක් කථිකයෙකි. එක් ධර්ම දූතයෙකි. නීති සම්පාදකයෙකි. විජයග්‍රාහකයෙකි. බුද්ධිමත් ආගමක් ස්ථාපිත කළ කෙනෙකි. කිසියම් රූපයක් හෝ පිළිමයක් නොමැතිව වන්දනාමාන කිරීමට මඟ පෙන් වූ අයෙකි. මහ පොළොවේ අධිරාජ්‍යයන් කිහිපයක හා එක් ආධ්‍යාත්මික අධිරාජ්‍යයක (ඉස්ලාම්) නිර්මාතෘ ඔහුය. මෙවන් උතුම් ගුණාංග රාශියකින් සමන්විත පුද්ගලයා ය ඒ මුහම්මද් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ.

මිනිසාගේ මහත්මාභාවයට තිබිය යුතු ප්‍රමිතීන් සියල්ල හරහා අප කෙනෙකු නිරීක්ෂණය කර බලන්නේ නම් මුහම්මද් (සල්) තුමාණන් හැර මහත්මාභාවයෙන් පිරිපුන් කෙනෙකු සිටිය හැකි දැයි අප අප තුළම විමසා ගනු ඇත.





مركز أصول
Osoul Center
www.osoulcenter.com

IslamHouse.com

eDialogue
Interested in ISLAM?
Join For a Free Private Live Chat
edialogue org

For more details visit
www.GuideToIslam.com
GUIDE TO ISLAM
contact us :Books@guidetoislam.com

لدعم المركز
مصرف الراجحي
Al Rajhi Bank
SA148000 0296608010005372
احد برامج المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة

osoulcenter
+966504442532
www.osoulcenter.com

عرض تعريفي عن مركز أصول
ومجالاته ووحداته.. مشاهدة ممتعة لك

ISO 9001
حاصل على شهادة الاعتماد من الأيزو
حاصل على جائزة التميز في العمل الخيري

සිංහල

අල්ලාහ්ගේ දූත මුහම්මද් ﷺ තුමා

ආචාර්ය අබ්දුර්රහ්මාන් අබ්දුල් කරීම් අශ්ෂීහා

# අල්ලාහ්ගේ දූත ﷺ මුහම්මද් තුමා

මුළු මිනිස් සංහතිය වෙත එවනු ලැබූ මුහම්මද් (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) ගැන කතා කරන විට,පැරණි හා නූතන යුගයේ ඉතිහාසය විසින් පිළිගත් ශ්‍රේෂ්ඨතම චරිතයක් පිළිබඳ අප කතා කරන වග අවධාරණය කළ යුතුයි. මෙය අභූ ප්‍රකාශයක් නොව කෙනෙකු ඔහුගේ ආගමික උමතුවෙන් හා පෞද්ගලික මතිමතාන්තර වලින් නිදොස්ව එතුමාණන්ගේ සිය චරිතාපදානය කියවා එතුමාණන්ගේ සදාචාරය හා යහ ගුණාංග කෙසේදැයි හොඳ හැටි අවබෝධ කර ගන්නේ නම් අප ප්‍රකාශ කළ දෑ සත්‍ය බව ඔහුට වැටහෙනු ඇත. ඒ පිළිබඳව මෙම කෘතියෙහි සඳහන් වේ.

Downlad the book

www.guidetoIslam.com

مركز أصول
OsoulCenter
www.osoulcenter.com

1 234567 890128 >